# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# 2025

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පේරාදෙණිය

ශ්‍රී ලංකා

ශ්‍රී ලංකාවේ පේරාදෙණිය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින්

ප්‍රකාශයට පත් කරන ලදී

2026

මෙම වාර්තාව ශ්‍රී ලංකාවේ පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය විසින් සම්පාදනය කොට කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය මගින් මුද්‍රණය කරන ලදී.

සියලුම හිමිකම් ඇවිරිණි. විවේචනය හා පුනරීක්ෂණය සඳහා කෙටි වාක්‍ය ඛණ්ඩවල උපුටා ගැනීම් හැරුණුවිට, මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ව අනුමැතියෙන් තොරව, නැවත ඉදිරිපත් කිරීම, පුනරුත්පාපනය කළ හැකි වන සේ ගබඩා කර තැබීම, විද්‍යුත්, යාන්ත්‍රික, ඡායාස්ථිත, පටිගත කිරීම හෝ වෙනත් ක්‍රම උපයෝගී කරගනිමින් සම්ප්‍රේෂණය කිරීම සපුරා තහනම් වේ. අසාධාරණයක් නොවන පරිදි වාණිජ නොවන ස්වරූපයේ කටයුතු සඳහා මෙම අවසරය ලබාදීමට කටයුතු කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ලබන ප්‍රකාශන වල, වාණිජ නොවන, කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගැනීමේදී ගාස්තු ගෙවීම අනවශ්‍යවේ. කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන කටයුතුවලදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණාත්මක සොයාගැනීම් සඳහා අව්‍යාජව යොදා ගැනීමට මෙම හිමිකම් ඇවිරීමේ ප්‍රකාශය බාධාවක් නොවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

# 2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## ආයතනයේ නම : කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

## වැය ශීර්ෂ අංකය : 285

**අන්තර්ගතය**


පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය........................................................1

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම ..................................................................................14

පරිච්ඡේදය 03 - 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය .49

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක ......................................................................................64

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්ය සාධනය ...............................75

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ ..................................................................................76

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව .......................................................................................77

ඇමුණුම්.........................................................................................................................86

## පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1. හැඳින්වීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර ශ්‍රී ලංකාවේ විශාලතම සහ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනයක් ලෙස පවතී. එය දිවයින පුරා පිහිටි පුළුල් මෙහෙයුම් ඒකක ජාලයකින් සහාය ලබන, ඉතා දක්ෂ කෘෂිකාර්මික වෘත්තිකයන් සහ තාක්ෂණික විශේෂඥයින්ගෙන් සමන්විත වේ.

හරිත කෘෂිකර්මාන්තය පිළිබඳ ජාතික දැක්මට අනුකූලව, ආහාර බෝග අංශයේ ඵලදායිතාව සහ තිරසාරභාවය වැඩි දියුණු කිරීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූලික අරමුණවේ. මෙම ඉලක්කය සපුරා ගැනීම මගින් ගොවීන්ගේ ආදායම සහ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම පමණක් නොව, පාරිභෝගිකයින්ට දැරිය හැකි මිලකට ආරක්ෂිත, උසස් තත්ත්වයේ කෘෂිකාර්මික නිෂ්පාදන ලබා ගැනීම සහතික කෙරේ.

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ ප්‍රධාන නියාමන අධිකාරිය ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කටයුතු කරන අතර එය මනා කළමනාකරණ ව්‍යුහයකින් සමන්විත වේ. මෙයට වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය යන බෝග පර්යේෂණ ආයතන හතරක් ද, බීජ සහතික කිරීමේ හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය, බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, සමාජ ආර්ථික සහ සැලසුම් මධ්‍යස්ථානය, ස්වභාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානය යන තාක්ෂණික සේවා මධ්‍යස්ථාන හයක්ද, ඉංජිනේරු අංශය, මුදල් අංශය, පරිපාලන අංශය යන සහාය සේවා තුන ද ඇතුලත් වේ. ඊට අමතරව, ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය මගින් දෙපාර්තමේන්තු ප්‍රගතිය අඛණ්ඩව තක්සේරු කිරීම සහ නියාමනය කිරීම සහතික කෙරේ.

මෙම අංශවලින් සමන්විත පුළුල් ආයතනික රාමුව මගින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට තම මෙහෙවර ඉටු කිරීම සඳහා සහ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ සංවර්ධනයට සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට හැකි වේ.

### 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

**ඉදිරි දැක්ම**

ජාතික සෞභාග්‍යය උදෙසා කෘෂිකාර්මික විශිෂ්ඨත්වය සාක්ෂාත් කර ගැනීම.

**මෙහෙවර**

නව දියුණු කෘෂිකාර්මික තාක්ෂණය ජනනය කර ව්‍යාප්ත කිරීම සහ අදාල සේවාවන් ගොවීන් වෙත වැඩි අවධාරණයක් සහිතව සියළුම පාර්ශවකරුවන් වෙත ලබාදීමෙන් ජාතියේ ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා යෝග්‍ය සහ තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයක් අත්පත්කර ගැනීම.

අරමුණු

- ජාතික ආහාර සුරක්ෂිතතාව සහ කෘෂිකාර්මික වර්ධනය සහතික කිරීම සඳහා ආහාර බෝග වගාවේ නිෂ්පාදන විභවය වැඩි දියුණු කිරීම.
- ස්වභාවික සම්පත් සංරක්ෂණය කරන සහ පරිසරය ආරක්ෂා කරන තිරසාර හා පරිසර හිතකාමී ගොවිතැන් පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම.
- ඵලදායිතාව සහ ලාභදායීතාවය උපරිම කිරීම සඳහා ඉඩම් සහ ශ්‍රම භාවිතයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.
- ගොවීන්, කෘෂි ව්‍යාපාර සහ ග්‍රාමීය ප්‍රජාවන් ඇතුළු කෘෂිකාර්මික අංශයේ සියලුම පාර්ශව බලගැන්වීම.
- පුහුණුව, අධ්‍යාපනය සහ ව්‍යාප්ති සේවා තුළින් කෘෂිකර්මාන්තයේ මානව සම්පත්වල හැකියාව සහ නිපුණතා ශක්තිමත් කිරීම.
- සියලුම පාර්ශවකරුවන්ට උසස් තත්ත්වයේ බීජ සහ රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීමේ හැකියාව සහ ප්‍රවේශ්‍යතාව සහතික කිරීම.
- බීජ, රෝපණ ද්‍රව්‍ය සහ කෘෂිකාර්මික නිෂ්පාදනවල අනුකූලතාව සහ විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා ගුණාත්මක ප්‍රමිතීන් පවත්වා ගැනීම සහ බලාත්මක කිරීම..
- කාර්යක්ෂම හා තිරසාර කළමනාකරණ පිළිවෙත් තුළින් ඉඩම් හා ජල සම්පත් භාවිතය ප්‍රශස්ත කිරීම.
- නිවැරදි දත්ත, විශ්ලේෂණය සහ උපායමාර්ගික මග පෙන්වීම ලබා දීමෙන් සාක්ෂි මත පදනම් වූ සැලසුම්කරණය සහ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම.
- ජෛව ආරක්ෂණ පියවර සහ නිරීක්ෂණය තුළින් ආක්‍රමණශීලී සහ හානිකර ආගන්තුක ජීවීන්ගෙන් ජාතියේ ශාක විශේෂ ආරක්ෂා කිරීම.
- විදේශ විනිමය ඉපැයීම් සහ වෙළඳපොළ ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා සෞඛ්‍ය සම්පන්න ශාක හා ශාක නිෂ්පාදන අපනයනය සඳහා පහසුකම් සැලසීම.
- නියාමනය සහ දැනුවත් කිරීම තුළින් පළිබෝධනාශක භාවිතයේ අහිතකර බලපෑම් වලින් මහජන සෞඛ්‍යය හා පරිසරය ආරක්ෂා කිරීම.
- අනාගත පරම්පරාවන් සඳහා කෘෂිකාර්මික ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම සඳහා ශාක ජාන සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම සහ සංරක්ෂණය කිරීම ප්‍රවර්ධනය කිරීම.

## 1.3. ප්‍රධාන කාර්යයන්

- වී, අනෙකුත් ක්ෂේත්‍ර බෝග, එළවළු සහ පලතුරු වල ඵලදායිතාව වැඩි දියුණු කිරීම අරමුණු කරගත් වැඩිදියුණු කළ බෝග ප්‍රභේද සහ නව්‍ය කෘෂිකාර්මික තාක්ෂණයන් බිහි කිරීම සඳහා පර්යේෂණ පැවැත්වීම.
- ඵලදායී ව්‍යාප්ති ක්‍රම සහ ප්‍රජා සම්බන්ධතා වැඩසටහන් හරහා ගොවි ප්‍රජාවට උසස් කෘෂිකාර්මික තාක්ෂණයන් හඳුන්වා දීම සහ ප්‍රචාරය කිරීම.
- ආහාර බෝග සඳහා ස්ථාපිත ප්‍රමිතීන්ට අනුකූලව නිෂ්පාදනය කිරීම, සහතික කිරීම සහ බෙදා හැරීම මගින් උසස් තත්ත්වයේ බීජ සහ රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීම සහතික කිරීම.

- ශාක ජානමය සම්පත් ආරක්ෂා කර ඒවායේ තිරසාර භාවිතයට සහාය වීම සහ අනාගත පරම්පරාවන් සඳහා කෘෂිකාර්මික ජෛව විවිධත්වය සහතික කිරීම.
- කෘෂිකාර්මික නිෂ්පාදනය සහ ඵලදායිතාව උපරිම කිරීම සඳහා ඉඩම් සහ ජල සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම.
- ආක්‍රමණශීලී විදේශීය ශාක වලින් දේශීය ශාක විශේෂ ආරක්ෂා කිරීම සඳහා වැළැක්වීමේ සහ පාලන පියවර ක්‍රියාත්මක කිරීම.
- කෘෂිකාර්මික අංශයෙන් විදේශ විනිමය ඉපැයීම් වැඩි දියුණු කිරීම සඳහා සෞඛ්‍ය සම්පන්න ශාක හා ශාක පදනම් කරගත් නිෂ්පාදන අපනයනය කිරීමට සහාය වීම.
- මහජන සෞඛ්‍යය හා පරිසරය හානිකර බලපෑම් වලින් ආරක්ෂා කිරීම සඳහා පළිබෝධනාශක භාවිතය නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම.
- බීජ පනත, ශාක ආරක්ෂණ පනත, පළිබෝධනාශක පාලන පනත, පාංශු සංරක්ෂණ පනත සහ ගස් හෙළීම පාලන පනත ඇතුළු ප්‍රධාන කෘෂිකාර්මික නීති බලාත්මක කිරීම.
- කෘෂිකාර්මික අංශයේ දිගුකාලීන පැවැත්ම සහතික කිරීම සඳහා තිරසාර හා පරිසර හිතකාමී කෘෂිකාර්මික පිළිවෙත් වෙනුවෙන් පෙනී සිටීම සහ ක්‍රියාත්මක කිරීම.
- කෘෂිකර්මාන්තයේ නිපුන මධ්‍යම මට්ටමේ කළමනාකරණ වෘත්තිකයන් බිහිකිරීම සඳහා කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය පුහුණු (NVQ) මට්ටමේ 5 සහ 6 ඩිප්ලෝමා වැඩසටහන් පැවැත්වීම සහ කෘෂිකර්මාන්තයට අදාළ ගොවීන්ගේ සහ නිලධාරීන්ගේ හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා අඛණ්ඩ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

## 1.4. සංවිධාන සටහන




වී. පර්. හා සං. - වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය
ක්ෂේ. බෝ. පර්. හා සං. - ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය
උ. බෝ. පර්. හා සං. - උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය
පල. පර්. හා සං. - පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය
ස්ව. ස. කළ. - ස්වභාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානය
ස. ආර්. හා සැල. - සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය
බී. ස. හා පැ. සං. - බීජ සහතික කිරීමේ හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය
බී. හා රෝ. ද්‍ර. සං. - බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය
ව්‍යාප්ති හා පුහුණු - ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය
කෘ. තො. හා ස. - ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය
ප්‍ර, මෙ.හා ඇ. - ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය

## 1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ:

1.5.1 කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය

1.5.2 අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් (පර්යේෂණ) කාර්යාලය - පේරාදෙණිය

1.5.3 අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) කාර්යාලය - පේරාදෙණිය

1.5.4 අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) කාර්යාලය - පේරාදෙණිය

1.5.5 ප්‍රධාන මූල්‍ය නිලධාරී කාර්යාලය - පේරාදෙණිය

1.5.6 වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය - බතලගොඩ

1.5.6.1 ප්‍රාදේශීය වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - බෝඹුවල

1.5.6.2 වී පර්යේෂණ ස්ථානය - අම්බලන්තොට

1.5.6.3 වී පර්යේෂණ ස්ථානය - බෙන්තොට

1.5.6.4 වී පර්යේෂණ ස්ථානය - ලබුදූව

1.5.6.5 වී පර්යේෂණ ස්ථානය - සමන්තුරේ

1.5.6.6 වී පර්යේෂණ ස්ථානය - පරන්තන්

1.5.6.7 වී පර්යේෂණ ස්ථානය - මුරුන්කන්

1.5.7 ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය - මහඉලුප්පල්ලම

1.5.7.1. තෙල් හා මාෂ බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - අඟුණකොළපැලැස්ස

1.5.7.2 ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - අරලගංවිල

1.5.7.3 ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - කිලිනොච්චි

1.5.7.4 ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය - කරදියන්ආරු

1.5.7.5 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - වවුනියා

1.5.7.6 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - තිරුනෙල්වේලි

1.5.7.7 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - වීරවිල

1.5.7.8 ගොවිපළ යාන්ත්‍රීකරණ පර්යේෂණ මධ්‍යස්ථානය - මහඉලුප්පල්ලම

1.5.8 උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය - ගන්නෝරුව

1.5.8.1 ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - බණ්ඩාරවෙල

1.5.8.2 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - සීතාඑළිය

1.5.8.3 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - තෙලිජ්ජවිල

1.5.8.4 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - ගිරාඳුරුකෝට්ටේ

1.5.8.5 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - කල්පිටිය

1.5.8.6 ආහාර පර්යේෂණ ඒකකය - ගන්නෝරුව

1.5.8.7 උද්‍යාන බෝග පර්යේෂණ ගොවිපල - ගන්නෝරුව

1.5.8.8 උපයෝගිතා පර්යේෂණ ඒකකය - වාගොල්ල

1.5.8.9 උපයෝගිතා පර්යේෂණ ඒකකය - තිබ්බටුමුල්ල

1.5.8.10 උපයෝගිතා පර්යේෂණ ඒකකය - වාරියපොළ

1.5.8.11 උපයෝගිතා පර්යේෂණ ඒකකය - තබ්බෝව

1.5.9 පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය - හොරණ

1.5.9.1 තිරසාර කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - මාකඳුර

1.5.9.2 පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ස්ථානය - ගන්නෝරුව

1.5.9.3 පැළෑටි වෛරස් හඳුනාගැනීමේ මධ්‍යස්ථානය - හෝමාගම

1.5.9.4 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - මදුරුකැටිය

1.5.9.5 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - මුතුකණ්ඩිය

1.5.9.6 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - රහංගල

1.5.9.7 රඹුටන් පර්යේෂණ ඒකකය - එරමිණිගොල්ල

1.5.9.8 දොඩම් පර්යේෂණ ඒකකය - බිබිල

1.5.9.9 ජාතික පළතුරු ප්‍රභේද සංරක්ෂණ මධ්‍යස්ථානය - කුණ්ඩසාලේ

1.5.10 ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය - පේරාදෙණිය

1.5.10.1 පාංශු සංරක්ෂණ දැනුම් කළමනාකරණ මධ්‍යස්ථානය - කුණ්ඩසාලේ

1.5.10.2 ස්වාභාවික සම්පත් කළමනාකරණ හා පාංශු සංරක්ෂණ ආදර්ශ කේන්ද්‍රය - කුණ්ඩසාලේ

1.5.11 සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය - පේරාදෙණිය

1.5.12 ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය - පේරාදෙණිය

1.5.12.1 සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය - අඟුණකොළපැලැස්ස

1.5.12.2 සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය - ගන්නෝරුව

1.5.12.3 සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය - හංසයාපාලම

1.5.12.4 ගොවිපල් යාන්ත්‍රික අභ්‍යාස මධ්‍යස්ථානය - අනුරාධපුර

1.5.12.5 දිස්ත්‍රික් ගොවි පුහුණු මධ්‍යස්ථානය - අඬ්ඩාලචේන

1.5.12.6 දිස්ත්‍රික් ගොවි පුහුණු මධ්‍යස්ථානය - වාවින්න

1.5.12.7 දිස්ත්‍රික් ගොවි පුහුණු මධ්‍යස්ථානය - පොළොන්නරුව

1.5.12.8 දිස්ත්‍රික් ගොවි පුහුණු මධ්‍යස්ථානය - වීරවිල

1.5.12.9 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - අඟුණකොළපැලැස්ස

1.5.12.10 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - කරපිංච

1.5.12.11 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - කුණ්ඩසාලේ

1.5.12.12 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - පැල්වෙහෙර

1.5.11.13 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - වවුනියා

1.5.11.14 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - අනුරාධපුර

1.5.12.15 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - ලබුදූව

1.5.12.16 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - පාලමුණේ

1.5.12.17 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - පරන්තන්

1.5.12.18 ශ්‍රී ලංකා කෘෂිකර්ම විද්‍යාලය - වාරියපොළ

1.5.12.19 උද්‍යාන බෝග පුහුණු හා සංවර්ධන ආයතනය - බිබිල

1.5.12.20 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) කාර්යාලය - අම්පාර

1.5.12.21 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) කාර්යාලය - අනුරාධපුර

1.5.12.22 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) කාර්යාලය - හම්බන්තොට

1.5.12.23 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) කාර්යාලය - හසලක

1.5.12.24 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) කාර්යාලය - මොණරාගල

1.5.12.25 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අන්තර් පළාත්) කාර්යාලය - පොළොන්නරුව

1.5.12.26 මී මැසි සංවර්ධන ඒකකය - බිඳුණුවැව, බණ්ඩාරවෙල

1.5.12.27 තරුණ ගොවි සමාජ මූලස්ථානය - පේරාදෙණිය

1.5.12.28 කෘෂි ව්‍යාපාර සංවර්ධන අංශය - ගන්නොරුව

1.5.12.29 කෘෂි ව්‍යාප්ති කාර්යාලය, ආර්ථික මධ්‍යස්ථානය - දඹුල්ල

1.5.13 ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය - ගන්නෝරුව

1.5.13.1 කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය - ගන්නෝරුව

1.5.13.2 කෘෂි ප්‍රකාශන බෙදාහැරීමේ ඒකකය - පේරාදෙණිය

1.5.13.3 කෘෂි ගුවන්විදුලි සේවාව - කොළඹ

1.5.13.4 කෘෂි ගුවන්විදුලි සේවාව - මහනුවර

1.5.13.5 කෘෂි ගුවන්විදුලි සේවාව - අනුරාධපුර

1.5.13.6 කෘෂි ගුවන්විදුලි සේවාව - මාතර

1.5.13.7 කෘෂි ගුවන්විදුලි සේවාව - තිරුනෙල්වේලි

1.5.13.8 කෘෂි තාක්ෂණ උද්‍යානය - ගන්නෝරුව

1.5.13.9 කෘෂි තාක්ෂණ උද්‍යානය - බටඅත

1.5.13.10 මධ්‍යම කෘෂිකර්ම පුස්තකාලය - ගන්නෝරුව

1.5.13.11 පරිසර හිතකාමී කෘෂි ඒකකය - දියගම

1.5.14 බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය - පේරාදෙණිය

1.5.14.1 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - අළුත්තරම

1.5.14.2 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - අම්පාර

1.5.14.3 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - බටඅත

1.5.14.4 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - නාරාහේන්පිට

1.5.14.5 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - කන්තලේ

1.5.14.6 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - කිලිනොච්චි

1.5.14.7 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - කුණ්ඩසාලේ

1.5.14.8 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - මහඉලුප්පල්ලම

1.5.14.9 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - නිකවැරටිය

1.5.14.10 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - සීතාඑළිය

1.5.14.11 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - පැල්වෙහෙර

1.5.14.12 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද්‍ර.) කාර්යාලය - පොළොන්නරුව

1.5.14.13 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද.) කාර්යාලය - තෙලිජ්ජවිල

1.5.14.14 නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද.) කාර්යාලය - වවුනියා

1.5.14.15 සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද.) කාර්යාලය - කරදියන්ආරු

1.5.14.16 සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද.) කාර්යාලය - මුරුන්කන්

1.5.14.17 සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (බී. රෝ. ද.) කාර්යාලය - යාපනය

1.5.14.18 රජයේ බීජ ගොවිපල - අළුත්තරම

1.5.14.19 රජයේ බීජ ගොවිපල - අම්බලන්තොට

1.5.14.20 රජයේ බීජ ගොවිපල - අඹේපුස්ස

1.5.14.21 රජයේ බීජ ගොවිපල - මහඉලුප්පල්ලම

1.5.14.22 රජයේ බීජ ගොවිපල - කන්තලේ

1.5.14.23 රජයේ බීජ ගොවිපල - මීද්දෙණිය

1.5.14.24 රජයේ බීජ ගොවිපල - පොළොන්නරුව

1.5.14.25 රජයේ බීජ ගොවිපල - මල්වත්ත, අම්පාර

1.5.14.26 රජයේ බීජ ගොවිපල - මුරුන්කන්

1.5.14.27 රජයේ බීජ ගොවිපල - කරදියන්ආරු

1.5.14.28 රජයේ බීජ ගොවිපල - පරන්තන්

1.5.14.29 රජයේ බීජ ගොවිපල - කුණ්ඩසාලේ

1.5.14.30 රජයේ බීජ ගොවිපල - මීපිලිමාන

1.5.14.31 රජයේ බීජ ගොවිපල - රහංගල

1.5.14.32 රජයේ බීජ ගොවිපල - උඩරදැල්ල

1.5.14.33 රජයේ බීජ ගොවිපල - සීතාඑළිය

1.5.14.34 රජයේ බීජ ගොවිපල - බටඅත

1.5.14.35 රජයේ බීජ ගොවිපල - කඳපොල

1.5.14.36 රජයේ බීජ ගොවිපල - පිදුරුතලාගල

1.5.14.37 රජයේ බීජ ගොවිපල - වල්පිට

1.5.14.38 රජයේ බීජ ගොවිපල - උල්පතගම

1.5.14.39 රජයේ බීජ ගොවිපල - බණ්ඩාරගම

1.5.14.40 රජයේ බීජ ගොවිපල - තෙලිජ්ජවිල

1.5.14.41 රජයේ බීජ ගොවිපල - පැල්වෙහෙර

1.5.14.42 රජයේ බීජ ගොවිපල - ඉඟිණිමිටිය

1.5.14.43 රජයේ බීජ ගොවිපල - වීරපාන

1.5.14.44 රජයේ බීජ ගොවිපල - එළුවන්කුලම

1.5.14.45 පළතුරු බෝග පර්යේෂණ ගොවිපල - අඹතැන්න

1.5.14.46 කෘෂි බීජ අලෙවි සැල - කොළඹ 07

1.5.14.47 එළවළු බීජ මධ්‍යස්ථානය - ගන්නෝරුව

1.5.14.48 බීජ බෝංචි ඒකකය - රිකිල්ලගස්කඩ

1.5.14.49 කෘෂි බීජ අලෙවි සැල - මාතර

1.5.14.50 කෘෂි බීජ අලෙවි සැල - මහඉලුප්පල්ලම

1.5.14.51 කෘෂි බීජ අලෙවි සැල - බතලගොඩ

1.5.14.52 කෘෂි බීජ අලෙවි සැල - වාගොල්ල

1.5.14.53 කෘෂි බීජ අලෙවි සැල - මදුරුකැටිය

1.5.14.54 කෘෂි බීජ අලෙවි සැල - බණ්ඩාරවෙල

1.5.14.55 කෘෂි බීජ අලෙවි සැල - පරන්තන්

1.5.14.56 කෘෂි බීජ අලෙවි සැල - පොළොන්නරුව

1.5.14.57 කෘෂි බීජ අලෙවි සැල - අළුත්තරම

1.5.14.58 කෘෂි බීජ අලෙවි සැල - අම්බලන්තොට

1.5.14.59 කෘෂි බීජ අලෙවි සැල - කුණ්ඩසාලේ

1.5.14.60 කෘෂි බීජ අලෙවි සැල - නිකවැරටිය

1.5.14.61 කෘෂි බීජ අලෙවි සැල - බටඅත

1.5.14.62 කෘෂි බීජ අලෙවි සැල - ගන්නොරුව

1.5.14.63. කෘෂි බීජ අලෙවි සැල - අත්තනගල්ල

1.5.14.64 බීජ අර්තාපල් ගබඩාව - සීතාඑළිය

1.5.14.65 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - අඹේපුස්ස

1.5.14.66 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - වල්පිට

1.5.14.67 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - නාරාහේන්පිට, කොළඹ 05

1.5.14.68 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - පස්යාල

1.5.14.69 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - බත්තරමුල්ල

1.5.14.70 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - අම්පාර

1.5.14.71 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - කරදියන්ආරු

1.5.14.72 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - ඉඟිනිමිටිය

1.5.14.73 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - යටියන

1.5.14.74බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - පැල්වෙහෙර

1.5.14.75 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - තෙලිජ්ජවිල

1.5.14.76 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - කල්තොට

1.5.14.77 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවිසැල - වීරපාන

1.5.14.78 බීජ හා රෝපණ ද්‍රව්‍ය අලෙවි සැල - පුත්තලම

1.5.14.79 අතිරේක ආහාර බෝග බීජ ගබඩාව - රහංගල,බොරලන්ද

1.5.15 බීජ සහතික කිරීමේ හා ශාක ආරක්ෂණ මධ්‍යස්ථානය - ගන්නෝරුව

1.5.15.1 බීජ සහතික කිරීමේ සේවය - ගන්නෝරුව

1.5.15.1.1 බිජ සහතික කිරිමේ සේවය - අළුත්තරම

1.5.15.1.2. බිජ සහතික කිරිමේ සේවය - බටඅත

1.5.15.1.3 බිජ සහතික කිරිමේ සේවය - මහඉලුප්පල්ලම

1.5.15.1.4 බිජ සහතික කිරිමේ සේවය - නිකවැරටිය

1.5.15.1.5 බිජ සහතික කිරිමේ සේවය - පැල්වෙහෙර

1.5.15.1.6 බිජ සහතික කිරිමේ සේවය - පොළොන්නරුව

1.5.15.1.7 බිජ සහතික කිරිමේ සේවය - බිබිල

1.5.15.1.8 බිජ සහතික කිරිමේ සේවය - හිඟුරක්ගොඩ

1.5.15.1.9 බිජ සහතික කිරිමේ සේවය - කන්තලේ

1.5.15.1.10 බිජ සහතික කිරිමේ සේවය - කුණ්ඩසාලේ

1.5.15.1.11 බිජ සහතික කිරිමේ සේවය - සීතාඑලිය

1.5.15.1.12 බිජ සහතික කිරිමේ සේවය - අම්පාර

1.5.15.1.13 බිජ සහතික කිරිමේ සේවය - බතලගොඩ

1.5.15.1.14 බිජ සහතික කිරිමේ සේවය - මඩකලපුව

1.5.15.1.15 බිජ සහතික කිරිමේ සේවය - කොළඹ

1.5.15.1.16 බිජ සහතික කිරිමේ සේවය - ලබුදූව

1.5.15.1.17 බිජ සහතික කිරිමේ සේවය - මුරුන්කන්

1.5.15.1.18 බිජ සහතික කිරිමේ සේවය - පැල්මඩුල්ල

1.5.15.1.19 බිජ සහතික කිරිමේ සේවය - රිකිල්ලගස්කඩ

1.5.15.1.20 බිජ සහතික කිරිමේ සේවය - වවුනියාව

1.5.15.1.21 බිජ සහතික කිරිමේ සේවය - මාතර

1.5.15.1.22 බිජ සහතික කිරිමේ සේවය - මතුගම

1.5.15.1.23 බිජ සහතික කිරිමේ සේවය - යාපනය

1.5.15.1.24 බිජ සහතික කිරිමේ සේවය - පරන්තන්

1.5.15.1.25 බීජ පරීක්ෂණාගාරය - පේරාදෙණිය

1.5.15.1.26 බීජ පරීක්ෂණාගාරය - මහඉලුප්පල්ලම

1.5.15.1.27 බීජ පරීක්ෂණාගාරය - අළුත්තරම

1.5.15.1.28 බීජ පරීක්ෂණාගාරය - බටඅත

1.5.15.1.29 බීජ පරීක්ෂණාගාරය - පරන්තන්

1.5.15.1.30 පශ්වාත් පාලන ක්ෂේත්‍රය I - ගන්නෝරුව

1.5.15.1.31 පශ්වාත් පාලන ක්ෂේත්‍ර අංක II - ගන්නෝරුව

1.5.15.1.32 පශ්වාත් පාලන ක්ෂේත්‍රය - සිතාඑලිය

1.5.15.1.33 පශ්වාත් පාලන ක්ෂේත්‍රය - මහඉලුප්පල්ලම

1.5.15.1.34 පශ්වාත් පාලන ක්ෂේත්‍ර - කරදියන්ආරු

1.5.15.1.35 පශ්වාත් පාලන ක්ෂේත්‍රය හා බීජ කෞතුකාගාරය - බටඅත

1.5.15.1.36 බීජ සෞඛ්‍ය ඒකකය - ගන්නෝරුව

1.5.15.2 ජාතික ශාක ආරක්ෂණ සේවය - ගන්නෝරුව

1.5.15.2.1 ශාක ආරක්ෂණ සේවය, මහඉලුප්පල්ලම

1.5.15.2.2 නියෝජ්‍ය අධක්ෂ බස්නාහිර පළාත (වී.ස.පැ.සං) - හොරණ

1.5.15.3 පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය - පේරාදෙණිය

1.5.15.4 පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය - ගන්නෝරුව

1.5.15.5 ජාතික ශාක නිරෝධායන සේවය - කටුනායක

1.5.15.5.1 ශාක නිරෝධායන ඒකකය - ගන්නෝරුව

1.5.15.5.2 ශාක නිරෝධායන ඒකකය - ගුවන්තොටුපොල, කටුනායක

1.5.15.5.3 ශාක නිරෝධායන ඒකකය - ගුවන්තොටුපොල, මත්තල

1.5.15.5.4 ශාක නිරෝධායන ඒකකය - කොළඹ වරාය

1.5.15.5.5 ශාක නිරෝධායන ඒකකය - හම්බන්තොට වරාය

1.5.15.5.6 ශාක නිරෝධායන ඒකකය - ගුවන්තොටුපොල, යාපනය

1.5.15.5.7 ශාක නිරෝධායන ඒකකය - මධ්‍යම තැපැල් හුවමාරුව

1.5.15.5.8 ශාක නිරෝධායන ඒකකය - රත්මලාන

1.5.16 පරිපාලන අංශය - පේරාදෙණිය

1.5.17 ආයතන අංශය - පේරාදෙණිය

1.5.18 ඉංජිනේරු අංශය - පේරාදෙණිය

1.5.18.1 ප්‍රාදේශීය ඉංජිනේරු වැඩපල - කුණ්ඩසාලේ

1.5.18.2 ප්‍රාදේශීය ඉංජිනේරු වැඩපල - පොළොන්නරුව

1.5.18.3 ප්‍රාදේශීය ඉංජිනේරු වැඩපල - අඟුණකොළපැලැස්ස

1.5.18.4 ප්‍රාදේශීය ඉංජිනේරු වැඩපල - සීතාඑළිය

1.5.19 මුදල් අංශය - පේරාදෙණිය

1.5.20 අභ්‍යන්තර විගණන අංශය - පේරාදෙණිය

1.5.21 ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය - පේරාදෙණිය

## 1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන/ අරමුදල්: නැත

## 1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු :

| ව්‍යාපෘතියේ නම | දායක නියෝජිතායතනය | ඇස්තමේන්තු ගත පිරිවැය (රු. මිලියන) | කාලසීමාව |
|---|---|---|---|
| 1. ආසියානු ආහාර හා කෘෂිකර්ම සහයෝගිතා මුලපිරුමෙහි (AFACI) සාමාජික රටවල් සඳහා සුදුසු ආතතීන්ට ඔරොත්තු දෙන, ඉහළ අස්වැන්නක් ලබා දෙන වී ප්‍රභේද සහ අගය එකතු කිරීම සඳහා ජනකප්ලාස්ම භාවිතය (GUVA) | AFACI | 2.2 | 2022-2025 |

| ව්‍යාපෘතියේ නම | දායක නියෝජිතායතනය | ඇස්තමේන්තු ගත පිරිවැය (රු. මිලියන) | කාලසීමාව |
|---|---|---|---|
| 2. ආසියානු ආහාර හා කෘෂිකර්ම සහයෝගිතා මුලපිරුමෙහි (AFACI) සාමාජික රටවල් විසින් ආතතීන්ට ඔරොත්තු දෙන වී ප්‍රභේද ලියාපදිංචි කිරීම සහ බීජ බෙදාහැරීම වේගවත් කිරීම | AFACI | 2 | 2025-2029 |
| 3. අවම කිරීමේ සහ අනුවර්තන උපාය මාර්ග යන දෙකම සඳහා ආසියාවේ සහ අප්‍රිකාවේ කුඹුරු ආශ්‍රිත මීතේන් විමෝචනය සහ නිෂ්පාදනය නිරීක්ෂණය කිරීම | NARO | 2 | 2024-2026 |
| 4. ආසියාවේ එළවළු අභිජනනය කිරීමේ තාක්ෂණය සංවර්ධනය කිරීම | AFACI | 11.52 | 2022-2026 |
| 5. විකෘති අභිජනන ප්‍රවේශයන් (IAEA, 28285 ව්‍යාපෘතිය) තුළින් 2024 වසරේ සිට 2029 වසර දක්වා කුරක්කන් (*Eleusine coracana* L.) අස්වැන්න සහ අස්වැන්නට අදාළ ශෂ්‍ය විද්‍යාත්මක ලක්ෂණ වැඩිදියුණු කිරීම | IAEA | 3.36 | 2024-2029 |
| 6. ශ්‍රී ලංකාවේ FRESH ව්‍යාපෘතිය යටතේ සහභාගිත්ව ඇගයීම් ප්‍රවේශය තුළින් තක්කාලි සහ මාළු මිරිස් ප්‍රභේද සංවර්ධනය කිරීම. | AVRDC | 1.29 | 2023-2025 |
| 7. ශ්‍රී ලංකාවේ ගොවි සහභාගිත්ව තක්කාලි දෙමුහුන් බීජ නිෂ්පාදන ක්‍රමවේදයක් සංවර්ධනය කිරීම | KOPIA | 8.62 | 2023-2026 |
| 8. ආසියානු ආහාර සංයුති දත්ත පද්ධතියේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම | AFACI | 8.55 | 2024-2027 |
| 9. ශ්‍රී ලංකාවේ පරිසර දූෂණය සිදුවන අනන්‍ය කලාප තුනක වායුගෝලීය නයිට්‍රජන් දූෂණ ප්‍රභවයන්, පාරිසරික තිරසරභාවයට සහ මානව සෞඛ්‍යයට ඉන් ඇති වන බලපෑම් මෙන්ම ඒවා වැළැක්වීමේ පිළියම් ඇගයීම | IAEA | 0.09 | 2018-2025 |

| ව්‍යාපෘතියේ නම | දායක නියෝජිතායතනය | ඇස්තමේන්තු ගත පිරිවැය (රු. මිලියන) | කාලසීමාව |
|---|---|---|---|
| 10. ශ්‍රී ලංකාවේ ප්‍රකාශිත සංරක්ෂිත ප්‍රදේශවල පිහිටි කඳුකර කෘෂිකාර්මික ජල පෝෂක ප්‍රදේශවල කෘෂි-දූෂක (agro-contaminants) මූලාශ්‍ර සහ ඒවා ප්‍රවාහනය වන ආකාරය හඳුනා ගැනීම | IAEA | 0.75 | 2018-2025 |
| 11. ආසියානු පාංශු සිතියම් සංග්‍රහය සහ ජාතික පාංශු තොරතුරු පද්ධති සංවර්ධනය කිරීම (AFACI) | AFACI | 13.3 | 2019-2026 |
| 12. ශ්‍රී ලංකාව තුළ දේශගුණික සුහුරු (Climate-Smart) කෘෂිකාර්මික තාක්ෂණය ව්‍යාප්ත කිරීම සඳහා වන SAARC C-Sucses ව්‍යාපෘතිය | SDF | 4.7 | 2022-2025 |
| 13. දකුණු ආසියානු කෘෂිකාර්මික අනුවර්තන ඇට්ලසය:දේශගුණික අවදානම්, භාවිතයන්, තාක්ෂණයන් සහ ප්‍රතිපත්ති අතර අන්තර් සම්බන්ධතාවයන් | BISA | 11 | 2023-2026 |
| 14. අගය දාම සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම තුළින් කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර හරහා සාර්ක් කලාපයේ සුළු ගොවීන්ගේ ජීවනෝපාය නංවාලීම | SDF | 0.81 | 2018-2025 |
| 15. ආසියාවේ ග්‍රාමීය කෘෂිකාර්මික තාක්ෂණ ව්‍යාප්ති පද්ධතිය වැඩිදියුණු කිරීම (RATES) | AFACI | 13.29 | 2023-2025 |
| 16. මිරිස් දෙමුහුන් බීජ නිෂ්පාදනය ඉහළ නැංවීම මගින් මිරිස් නිෂ්පාදන ආදර්ශ ගම්මාන පිහිටුවීම | KOPIA | 16.92 | 2024-2026 |
| 17. ආසියා කලාපීය සේනා දළඹු සහ දුඹුරු පැළ කීඩෑවා හඳුනා ගැනීම, අධීක්ෂණ හා නිරීක්ෂණ වැඩසටහන | AFACI | 13 | 2023-20236 |
| 18. කෘෂිකාර්මාන්තය සහ ජීව විද්‍යාව සඳහා වන ආයතනයේ (CABI) ශාක අනුව ස්ථිර බෝග සායන වැඩසටහන | CABI | 11.6 | 2022-2026 |

## පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### විශේෂ ජයග්‍රහණ

**වී**

- මාස 3කින් අස්වනු නෙලා ගත හැකි රතු පැහැති අතරමැදි-මධ්‍යම ප්‍රමාණයේ සහල් සහිත AT 13-1532 සහ මාස 3 1/2කින් අස්වනු නෙලා ගත හැකි, රතු පැහැති දිගු සිහින් සහල් සහිත AT 13-3791 යන වී ප්‍රභේද දෙක කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රභේද නිකුත් කිරීමේ කමිටුව (Varietal Releasing Committee) වෙත ඉදිරිපත් කිරීම සඳහා තෝරා ගන්නා ලදී.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රභේද නිකුත් කිරීමේ කමිටුව වෙත ඉදිරිපත් කිරීම සඳහා කෙටි-වටකුරු සුදු -එලාවරණයකින් යුතු සහල් සහිත, මාස 3 ½ කින් අස්වනු නෙලා ගත හැකි BG 16-2022 වී ප්‍රභේදය තෝරා ගන්නා ලදී.
- ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද පරීක්ෂණ (NCRVT) වැඩසටහන යටතේ දියුණු කරන ලද BG 21-18, BG 21-21, BG 15-1027 සහ AT 18-1322 යන වී ප්‍රභේද හතරක් දිවයිනේ විවිධ කෘෂි දේශගුණික කලාප තුළ ඇගයීමට ලක් කිරීමෙන් පසු ප්‍රභේද අනුවර්තන පරීක්ෂණ (VAT) සඳහා තෝරා ගන්නා ලදී. කළු පැහැයට හුරු-දම් පැහැති සහල් සහිත AT 21-1088 වී ප්‍රභේද කුඩා පරිමාණ අනුවර්තන පරීක්ෂණ සාර්ථකව නිම කිරීමෙන් පසු මහා පරිමාණ ප්‍රභේද අනුවර්තන පරීක්ෂණ (LSVAT) සඳහා තෝරා ගන්නා ලදී.
- සාම්ප්‍රදායික යෝගට් වලට සමාන ප්‍රෝටීන් සහ මේද මට්ටමකින් යුත් සහල් අඩංගු, අගය එකතු කරන ලද ගුණාත්මක යෝගට් එකක් නිපදවන ලදී. මෙහිදී AT 309, BG 381, BW 272-6b සහ AT 21-1088 යන වී වර්ග හතරෙන් ලබාගත් සහල් පිටි 30% දක්වා ප්‍රමාණයක් භාවිත කර ඇත.
- වී ඇට අවපැහැ ගැන්වීමට එරෙහිව Flutriafol (RP/As/19/Fun 14) දිලීර නාශකය ඵලදායී බව පරීක්ෂණ මගින් තහවුරු විය.
- දුඹුරු පැළ කීඩෑවා සහ සුදු කීඩෑවා පාලනය කිරීම සඳහා Dinotefuran 1% GR (ROP/AS/20/Ins.07) සැලකිය යුතු ලෙස ඵලදායී බව සොයා ගන්නා ලදී.
- වගාව සඳහා බිම් සකස් කිරීමට පෙර යොදන වල් නාශකයක් ලෙස Clethodium 24% EC හෙක්ටයාරයකට ලීටර් 3 බැගින් [ROP/AS/19/Her/18] සහ Clethodium 24% EC හෙක්ටයාරයකට ලීටර් 3 බැගින් සමග MCPA මිශ්‍රණය හෙක්ටයාරයකට ලීටර් 4 බැගින් පරීක්ෂා කළ අතර ඒවා තෘණ, පන් සහ පළල් පත්‍ර සහිත වල් පැලෑටි පාලනය සඳහා ඵලදායී බව සොයා ගන්නා ලදී.
- දේශීයව සකස් කරන ලද Glyphosate 360 g/l SL (RP/Her/25/Gly/01) වල් නාශකය හෙක්ටයාරයකට ලීටර් 4 බැගින් වී වගාවේ සහ වගා නොකරන බිම් පෙර-සකස් කිරීමේ වල් නාශකයක් ලෙස ලියාපදිංචි කිරීම සඳහා නිර්දේශ කරන ලදී.
- ගොවිබිම්වල වල් වී (Weedy-rice) පාලනය කිරීම සඳහා Fenclorim බීජ ප්‍රතිකාරය සහ ඉන් අනතුරුව Pretilachlor යෙදීම ඵලදායී ක්‍රමයක් ලෙස පරීක්ෂණ මගින් තහවුරු විය.
- දිය හවරිය (*Blyxa octandra*) මර්දනය කිරීම සඳහා තෝරාගත් වල්නාශක වර්ග හයක්: එනම් Florpyrauxifen-benzyl 25 g/l EC (හෙක්ටයාරයට මිලි ලීටර් 1200), Bentazone 480 g/l SL (හෙක්ටයාරයට මිලි ලීටර් 2500), Bispyribac-sodium 100 g/l SC (හෙක්ටයාරයට මිලි ලීටර්

500), Propanil 200 g/l + Thiobencarb 400 g/l EC (හෙක්ටයාරයට මිලි ලීටර් 3500), MCPA 600 g/l SL (හෙක්ටයාරයට මිලි ලීටර් 1800), Pretilachlor 300 g/l + Pyribenzoxim 20 g/l EC (හෙක්ටයාරයට මිලි ලීටර් 1250), ඒකාන්කර තෙත් හා වියළි ජල කළමනාකරණ ක්‍රමය (Alternate Wetting and Drying) ඒකාබද්ධව භාවිත කිරීම සාර්ථක බව හඳුනාගෙන ඇත.

**අතිරේක ආහාර බෝග**

- තෝර පරිප්පු අස්වනු නෙලීමේදී සෙන්ටිමීටර 40 සිට 50 දක්වා උසකින් කපා අස්වනු නෙලීම අතින් කරල් කැඩීමට වඩා කාලය සහ ශ්‍රමය ඉතිරි කර දෙන කාර්යක්ෂම ක්‍රමයක් බව තහවුරු වී ඇත.
- පරිභෝජනය සහ වගාව සඳහා ගන්නා මුං ඇට වල පවතින තද බීජ ප්‍රතිශතය අඩු කිරීම සඳහා උණු වතුර ප්‍රතිකාරය (100°C දී මිනිත්තු 2 ක්) සාර්ථක ක්‍රමයක් ලෙස හඳුනාගෙන ඇත. වගාවේ අවසාන වර්ධන අවධීන්හිදී (තාවකාලික මැලවීමේ අංකයට වඩා අඩු මට්ටමක) මෘදු ජල ආතතියක් පවත්වා ගැනීම මඟින් තද බීජ සෑදීම අඩු කළ හැකි බව පර්යේෂණ මඟින් හෙළි වී ඇත.
- රටකජු වගාවේ *Aspergillus* ආසාදනය සිදුවීමට වඩාත්ම අවදානම් කාලය වන්නේ අස්වනු නෙලීමේ සිට ගබඩා කිරීම දක්වා වූ කාලයයි. 'ලංකා ජම්බෝ' ප්‍රභේදය රසායනාගාර සහ ක්ෂේත්‍ර තත්ත්ව යටතේ *Aspergillus* ආසාදනයට ඔරොත්තු දෙන බව පෙනී ගොස් ඇත. *Trichoderma* විශේෂ භාවිතයෙන් *Aspergillus* පාලනය කිරීම සඳහා මාදිලි සමූහයක් අවශ්‍ය වේ.
- ළූණුවල දම් පුල්ලි රෝගය (Purple blotch) පාලනය සඳහා Pyraclostrobin 25% + Fluopimomide 5% ZC සහ Tebuconazole 10% + Sulphur 65% WG යන ප්‍රතිකාර දෙකම සාර්ථක බව තහවුරු වී ඇත. මීට අමතරව මිරිස් වගාවේ ඇන්ත්‍රැක්නෝස් (Anthracnose) රෝගය පාලනය සඳහා ද Pyraclostrobin 25% + Fluopimomide 5% ZC සාර්ථකව භාවිත කළ හැක.
- රසායනාගාර තත්ත්වයන් යටතේ ශාක බැක්ටීරියා ව්‍යාධිජනක පාලනය කිරීම සඳහා *Ocimum sanctum* ශාකයෙන් ෆීනෝල් බහුල නිස්සාරණ ලබා ගැනීමට වඩාත් සුදුසු ක්‍රමය හඳුනා ගන්නා ලදී. මෙතනෝල් (Methanol) භාවිතයෙන් සිදුකරන සොක්ස්ලට් (Soxhlet) නිස්සාරණ ක්‍රමය වඩා ඵලදායී බව තහවුරු විය. මීට අමතරව, තාපයට නිරාවරණය වීම අඩු කිරීමට, පිරිවැය අවම කිරීමට හෝ ආරක්ෂිතව පරිහරණය කිරීමට අවශ්‍ය අවස්ථාවලදී එතනෝල් (Ethanol) පදනම් කරගත් නිස්සාරණ ක්‍රම ප්‍රායෝගික විකල්පයක් ලෙස හඳුනාගෙන ඇත.
- විශාල ඇට සහිත රටකජු ප්‍රභේද සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් නිර්දේශිත පොහොර මිශ්‍රණය වෙනුවට ජෛව අඟුරු (bio-char) පදනම් කරගත් වැඩිදියුණු කළ පෝෂක පෙති සමග NPK පොහොර භාවිත කිරීමෙන් අස්වැන්නෙහි සැලකිය යුතු වෙනසක් සිදු නොවන බව පෙනී ගොස් ඇත.
- කිලිනොච්චි දිස්ත්‍රික්කයේ වන්නෙරිකුලම් ග්‍රාම නිලධාරී වසමේ සිදුකළ අවකාශීය ඇගයීමකට අනුව ඉඩම්වල පාංශු ලවණතාවයේ ඉහළ විචල්‍යතාවයක් පවතින බව අනාවරණය විය. භූගෝලීය තොරතුරු පද්ධති (GIS) පාදක කරගත් සිතියම් මඟින් ලවණ සහිත සහ ලවණ රහිත කලාප පැහැදිලිව හඳුනාගෙන ඇත. මෙම ලවණතා සිතියම් මඟින් ලවණතාවයට ගොදුරු විය හැකි ප්‍රදේශ වෙන්කර හඳුනාගත හැකි අතර, එමඟින් තිරසාර ඉඩම් පරිහරණය සඳහා අදාළ ස්ථානයට ගැලපෙන පාංශු සහ ලවණතා කළමනාකරණ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමට සහාය වේ.

- කිලිනොච්චි ප්‍රදේශයේ පවතින රතු-කහ ලැටොසෝල් පසෙහි රටකජු වර්ධනය සහ අස්වැන්න කෙරෙහි ජිප්සම් භාවිතය සැලකිය යුතු බලපෑමක් ඇති කරන බව පෙනී ගොස් ඇත. හෙක්ටයාරයකට ජිප්සම් කිලෝග්‍රෑම් 350ක් යෙදීමෙන් ඉහළම කරල් අස්වැන්න (හෙක්ටයාරයට ටොන් 2.12) වාර්තා වූ අතර, එහිදී ANKGSR 01 සහ ANKGSR 02 ප්‍රභේදවලට වඩා තිස්ස ප්‍රභේදය ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කළේය. ජිප්සම් මගින් කැල්සියම් ලබා ගැනීමේ හැකියාව වැඩි වීම නිසා ශාකයේ වර්ධනය, කරල් වර්ධනය, බීජ වල බර සහ පොතු ඉවත් වීමේ ප්‍රතිශතය (Shelling percentage) ඉහළ ගොස් ඇත.
- විශේෂ පොහොර පරීක්ෂණ වැඩසටහන යටතේ පොහොර නිෂ්පාදන 24 ක් ඇගයීමට ලක් කරන ලද අතර, ඉන් 'බයෝශක්ති' නිෂ්පාදනය බඩඉරිඟු වගාව සඳහා නිර්දේශ කරන ලදී.
- බඩඉරිඟු වගාව සඳහා ඩ්‍රෝන ආධාරයෙන් වල්නාශක යෙදීම පිළිබඳ මාර්ගෝපදේශ සකස් කර ඇත. Nicosulfuron 40 g/l OD වල්නාශකය හෙක්ටයාරයකට මිලි ලීටර් 1250 බැගින් බෝගය ස්ථාපිත කර දින 10-15 කට පසුව යෙදීමට නිර්දේශ කෙරේ.
- බඩඉරිඟු සඳහා ප්‍රශස්ත ඉසින පරිමාව හෙක්ටයාරයට ලීටර් 30 කි. වල් මර්දනය සාර්ථක වීමට සහ වල්නාශක විසිරී යාම  අවම කිරීමට බිංදු ප්‍රමාණය මයික්‍රෝ මීටර් 230–500 (μm) අතර විය යුතුය.ඉසින පරිමාව හෙක්ටයාරයට ලීටර් 20 දක්වා අඩු කිරීමෙන් බඩඉරිඟු ශාකයට විෂ සහිත බලපෑම් (Phytotoxicity) ඇති වූ අතර, එයින් පෙන්නුම් කරන්නේ පසු නිර්ගමන (Post-emergence) අවස්ථාවේදී අඩු පරිමාවන් භාවිතය නුසුදුසු බවයි. සුළං සහිත අවස්ථාවල ඉතා කුඩා බිංදු භාවිතය මඟින් වල්නාශක නාස්තිය වැඩි වී කාර්යක්ෂමතාව අඩු වේ.
- ඩ්‍රෝන ආධාරයෙන් වගා නොකළ ක්ෂේත්‍රවල පූර්ව-රෝපණ වල්නාශක යෙදීම සඳහා මාර්ගෝපදේශ සකස් කර ඇත. බෝගයක්  ස්ථාපිත කිරීමට පෙර Glyphosate 360 g/l SL වල්නාශකය හෙක්ටයාරයකට ලීටර් 4 ක අනුපාතයට යෙදීමට නිර්දේශ කෙරේ.  ඩ්‍රෝන යානය තත්පරයට මීටර් 2.5 ක වේගයකින් සහ මීටර් 2.5 ක උසකින් පියාසර කරමින් හෙක්ටයාරයට ලීටර් 20–30 ක ඉසින පරිමාවක් භාවිතා කිරීමෙන් සාර්ථක වල් මර්දනයක් ලබා ගත හැක.
- බඩඉරිඟු වගාවේ ප්‍රධාන පළිබෝධකයන් පාලනය සඳහා ඩ්‍රෝන මඟින් කෘමිනාශක යෙදීම සඳහා මාර්ගෝපදේශ සකස් කර ඇත. ඩ්‍රෝන මගින් කෘමිනාශක යෙදීමේදී පහත නිෂ්පාදන ඵලදායී බව හඳුනාගෙන ඇත. Spinetoram 25% WG හෙක්ටයාරයට ග්‍රෑම් 80 බැගින්, Spinosad 25 g/l SC හෙක්ටයාරයට මිලි ලීටර් 320 බැගින්, Emamectin benzoate 5% SG හෙක්ටයාරයට ග්‍රෑම් 120 බැගින්, Chlorantraniliprole 200 g/l SC හෙක්ටයාරයට මිලි ලීටර් 100 බැගින්, බෝගයේ මුල් වර්ධන අවධීන් සඳහා අංක 140 නොසල් ප්‍රමාණය සුදුසු වන අතර පසු අවධීන්හිදී ප්‍රශස්ත ඉසින ඝනත්වයක් ලබා ගැනීම සඳහා අංක 140–220 දක්වා වූ නොසල් ප්‍රමාණයන් වඩාත් ඵලදායී වේ. ඩ්‍රෝන යන්ත්‍ර ආධාරයෙන් කෘමිනාශක යෙදීම මඟින් සාම්ප්‍රදායික නැප්සැක් ඉසින යන්ත්‍ර හෝ ගොවීන් සාමාන්‍යයෙන් අනුගමනය කරන ක්‍රමවලට වඩා අඩු පාරිසරික බලපෑම් දර්ශක අගයන් (Environmental Impact Quotient - EIQ) වාර්තා විය.

## <u>උද්‍යාන බෝග</u>

***ඵලවළු***

- සාර්ථක විවෘත පරාගිත බණ්ඩක්කා ආර 3ක්, තෝර පරිප්පූ ආර 3ක්, සෝයා බෝංචි ආර 3ක් සහ කරල් මෙන්ම කොළ පරිභෝජනය සඳහා ද සුදුසු මුරුංගා ආර 3ක් දැනට නිපදවා ඇත. මේවා දැනට සාමාන්‍ය වගාව සඳහා මුදා හැරීමට පෙර පවත්වනු ලබන ප්‍රභේද අනුවර්තිතා පරීක්ෂණ යටතේ පවතී.
- බණ්ඩක්කා (MI5 – කි.ග්‍රෑ. 9.45), මෑ (ගන්නොරුව A9 – කි.ග්‍රෑ. 19.05; BS1 – කි.ග්‍රෑ. 3), රාබු (බීරළු – ග්‍රෑම් 760), කරවිල (මාතලේ ග්‍රීන් – කි.ග්‍රෑ.9, තින්නවෙලි වයිට් – කි.ග්‍රෑ.4), පිපිඤ්ඤා (HORDI CU4 – කි.ග්‍රෑ. 2), බෝංචි (කැකුළු – කි.ග්‍රෑ.114), දඹල (SLS 44 – කි.ග්‍රෑ. 8.15) ඇතුලත් ප්‍රභේද කිහිපයක අභිජනන බීජ (Breeder seeds) නිෂ්පාදනය කර ඇත.
- PB 55 සහ PB 177 යන වැල් බෝංචි ප්‍රභේද දෙක ප්‍රභේද අනුවර්තිතා පරීක්ෂණ සඳහා ඉදිරිපත් කර ඇත.
- බණ්ඩාරවෙල ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේදී නව ආරක්ෂිත බෝග වගා තාක්ෂණයන් පිළිබඳ ක්ෂේත්‍ර දිනයක් පවත්වන ලදී.
- තක්කාලි, මාලු මිරිස් සහ වැටකොළු වැනි දෙමුහුන් එළවළු බෝග සඳහා ශ්‍රී ලංකාවේ විවිධ කෘෂි-පාරිසරික කලාපවලට ගැලපෙන පෝෂක කළමනාකරණ පැකේජ සකස් කරන ලදී.
- බණ්ඩක්කා, වම්බටු, වැටකොළු සහ මාලු මිරිස් සඳහා පොහොර මිශ්‍රිත ජල සම්පාදන පද්ධති (Fertigation Systems) සඳහා පෝෂක කළමනාකරණ පැකේජ සකස් කරන ලදි.
- වසර 25ක් පුරා සිදුකරන ලද දිගුකාලීන නිරීක්ෂණ මගින් කොම්පෝස්ට් පොහොර පමණක් හෝ රසායනික පොහොර පමණක් භාවිතයට වඩා රසායනික හා කාබනික පොහොර ඒකාබද්ධව භාවිතා කිරීමෙන් ඉහළම එළවළු අස්වැන්නක් ලබාගත හැකි බව තහවුරු වී ඇත.
- මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් ආරක්ෂිත ගෘහ නවයක් තුළ සුදු මැස්සන්, පැළ මැක්කන්, මයිටාවන්, කුඩිත්තන්, පත්‍ර කනින්නන් සහ පිටි මකුණන් පාලනය කිරීම සඳහා ජීව විද්‍යාත්මක පාලන කාරකයන් (Biological control agents) ඇතුළත් පළිබෝධ පාලන පැකේජයක් හඳුන්වා දෙන ලදී.
- ගොවීන්ගේ ඉල්ලීම පරිදි දළ වශයෙන් ගොවීන් 1,200ක් සඳහා ජෛව පාලන කාරක නිකුත් කරන ලදී; ඒ අතරට සුදු මැස්සන් සඳහා 42,405ක්; කුඩිත්තන් සඳහා 30,000ක්; පත්‍ර කනින්නන් සඳහා 10,100ක්; දියමන්ති පිටැති සලබයන් සඳහා 5,560ක්; පොල් වගාවේ සුදු මැස්සන් සඳහා 615,850ක්; මයිටාවන් සඳහා 4,615ක්; සේනා දළඹුවන් සඳහා 387,350ක්; පිටි මකුණන් සඳහා 1,226ක්; සහ පැළ මැක්කන් සඳහා 1,652ක් ඇතුළත් වේ.
- වෙළඳපොළේ ඇති කියු-ලියෝ (Cue-lure) උගුල්වල ආකර්ෂණීය බව වැඩි කිරීම සඳහා මීතයිල් ඉයුජිනෝල් (Methyl eugenol) 1:1 අනුපාතයට මිශ්‍ර කිරීමෙන් පිරිමි ඉල් මැස්සන් මර්දනය කිරීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවිය හැකි බව සොයාගෙන ඇත.
- තඹ අඩංගු දිලීර නාශක (Copper-containing fungicides) භාවිතයෙන් බැක්ටීරියා කොළ අංගමාරය සාර්ථකව පාලනය කළ හැකි බවට නිර්දේශයක් ලබා දී ඇති අතර එය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකාර්මික පළිබෝධනාශක අනුකමිටුවේ අනුමැතිය ලැබූ පසු ක්‍රියාත්මක වනු ඇත.

- අඩුවෙන් පරිභෝජනය කරන එළවළු සහ අල බෝගවල අලුතින් මතුවන රෝග හඳුනාගෙන ඒවා පාලනය කිරීමේ ක්‍රම නිපදවා ඇත. මීට මඤ්ඤොක්කා දුඹුරු පත්‍ර පුල්ලි රෝගය සහ බැක්ටීරියා අංගමාරය, වී පත්‍ර කීඩෑවා මඟින් ඇතිවන පත්‍ර පුල්ලි රෝගය සහ කංකුන් වගාවේ Alternaria පත්‍ර පුල්ලි රෝගය ඇතුළත් වේ.
- කරවිල වගාවේ බැක්ටීරියා මැලවීම (Bacterial wilt) සඳහා සුදුසු රෝග පාලන පැකේජයක් සහ නිවිති වගාවේ කඳ කුණුවීමේ රෝගය (Stem rot) පාලනය සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කර ඇත.
- පලතුරු අතුරු නිෂ්පාදන උපයෝගී කර ගැනීමේ පර්යේෂණ මඟින් සැලකිය යුතු ප්‍රතිඵල අත්කර ගෙන ඇත. එහිදී කෘෂිකාර්මික අපද්‍රව්‍ය වලින් සෙලියුලෝස් සහ පෙක්ටීන් නිස්සාරණය කර ඒවා භාවිතයෙන් ඔසු පැන්, කෙටි ආහාර සහ ආහාරයට ගත හැකි පලතුරු ආවරණ (Edible fruit coatings) වැනි අගය එකතු කළ නිෂ්පාදන නිපදවා ඇත.

***පළතුරු***

- වියලි කලාපයට අනුවර්තනය වූ අලිගැටපේර ආර සහ බෙලි ආර ප්‍රභේද නිදහස් කිරීමේ කමිටුවට (VRC) තෝරා ගන්නා ලදී.
- විදේශීය පැණි කොමඩු ප්‍රභේද දෙකක් වන Nectar සහ Avatar පරීක්ෂාවට ලක් කර සාමාන්‍ය වගාව සඳහා නිර්දේශ කරන ලදී.
- අඹ, ජමනාරං, දිවුල් සහ කොස්වල වාණිජපලතුරු උයන් සාර්ථකව ස්ථාපිත කර ඇති අතර පලතුරු ජෛව විවිධත්ව උද්‍යානයක් ස්ථාපනය කිරීම සඳහා හෙක්ටයාර 10ක භූමි ප්‍රමාණයක් සංවර්ධනය කරන ලදී.
- පලතුරු බෝගවලින් සාර්ථක ප්‍රතිඵල පෙන්වන ආර 289 ක් හඳුනාගෙන ඇත. (අඹ - 7, අන්නාසි - 247, රඹුටන් - 5, අලිගැටපේර - 8, කොස් - 2, පෙපිනෝ - 1, අළු කෙසෙල් - 4, දූරියන් - 4, ලෙමන් - 3, බෙලි - 1, පැණි සියඹලා - 2, සියඹලා - 1, පමෙලෝ - 1, දෙළුම් - 2 සහ දිවුල් - 1).
- මල්බෙරි සහ ජබොටිකාබා ප්‍රභේද එක බැගින් හඳුන්වා දෙන ලදි.
- රඹුටන් ශාකයේ පුෂ්ප වල ලිංගිකත්වය තීරණය කිරීමට ජාන සලකුණු (Markers) තෝරා ගන්නා ලදි.කෙසෙල් වගාවේ ෆියුසේරියම් (Fusarium) මැලවීමේ රෝගයට ඔරොත්තු දෙන වගා ප්‍රභේද සහ අභිජනක ආර හඳුනා ගැනීමට පරීක්ෂණ පවත්වා ඇත.පේර වගාවේ මුල් ගැටිති වට පණු (Root-knot nematode) රෝගයට ප්‍රතිරෝධී ප්‍රභේද හඳුනා ගැනීමට පරීක්ෂණ සිදු කරන ලදි.
- අළු කෙසෙල් එකතුන් හයක් සහ ඇඹන් කෙසෙල් එකතුන් 18 ස්ථාපිත කර ඇති අතර ඒවායේ ලාක්ෂණීකරණය සහ ඇගයීම් කටයුතු දැනට සිදුවෙමින් පවතී.
- විකිරණයට ලක් කරන ලද ඇඹන් කෙසෙල් සාම්පල නලස්ථ ක්‍රමයට ගුණනය කිරීම සහ විකෘති පැළ 92 ක් ක්ෂේත්‍රයේ පරීක්ෂාවට ලක් කිරීම දැනට සිදුවෙමින් පවතී.
- නිර්දේශිත කෙසෙල් ප්‍රභේද සඳහා මව් ශාක උද්‍යානයක් ද පිහිටුවා ඇත .
- අලිගැටපේර එකතුන් 15 ක් ක්ෂේත්‍රයේ ඇගයීමට ලක් කෙරෙන අතර ඉන් සාර්ථක එකතුන් 3ක් හඳුනාගෙන ඇත. මේවා සඳහා අනුවර්තන පරීක්ෂණ සහ බහු-ස්ථාන අත්හදා බැලීම් ආරම්භ කර ඇත.
- උඩරට ප්‍රදේශය සඳහා සුදුසු සාර්ථක අලිගැටපේර එකතුන් දෙකක් හඳුනාගෙන ඇත.

- වියුක්ත ගහණයන් (Segregating populations) බිහි කිරීම සඳහා සාර්ථක විදේශීය ජනකප්ලාස්ම එකතුන් 11 ක් භාවිතා කර ඇත.
- සාර්ථක චෙරිමෝයා (Cherimoya) එකතුන් 10 ක් හඳුනාගෙන ඇති අතර ඒවායේ ඇගයීම් කටයුතු සිදුවෙමින් පවතී.
- ඉහළ අස්වැන්නක් සහ ගුණාත්මක බවක් සහිත පෙපිනෝ (Pepino) මාදිලියක් හඳුනාගෙන ඇත.
- උසස් ගුණාංග සහිත ප්‍රභේදයක් හඳුනා ගැනීම සඳහා විදේශීය කහ නාරං (Yellow mandarin) ප්‍රභේද 4ක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත ප්‍රභේද සමඟ සසඳමින් පරීක්ෂා කෙරේ.
- බීජ මගින් ලබාගත් ස්ට්‍රෝබෙරි (Strawberry) මාදිලි 5ක් ඒවායේ වර්ධනය, අස්වැන්න සහ ගුණාත්මකභාවය සඳහා ඇගයීමට ලක් කෙරේ.
- සාර්ථක $F_1$ ප්‍රභේදීය දෙමුහුන් අන්නාසි ආර 247 ක් තෝරාගෙන ඇති අතර දෙමුහුන් අන්නාසි පැළ 400ක් ඇගයීම සඳහා ක්ෂේත්‍රයේ ස්ථාපිත කර ඇත.
- අඹ, මිදි, පැඟිරි කුලයේ බෝග සහ ඌන උපයෝජිත පලතුරුවල ජනකප්ලාස්ම එකතු කිරීම, සංරක්ෂණය සහ ඇගයීම සිදු කරන ලදී.
- වරණය මගින් ඉහළ අස්වැන්නක් සහ ගුණාත්මක බවක් සහිත පැඟිරි කුලයේ බෝග (නාරං, දොඩම්, ජම්බෝල) නිපදවීම සහ දෙමුහුන්කරණය මගින් උසස් පේර ප්‍රභේද නිපදවීම සිදු කරන ලදී.
- සාර්ථක දෙමුහුන් දූරියන් ප්‍රභේද 4 ක් හඳුනාගෙන ජාතික සම්බන්ධීකරණ ප්‍රභේදීය පරීක්ෂණ (NCVT) වැඩසටහනට යොමු කර ඇත.
- පූර්ණ සහෝදර පවුල් (Full-sib families) ඇගයීම සඳහා කහ පැෂන් ෆෘට් වල මුහුන් සංයෝජන 9ක් සිදු කරන ලද අතර දම් පැහැති පලතුරු සහිත ශාක තෝරාගෙන දම් පැහැති පලතුරු ගහණවල මීළඟ පරම්පරාව දියුණු කිරීම සඳහා දෙමුහුන්කරණය සිදු කරන ලදී.
- ගොවි බිම් සහ තවාන් වලින් එකතු කරන ලද පේර වර්ග 24 ක් ක්ෂේත්‍රයේ රෝපණය කර ඇති අතර ඒවායේ පලතුරු වල ගුණාත්මක දත්ත රැස් කෙරේ.
- සාර්ථක දෙහි එකතුන් 3ක් විවිධ පර්යේෂණ මධ්‍යස්ථානවල පවත්වන ජාතික සම්බන්ධීකරණ ප්‍රභේදීය පරීක්ෂණ සඳහා තෝරාගෙන ඇත.
- පැපොල් වගාවේ සාර්ථක $S_3$ පරම්පරා දහයක් $S_4$ පරම්පරාව වැඩි දියුණු කිරීම සඳහා තෝරාගෙන ඇත.
- විවිධ රඹුටන් ගහණයන් අතරින් සාර්ථක මාදිලි 5ක් හඳුනාගෙන ඇගයීමට ලක් වෙමින් පවතී.
- කටු අනෝදා (Sour sop) වරණ 27ක විවිධත්වය විශ්ලේෂණය කළ අතර ඒ අතරින් AC10, M2 සහ 34 යන ප්‍රභේද සාර්ථක ඒවා ලෙස හඳුනා ගන්නා ලදි.
- විකෘති අභිජනනය (Mutation breeding) හරහා පැපොල් සහභිජාත ආර (Inbred lines) දියුණු කිරීම සඳහා CP13 ඒකගෘහී සහභිජාත ආරේ LD50 අගය හඳුනා ගන්නා ලදී.
- පර්යේෂණවලට අනුව පේර මැලවීමේ රෝගය (Guava wilt) වැළඳුණු ශාක (රිකිලිවලින් 50%කට වඩා අඩු ප්‍රමාණයක් මියගිය), කුකුළු පොහොර සමඟ මිශ්‍ර කරන ලද (1:40 අනුපාතයට) *Trichoderma harzianum* තනිව හෝ *T. harzianum* සහ *T. hamatum* මිශ්‍රණය (1:1 අනුපාතයට) යෙදීමෙන් මාස හයක් ඇතුළත සුවය ලබන බව සොයාගෙන ඇත.

- ඇන්ත්‍රැක්නෝස් රෝගය ආසාදිත අඹ සාම්පල වලින් වෙන්කරගත් *Colletotrichum asianum* දිලීරය, 3 ml/l මාත්‍රාවෙන් යොදන Chlorothalonil 500 g/l SC සඳහා *C. gloeosporioides* දිලීරයට වඩා අඩු සංවේදීතාවයක් එනම් වැඩි ප්‍රතිරෝධයක් දක්වන බව නළස්ථ තත්ත්ව යටතේ හෙළි විය .
- කෙසෙල් වගාවේ කහ සීගටෝකා (Yellow Sigatoka) රෝගය පාලනය සඳහා සෑම සති දෙකකට වරක් ආසාදිත පත්‍ර ඉවත් කිරීම, සෑම දින 21කට වරක් Tebuconazole (250 g/l EW හෝ 1 ml/l) යෙදීම, සෑම මාස දෙකකට වරක් පසට කැල්සියම් නයිට්රේට් (ශාකයකට ග්‍රෑම් 50 බැගින්) යෙදීම ඵලදායී බව සොයාගෙන ඇත.
- ගන්නෝරුව සීනි රත් කෙසෙල්, ඇම්බුන්, කැවෙන්ඩිෂ්, කන්ඩුල, නදී, අග්‍රා, ප්‍රසාද්, පුලතිසි, ඇට් කෙසෙල් සහ මිල්ලෑව සුවඳැල් යන කෙසෙල් ප්‍රභේද පැනමා සහ සීගටෝකා රෝගවලට දක්වන ක්ෂේත්‍ර ප්‍රතිරෝධය පිළිබඳව දැනට පරීක්ෂා කෙරෙමින් පවතී.
- දෙළුම් පලතුරු කුණුවීමේ රෝග කාරක වන *Colletotrichum* spp. සහ *Aspergillus* spp. මෙන්ම, දෙළුම් මැලවීමේ රෝග කාරක වන *Cerotocystis* spp. රූප විද්‍යාත්මකව හඳුනා ගන්නා ලදී .
- දෙළුම් ඇන්ත්‍රැක්නෝස් රෝගයෙන් වෙන්කරගත් *Colletotrichum* spp., නළස්ථ තත්ත්ව යටතේ නිර්දේශිත මාත්‍රාවලින් යොදන Chlorothalonil 500 g/l SC, Thiophanate-methyl %70 WP සහ Azoxystrobin 250 g/l SC යන දිලීර නාශක සඳහා අඩු සංවේදීතාවයක් දක්වන බව පෙනී ගොස් ඇත.
- 'සිට්‍රස් ට්‍රිස්ටේසා' (Citrus tristeza virus - CTV) වෛරසය හඳුනා ගැනීම සඳහා වූ අණුක හඳුනාගැනීමේ ක්‍රියාවලිය (Molecular identification) ප්‍රශස්ත කරන ලදී.
- විශ්ලේෂණය කරන ලද සාම්පල 100කින් 94%ක්ම 'සිට්‍රස් ට්‍රිස්ටේසා' (CTV) සඳහා ධනාත්මක වී ඇත. මෙයින් පෙනී යන්නේ මොනරාගල දිස්ත්‍රික්කයේ 94% ක්ද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ 76% ක්ද මෙම වෛරසය ව්‍යාප්ත වී ඇති බවයි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ CTV ව්‍යාප්තිය 92.8%ක් වන අතර පැහිරි කොළ පැහැ වීමේ (Citrus greening) බැක්ටීරියා ව්‍යාප්තිය 85.7%කි.
- පැෂන් ෆෘට් වගාවේ දක්නට ලැබෙන Woodiness virus – (PWV) සහ ශ්‍රී ලංකා පැෂන් ෆෘට් විචිත්‍ර (PFMoV) යන වෛරස් රෝග දෙක රෝග ලක්ෂණ මත පදනම්ව හඳුනාගෙන ඇත.
- ඩ්‍රැගන් ෆෘට් වගාවේ කඳේ ලප (Stem spot) සහ කඳේ පිළිකා (Stem canker) රෝග පාලනය සඳහා ඒකාබද්ධ රෝග පාලන පැකේජයක් සකස් කර ඇත. එහිදී රසායනාගාර පරීක්ෂණ මඟින් Trifloxystrobin 25% + Tebuconazole 50% WG ප්‍රතිකාරය 90% ක සාර්ථකත්වයක් පෙන්වා ඇත.
- කෙසෙල් වද පීදීමේ වෛරසයෙන් තොර රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා ආසාදිත පැළ තාප ප්‍රතිකාරයට ලක් කිරීමේ (සෙල්සියස් අංශක 55 දී මිනිත්තු 30ක් සහ අංශක 60 දී මිනිත්තු 15ක්) ක්ෂුද්‍ර ප්‍රචාරණ ක්‍රමවේදයක් සකස් කරන ලදී.
- පත්‍ර අග්‍රස්ථ රෝපණය මඟින් 'පොලොක්' (Pollock) අලිගැටපේර ප්‍රභේදය ද, බීජ රෝපණය (Seed culture) මඟින් මිදි ද ලෙස රෝගවලින් තොර රෝපණ ද්‍රව්‍ය නිපදවීම සඳහා ක්‍රමවේද දෙකක් සකස් කර ඇත.
- කෙසෙල් ප්‍රභේද විශ්ලේෂණයේදී තෙල් සහ ජලය අවශෝෂණය කිරීමේ හැකියාව 'අග්‍රා' සහ 'නදී' යන ප්‍රභේදවල ඉහළ මට්ටමක පවතින බව අනාවරණය විය.

- 2%ක ගුවාර් ගම් (Guar gum) සහ 6%ක මී ඉටි (Bee wax) මිශ්‍රිත ආහාරයට ගත හැකි ආලේපනයක් භාවිතා කිරීමෙන් 'හොරණ' දෙමුහුන් පැපොල් ප්‍රභේදයේ ගබඩා කාලය දින 10ක් දක්වා දීර්ඝ කළ හැකි බව සොයාගෙන ඇත.
- 1.5%ක ඇස්කෝර්බික් අම්ලය, 0.5%ක කැල්සියම් ක්ලෝරයිඩ් ($CaCl_2$) සහ1.5%ක සිට්‍රික් අම්ලය භාවිතා කිරීමෙන් ෆාදර්ලෝන්ග් (Fatherlong) වරකා ප්‍රභේදයේ කල්තබා ගැනීමේ කාලය සෙල්සියස් අංශක 7 උෂ්ණත්වය සහ 65%ක සාපේක්ෂ ආර්ද්‍රතාවය යටතේ දින 15ක් දක්වා සාර්ථකව දීර්ඝ කරන ලදී.
- කෝලිකුට්ටු කෙසෙල් (අග්‍රා ප්‍රභේදය), නාරං (ඉන්දු, මධු සහ හීං නාරං ප්‍රභේද) සඳහා පරිණත දර්ශක සහ පරිණත වගු (Maturity charts) සකස්කර ඇත.
- පැෂන් ෆෲට් වගාවේ අස්වනු නෙලීමට සුදුසු කාලය ලෙස මල් පිපී ගෙඩි හටගත් දින සිට 'ජම්බෝ' ප්‍රභේදය සඳහා දින 100–110ක් ද, 'හොරණ ගෝල්ඩ්' ප්‍රභේදය සඳහා දින 85–90ක් ද ලෙස හඳුනාගෙන ඇත.
- කටු අනෝදා ගෙඩි මලුගත කිරීම (bagging) මගින් පලතුරේ බාහිර පෙනුම වැඩි දියුණුවන අතර රෝග වැළඳීමේ ප්‍රවණතාව ද අඩුවන බව හඳුනාගෙන ඇත.
- 1000 ppm + 4000 ppm නැප්තලීන් ඇසිටික් ඇසිඩ් (NAA) සහ 1000 ppm + 5000 ppm NAA යන ප්‍රතිකාර සංකලන දෙක මගින් බ්‍රික්ස් $22^0$ ක ද්‍රාව්‍ය ඝන ද්‍රව්‍ය ප්‍රමාණයක් සහ 0.24%ක අම්ල ප්‍රතිශතයක් සහිත කටු අනෝදාවල බීජ රහිත ඵල දැරීම (parthenocarpy) උත්තේජනය කරන බව හඳුනාගන්නා ලදී.
- පෙයාර්ස් වගාව ව්‍යාප්ත කිරීමට සුදුසු ප්‍රදේශ හඳුනාගැනීම දැනට සිදුවෙමින් පවතී.
- ග්‍රාහක (rootstock) ප්‍රභේද හතක් සමග බද්ධ කරනු ලැබූ බිබිලේ පැණි දොඩම් සහ හොරණ "ජූසි මැන්ඩරින්"සඳහා වඩාත් ගැලපෙන ග්‍රාහකයන් හඳුනා ගැනීමට පරීක්ෂණ පවත්වනු ලැබේ.
- බිබිලේ ප්‍රදේශයේ පැණි දොඩම් වගාව පහත වැටීමට බලපාන සාධක පිළිබඳව පරීක්ෂණ සහ විශ්ලේෂණ දැනට සිදු කෙරෙමින් පවතී. බීජ රහිත (Seedless) පේර ප්‍රභේදය ප්‍රචාරණය කිරීම සඳහා වඩාත් සුදුසු වර්ධක ප්‍රචාරණ (Vegetative propagation) තාක්ෂණය හඳුනා ගැනීම.
- අන්නාසි පේළි තුනක් (පැළ අතර පරතරය සෙ.මී. 20) සහ 'නදී' ඇඹුල් කෙසෙල් පේළි දෙකක් වන පරිදි වගා කිරීමෙන් අන්නාසි සහ කෙසෙල් සාර්ථකව අතුරු බෝග ලෙස වගා කළ හැකි බව තහවුරු විය.
- මොරිෂස්' සහ MD 2 අන්නාසි ප්‍රභේදවල කිරුළ (Crown) කොටස්වලට කැපීම මගින් එක් කිරුළකින් පැළ 12ක් දක්වා සාර්ථකව ලබාගත හැකි බව පෙන්වා දී ඇති අතර එම පැළවල වර්ධනය සහ අස්වැන්න දැනට ඇගයීමට ලක් කෙරේ.
- තෙත් කලාපයේ රඹුටන් වගාවේ වාරයේදී මල් හටගැනීම වැළැක්වීම අග්‍රස්ථ කප්පාදුව මගින් ශාක වර්ධනය උත්තේජනය කිරීම, පොහොර මාත්‍රා දෙකක් යෙදීම සහ ජල ආතතිය ලබාදීම මගින් අවාරයේ මල් හටගැනීම (Off-season flowering) උත්තේජනය කළ හැකි බව සොයාගෙන ඇත.
- කප්පාදු කරන කාලය වෙනස් කිරීම, පොහොර යෙදීම සහ ප්‍රේරිත මල් හටගැන්වීම (Forced flowering) මගින් වසර පුරා අඹ අස්වැන්න ලබාගත හැකි වන පරිදි වගාව හසුරුවන ලදී.

- බහු වාර්ෂික පලතුරු ශාක විශේෂ යොදා ගනිමින් අක්කර 20ක වපසරියකින් යුත් කෘෂි වන වගා පද්ධතියක් සාර්ථකව නිර්මාණය කරන ලදී.
- අන්නාසි වගාව සඳහා කාබනික පෝෂක කළමනාකරණ පැකේජයක් සහ දෙමුහුන් පැපොල් වගාව සඳහා රසායනික පොහොර කළමනාකරණ පැකේජයක් නිපදවා ඇත.
- අධි ඝනත්ව අන්නාසි වගාවන් සඳහා පොහොර යෙදීමේ ක්‍රම ප්‍රශස්ත කරන ලදී.
- දිස්ත්‍රික්ක තුනක පලතුරු වෙළෙන්දන් ඇසුරින් සිදුකළ සමීක්ෂණයකදී පලතුරු මැස්සන් විශේෂ අටක් හඳුනා ගන්නා ලදී.
- අන්නාසි පිටි මකුණා පාලනය සඳහා 'Sulfoxaflor %50 WG' නැමති නව කෘමිනාශකය, සම්මත කෘමිනාශකයක් වන 'Acetamiprid %20 SP' හා සමානව ඵලදායී වන බව සොයා ගන්නා ලදි.
- පලතුරු මැසි සහ ඉල් මැසි ගහණ පාලනය කිරීම සඳහා කළු සොල්දාදු මැස්සා (Black Soldier Fly) විශාල වශයෙන් බෝ කිරීමේ ක්‍රමවේද සහ ඔවුන්ගේ බිත්තර දැමීමේ ධාරිතාව වැඩි දියුණු කරන ලදී .
- පැපොල් පිටි මකුණා පලවා හැරීම සඳහා Wood vinegar 200 ppm සාන්ද්‍රණය 45%ක ඉහළම කාර්යක්ෂමතාවයක් පෙන්නුම් කළේය.
- අධි ඝනත්ව අන්නාසි වගාව පිළිබඳව ක්ෂේත්‍ර ප්‍රදර්ශන දෙකක් බස්නාහිර පළාතේ පවත්වන ලදී.
- ගොවි පුහුණු වැඩසටහන් 48ක්, NVQ පුහුණු වැඩසටහන් 71ක්, විශ්වවිද්‍යාල සිසුන් 30 දෙනෙකු සඳහා පුහුණුවීම් සහ ප්‍රදර්ශන 11ක් පවත්වන ලදී.

**<u>ස්වභාවික සම්පත් කළමනාකරණය</u>**

- ශ්‍රී ලංකාව තුළ දේශගුණික සුහුරු කෘෂිකාර්මික තාක්ෂණය ව්‍යාප්ත කිරීමේ අග්නිදිග ආසියා දේශගුණික සුහුරු කෘෂිකාර්මික තාක්ෂණය ව්‍යාප්ත කිරීමේ (C-SUCSeS) ව්‍යාපෘතිය සඳහා වන සමුළුව සාර්ථකව නිම කරන ලදී.
- සහභාගිත්ව පර්යේෂණ වාර්තා කිහිපයක් ඉදිරිපත් කරන ලදී: ක්ෂුද්‍ර වාරිමාර්ග (සූර්ය බලශක්තියෙන් ක්‍රියා කරන සහ ගුරුත්වාකර්ෂණය ආධාරයෙන්), බහුකාර්ය පාංශු සංරක්ෂණ වැටි, ඉහළ වටිනාකමකින් යුත් බෝග සඳහා ආරක්ෂිත කෘෂිකර්මය.
- C-SUCSeS ව්‍යාපෘතිය යටතේ ගුරුත්වාකර්ෂණ ආධාරයෙන් ක්‍රියා කරන ක්ෂුද්‍ර වාරිමාර්ග සහ දේශගුණික සුහුරු කෘෂිකාර්මික තාක්ෂණික ක්‍රම පිළිබඳ වීඩියෝ දර්ශන 2ක් සකස් කරන ලදි.
- බෝග ජල අවශ්‍යතාවය සහ ජල භාවිත කාර්යක්ෂමතාව පිළිබඳ අත්පොත ප්‍රකාශයට පත් කරන ලදී.
- 2008 වසරේ ප්‍රකාශයට පත් කරන ලද විශේෂ පාංශු සංරක්ෂණ කලාපවලට ඇතුළත් නොවූ ප්‍රදේශවල ද පාංශු සංරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය හඳුනාගන්නා ලදි.
    - ආහාර සුරක්ෂිතතාව සහ තාක්ෂණික වැඩසටහන යටතේ, "කෑගල්ල දිස්ත්‍රික්කයේ රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අන්නාසි වගා කරන ලද ඉඩම්වල පස සංරක්ෂණය කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම" යනුවෙන් වසර තුනක විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය අමිතිරිගල ප්‍රදේශයේ අවධිමත් ලෙස අන්නාසි වගා කර ඇති ඉඩම් කෙරෙහි අවධානය යොමු කරයි.

- 2025 වසර තුළ ගොවි බිම් 20ක පස් සංරක්ෂණ ක්‍රම සාර්ථකව ක්‍රියාත්මක කළ අතර, අන්නාසි වගාවේදී පස් සංරක්ෂණ ව්‍යුහයන් අනුගමනය කිරීමේ වැදගත්කම පිළිබඳව ගොවීන් 100 දෙනෙකු පුහුණු කරන ලදී.
- පාංශු සංරක්ෂණ කටයුතු සඳහා වන සම්මත ගාස්තු ඇතුළත් වාර්තාවක් ද සකස් කරන ලදී.

- ආසියානු පාංශු හවුල්කාරිත්වය සහ එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO) සහාය ඇතිව "Soil Governance Analysis: Sri Lanka" වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී.
- පේරාදෙණිය ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කෘෂිකර්ම විද්‍යාඥ (ස්වභාවික සම්පත් කළමනාකරණ) ආචාර්ය එස්. එස්. සේනානායක විද්‍යාත්මක පර්යේෂණ සඳහා වන ජනාධිපති සම්මානයෙන් පිදුම් ලැබීය.
- GCF-Knuckles ව්‍යාපෘතිය යටතේ නකල්ස් කලාපයේ පන්විල, දංකන්ද සහ පිටවල යන ප්‍රදේශවල සාර්ථක පාංශු සංරක්ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන යටතේ:
  - රජයේ නිලධාරීන් 170ක් සහ ගොවීන් 430ක් සඳහා පාංශු සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.
  - ගොවි සහභාගිත්ව වැඩසටහන යටතේ ගොවිබිම් 80ක පාංශු සංරක්ෂණ ව්‍යුහයන් ස්ථාපිත කරන ලදී.
  - දංකන්ද ප්‍රදේශය සඳහා එක් පාංශු සිතියමක් සකස් කරන ලදී.
  - පාංශු සංරක්ෂණය පිළිබඳ අත්පොත් දෙකක් සකස් කරන ලදී.

**<u>සමාජ ආර්ථික සහ සැලසුම්</u>**

- බෝග පුරෝකථනය සහ CROPIX (නිවැරදි තොරතුරු හුවමාරු පද්ධතියක් තුළින් බෝග සම්පත් ප්‍රශස්ත කිරීමේ මෙහෙයුම්)
  - එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) සමඟ සහයෝගයෙන් මධ්‍යගත වෙබ් පාදක කෘෂිකාර්මික දත්ත වේදිකාවක් (Web-based data platform) ලෙස 2025 වසරේදී CROPIX පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ ශක්තිමත් කිරීම සිදු කරන ලදී.
  - ජාතික සහ උප-ජාතික මට්ටමින් බෝග පුරෝකථනය සහ සම්පත් නිරීක්ෂණය කිරීමේ කාලානුසාරී බව, නිරවද්‍යතාවය සහ අනුකූලතාවය වැඩි දියුණු කරන ලදී.
  - පාංශු පරීක්ෂාව, බීජ නිෂ්පාදනය හා සහතික කිරීම සහ ඒ ආශ්‍රිත කාර්යයන් ඩිජිටල්කරණය කිරීම සඳහා CROPIX පද්ධතිය තවදුරටත් පුළුල් කරන ලදී.
  - කාලීන නිෂ්පාදනය සහ වෙළඳපළ මැදිහත්වීම් සඳහා සහාය වීමට එළවළු පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති හඳුන්වා දෙන ලදී.
  - කෘෂිකාර්මික දත්තවල විනිවිදභාවය, ප්‍රවේශය සහ අන්තර්-ක්‍රියාකාරීත්වය ඉහළ නැංවීම සඳහා “Application Programming Interface (API)” පාදක දත්ත හුවමාරු ක්‍රමයක් සහ විවෘත දත්ත ද්වාරයක් (Open Data Portal) පිහිටුවන ලදී.
  - 2024/25 මහ සහ 2025 යල කන්නයන් ආවරණය කරමින් බෝග පුරෝකථන වාර්තා 10ක් සකස් කරන ලදී.

    - 'දිට්වා' සුළි කුණාටුවෙන් පසු කඩිනම් බෝග හානි සහ අලාභ ඇගයීම් සිදු කරමින් ප්‍රතිසාධන කටයුතු, නැවත වගා කිරීම සහ සැපයුම් කළමනාකරණ මැදිහත්වීම් සඳහා සහාය ලබා දෙන ලදී.
- වගා පිරිවැය (COC)
    - 2024 යල කන්නයේ වගා පිරිවැය වාර්තාව අන්තර්ජාලයට නිකුත් කළ අතර, 2024/25 මහ කන්නයේ වාර්තාව නිකුත් කිරීමේ කටයුතු අවසන් කරන ලදී. 2025 යල කන්නය සඳහා ක්ෂේත්‍ර දත්ත රැස් කිරීම සම්පූර්ණ කරන ලදී.
    - විවිධ නිෂ්පාදන තත්ත්වයන් යටතේ පිරිවැය සහ ආදායම් ඇස්තමේන්තු සකස් කරන ලදී.
    - ප්‍රධාන වී වර්ග සහ අතිරේක ආහාර බෝග (OFC) 13ක් සඳහා 2025/26 මහ කන්නයට අදාළ තාවකාලික වගා පිරිවැය ඇස්තමේන්තු සකස් කරන ලදී.
    - අවම මිලදී ගැනීමේ මිල (MPP) තීරණය කිරීම සහ ඇප ණය ක්‍රම (Pledge Loan schemes) සඳහා අවශ්‍ය තාක්ෂණික පදනම සපයන ලදී.
- ආහාර ප්‍රතිපත්ති සහ ආහාර සුරක්ෂිතතා ඇගයීම්
    - ජනාධිපති ලේකම් කාර්යාලය විසින් කැඳවන ලද ආහාර ප්‍රතිපත්ති සම්බන්ධීකරණ රැස්වීම් 23ක් සඳහා කමිටු පත්‍රිකා 30කට වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් කරන ලදී.
    - සැපයුම-ඉල්ලුම සහ ආනයන-අපනයන විශ්ලේෂණයන් තුළින් ජාතික ආහාර හා පෝෂණ සුරක්ෂිතතා සැලසුම්කරණයට සහාය දක්වන ලදී.
    - 'දිට්වා' සුළි කුණාටුව ඇතුළු දේශගුණික විපර්යාස හමුවේ කඩිනම් ආහාර සුරක්ෂිතතා ඇගයීම් වාර්තා ලබා දෙන ලදී.
- මිල උච්චාවචනයන් පිළිබඳ කමිටු සඳහා දායකත්වය
    - ප්‍රධාන ආහාර බෝග සඳහා වෙළඳපල ප්‍රවණතා, මිල ගණන් සහ අලෙවිකරණ ලාභාංශ (margins) පිළිබඳ කාලීන විශ්ලේෂණයන් සපයන ලදී. ඍතුමය රටා, වෙළඳ ගතිකත්වයන් සහ ආපදා බලපෑම් ඇතුළුව මිල උච්චාවචනය වීමට බලපාන සාධක ඇගයීමට ලක් කරන ලදී.
- කෘෂිකාර්මික සංඛ්‍යාලේඛන සම්පාදනය
    - 2025 කෘෂිකාර්මික සංඛ්‍යාලේඛන (AgStat) XXII වෙළුම සම්පාදනය කරන ලද අතර එහි වෙබ් ප්‍රකාශන කටයුතු මේ වන විට සිදු කෙරේ.
    - වී සහ අතිරේක ආහාර බෝග (OFC) 12ක් ආවරණය කරමින් නිෂ්පාදනය, ආනයනය සහ මිල විශ්ලේෂණයන් ඇතුළත් කාර්තුමය 'Crop Watch' වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී.
    - වගා ප්‍රවණතා, නිෂ්පාදන පුරෝකථන සහ වෙළඳපල ලාභාංශ විශ්ලේෂණයන් සහිත කාර්තුමය 'Vegi Watch' වාර්තාව නිකුත් කරන ලදී.
    - උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය (HORDI) සමඟ එක්ව එළවළු ප්‍රභේද ව්‍යාප්තිය (2024) පිළිබඳවත්, වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය (RRDI) සමඟ එක්ව වී ප්‍රභේද ව්‍යාප්තිය (2024) පිළිබඳවත් තාක්ෂණික සටහන් සකස් කරන ලදී.
- බෝග අස්වනු පරීක්ෂණ සහ භූමි සාධක ඇස්තමේන්තු කිරීම
    - ප්‍රධාන දත්ත පරතරයක් අවම කිරීම සඳහා අතිරේක ආහාර බෝගවල (OFC) අස්වැන්න ඇස්තමේන්තු කිරීමට දිවයින පුරා බෝග අස්වනු පරීක්ෂණ පවත්වන ලදී. මෙයට සමගාමීව

දිස්ත්‍රික් මට්ටමින් තාක්ෂණික ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා ප්‍රධාන පුහුණුකරුවන්ගේ (Master Trainers) වැඩසටහන් 27ක් පවත්වන ලදී.

- අස්වනු සහ නිෂ්පාදන ප්‍රක්ෂේපණයන් වැඩි දියුණු කිරීම සඳහා භූමි සාධක ඇස්තමේන්තු කිරීම් සිදු කරන ලදී.

- ව්‍යාපෘති සම්පාදනය සහ සම්බන්ධීකරණය
  - ලෝක බැංකු අරමුදල් සහිත ඒකාබද්ධ ග්‍රාමීය -නාගරික සංවර්ධන සහ දේශගුණික ඔරොත්තු දීමේ ව්‍යාපෘති (IRDCRP) යෝජනාව සකස් කිරීම සම්බන්ධීකරණය කරන ලද අතර ව්‍යාපෘතිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සවිස්තරාත්මක ක්‍රියාකාරී සහ ප්‍රසම්පාදන සැලසුම් සකස් කරන ලදී.
  - ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති (NARP) ව්‍යාපෘති යෝජනා 49ක් සම්පාදනය කර ඉදිරිපත් කළ අතර, කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව මගින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ කටයුතු සඳහා රුපියල් මිලියන 100ක ප්‍රතිපාදන වෙන් කරවා ගන්නා ලදී.
- ව්‍යාපෘති මූලික ඇගයීම් (Project baseline Assessments)
  - KOPIA ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික්ක 10ක මිරිස් ක්ෂේත්‍රය පිළිබඳ මූලික අධ්‍යයනයක් (Baseline study) ආරම්භ කරන ලදී.
  - උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය (HORDI) සමඟ සහයෝගයෙන් දේශීය ආහාර සංයුති දත්ත ගබඩාව (Traditional Food Composition Database) සඳහා දිවයින පුරා මූලික දත්ත රැස්කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- වෙළඳ පහසුකම් සැලසීම
  - ජාතික වෙළඳ පහසුකම් උපාය මාර්ග සහ ලෝක වෙළඳ සංවිධානය (WTO) සමඟ කරන කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික දායකත්වය සපයන ලදී.
  - වෙළඳ ගිවිසුම් යටතේ විශ්ලේෂණාත්මක වාර්තා සහ ආයෝජන ඉලක්ක කරගත් සංකල්ප පත්‍රිකා (Concept notes) සකස් කරන ලදී.
  - ජාතික ශාක නිරෝධායන සේවාව සමඟ සාකච්ඡා කර, යෝජිත සිව්-වැදෑරුම් (Four-band) රේගු ආනයන බදු ව්‍යුහය සමාලෝචනය කරන ලදී.

**<u>කෘෂිකාර්මික ව්‍යාප්ති සහ පුහුණුව</u>**

- ආහාර බෝග නිෂ්පාදනය සහ ඵලදායීතාවය ඉහළ නැංවීමේ වැඩසටහන යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

මිරිස් -

- මිරිස් නිෂ්පාදනය සහ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා MICHHY1 දෙමුහුම් බීජ කිලෝග්‍රෑම් 68ක් සහ වියළි මිරිස් නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා වගා මලු 250,000ක් ගොවීන් වෙත නොමිලේ ලබා දෙන ලදී. තවද 50% ගොවි දායකත්වය යටතේ ජල පොම්ප 74ක් බෙදා දෙන ලදී. නව තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන් 50ක්, ක්ෂේත්‍ර දින 4ක්, ක්ෂේත්‍ර චාරිකා 2ක් සහ අස්වනු කැපීමේ සමීක්ෂණ 13ක් පවත්වන ලදී.

ලොකු ළූණු -

- ඉහළ අස්වැන්නක් ලබා දෙන තාක්ෂණික පැකේජ ප්‍රවර්ධනය කිරීම මඟින් ලොකු ළූණු ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා, අක්කර ¼ බිංදු ජල සම්පාදන ඒකක 115ක් (50% ගොවි දායකත්වය මත) ලබා දෙන ලදී. කාබනික ද්‍රව්‍ය භාවිතය දිරිමත් කිරීම සඳහා නිෂ්පාදන ඒකක 219ක් සඳහා ඒකකයකට රුපියල් 10,000 බැගින් සහ එම ඒකකය සඳහා ගුණාත්මක බීජ මිලදී ගැනීමට රුපියල් 10,000 බැගින් සහනාධාර ලබා දී ඇත. යන්ත්‍රෝපකරණ භාවිතය දිරිමත් කිරීම සඳහා ගලෙන්බිඳුණුවැව "ශක්ති" සහ "මොඩර්න් ඇග්‍රෝ" යන ලොකු ළූණු නිෂ්පාදන සමිති දෙක වෙත පාත්ති සකස් කිරීමේ යන්ත්‍ර 2ක් ලබා දී ඇත.
- සහතික කළ සත්‍ය බීජ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ගොවින් ගිවිසුම්ගත ගොවීන් ලෙස මව් බල්බ නිෂ්පාදනය කිරීමට දිරිමත් කිරීම වෙනුවෙන්, බිම් සකස් කිරීම සඳහා රුපියල් 15,000ක සහ බෝග නඩත්තුව සඳහා රුපියල් 10,000ක සහනාධාර සහිතව නිෂ්පාදන ඒකක 30ක් ස්ථාපිත කරන ලදී. සත්‍ය බීජ නිෂ්පාදනයේදී භාවිතය සඳහා මව් බල්බ ගබඩා කර තබා ගැනීමට, මව් බල්බ කිලෝග්‍රෑම් 30,000ක් වෙනුවෙන් ගොවින් 600කට කිලෝග්‍රෑමයකට රුපියල් 150 බැගින් සහනාධාර ලබා දුන් අතර, පොලිතින් සහ මල් ආධාරක දැල් ඒකක 300ක් (50% දායකත්වය මත) බෙදා දෙන ලදී. අයහපත් කාලගුණික තත්ත්වයන් යටතේ සත්‍ය බීජ නිෂ්පාදනය සඳහා තාවකාලික වැසි ආවරණ 400ක් සහ කුඩා වැසි ආවරණ 105ක් (50% ගොවි දායකත්වය මත) ඉදිකර ඇති අතර, ගොවීන් සහ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 10ක් අස්වනු සමීක්ෂණ 4ක් පවත්වා ඇත.

බඩ ඉරිඟු -

- අධිසනත්ව ක්‍රමය යටතේ දේශීය බඩඉරිඟු ප්‍රභේදවල බීජ නිෂ්පාදනය වැඩි කිරීමට සහ ප්‍රචලිත කිරීම සඳහා, බීජ නිෂ්පාදක සමුපකාර සමිති, ගොවි සංවිධාන සහ යුද හමුදා කඳවුරු සතු ගොවිපළවල් වෙත නොමිලේ බීජ ලබා දෙමින් දේශීය දෙමුහුන් බඩඉරිඟු බීජ අක්කර 150 ක් නිෂ්පාදනය කරන ලදී. තවද බීජ නිෂ්පාදන සමිති 2 ක් සඳහා තෙතමනය මැනීමේ උපකරණ (Moisture meters) 4 ක් ලබා දෙන ලදී.
- අධිසනත්ව ක්‍රමය යටතේ දේශීය බඩඉරිඟු ප්‍රභේද ගොවීන් අතර ප්‍රචලිත කිරීම සඳහා අක්කර 11,455 ක් වෙනුවෙන් නොමිලේ බීජ සහ ප්‍රවාහන පහසුකම් ලබා දුන් අතර වගා ආදර්ශ වැඩසටහන් පවත්වන ලදී. ගොවි පුහුණු වැඩසටහන් 206 ක් සහ අස්වනු සමීක්ෂණ 10 ක් පවත්වා ඇති අතර, දැනුවත් කිරීම සඳහා පෝස්ටර් 3,000 ක් මුද්‍රණය කරන ලදී.

අර්තාපල් -

- $G_0$ ආකන්ද නිෂ්පාදනය මිලියන 9 දක්වා ඉහළ නැංවීම සඳහා දැල් ගෘහයන් තුළ කුඩා ආකන්ද (Mini tubers) නිෂ්පාදනය කිරීමට ඇල්බට් ද්‍රාවණය මිලදී ගන්නා ලදී.
- ගොවි බිම්වල අර්තාපල් නිෂ්පදානය මෙට්‍රික් ටොන් 3,000 සිට 10,000 දක්වා වැඩි කිරීම සහ ස්වයං බීජ නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණින්, $G_0$ ආකන්ද 1,141,300ක් සහ මූලික බීජ මෙට්‍රික් ටොන් 25ක් 50% සහනාධාර පදනම මත ගොවීන්ට ලබා දී ඇත. බීජ මෙට්‍රික් ටොන් 50ක් සඳහා ගබඩා පහසුකම් සීතාඑළිය බීජ ගොවිපළේ කුලී පදනම සමත ලබා දී ඇති අතර ඒ සඳහා ඇසුරුම් පෙට්ටි (Crates) 6,000ක් මිලදී ගෙන ඇත.

- අර්තාපල් වගා කරන ප්‍රදේශය හෙක්ටයාර 7,000 දක්වා වැඩි කිරීම සඳහා යාපනය සහ මහනුවර ගොවීන්ට G1 බීජ කිලෝග්‍රෑම් 1,746 ක් ද, නුවරඑළිය සහ බදුල්ල ගොවීන්ට සහතික කළ බීජ අර්තාපල් මෙට්‍රික් ටොන් 25 ක් ද 50% ගොවි දායකත්වය යටතේ ලබා දී ඇත.
- නිෂ්පාදනය හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 18 සිට 22 දක්වා වැඩි කිරීම සඳහා 50% ගොවි දායකත්වය යටතේ ගොවීන් 500 ක් අතර බෙදා දීමට බෝග ආරක්ෂක නයිලෝන් දැල් 3,400 ක් මිලදී ගෙන ඇත.

මුං -

- ස්වයං බීජ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා 50% ගොවි දායකත්වය යටතේ ලියාපදිංචි කළ බීජ කිලෝග්‍රෑම් 8,267ක් ලබා දෙමින් හෙක්ටයාර 413ක් ආවරණය වන පරිදි ක්ෂේත්‍ර ආදර්ශ පවත්වන ලද අතර, අලුත් වගාවන් තුළද ආදර්ශ වැඩසටහන් පවත්වන ලදී.
- අතුරු කන්නය තුළ වගා වපසරිය වැඩි කිරීම සඳහා 50% ගොවි දායකත්වය යටතේ බීජ කිලෝග්‍රෑම් 11,567ක් ලබා දෙමින් හෙක්ටයාර 462ක ක්ෂේත්‍ර නිරූපණ පවත්වන ලදී.
- මුං ඵලදායීතාවය ඉහළ නැංවීමේ ආදර්ශන කටයුතු සඳහා ව්‍යාප්ති පුහුණු මධ්‍යස්ථාන සහ ගොවි සංවිධාන වෙත බීජ කිලෝග්‍රෑම් 2,448ක්, අවශ්‍ය කෘෂි රසායන ද්‍රව්‍ය සහ බීජ වපුරන යන්ත්‍ර (Seeders) 75ක් නොමිලේ ලබා දී ඇත. තවද ගොවි සමිති සහ බීජ නිෂ්පාදන සමිති අතර නොමිලේ බෙදා හැරීම සඳහා ගොවිපල් යාන්ත්‍රික පර්යේෂණ මධ්‍යස්ථානය මඟින් මුං පොතු ඉවත් කිරීමේ යන්ත්‍ර (De - hulling machines) 4ක් නිෂ්පාදනය කරන ලදී.
- වනජීවී හානි පාලනය කිරීම සඳහා 50% සහනාධාර යටතේ සූර්ය බලශක්ති විදුලි වැට උපාංග (Solar Electric Energizers) 124ක්ද, ප්‍රශස්ත ගබඩා කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා 50% සහනාධාර යටතේ ස්ථර තුනකින් යුත් බෑග් (Triple-layer bags) 2,850ක් ද ගොවීන් වෙත බෙදා දී ඇති අතර, මුං ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන 3ක් හඳුනාගෙන ඇත.

උඳු -

- ස්වයං බීජ නිෂ්පාදනය මඟින් උඳු ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා හෙක්ටයාර 500ක් වෙනුවෙන් සහතික කළ/ ලියාපදිංචි කළ උඳු බීජ කිලෝග්රෑම් 12,522ක් ගොවීන්ට නොමිලේ ලබා දෙන ලදී. වල සත්ව හානි පාලනය කිරීම සඳහා සූර්ය බලශක්ති විදුලි වැට උපාංග ඒකක 61ක් (50% ගොවි දායකත්වය මත) ලබා දුන් අතර ගොවි පුහුණු වැඩසටහන් 15ක් පවත්වන ලදී.

කව්පි -

- කව්පි බීජ නිෂ්පාදනය දිරිමත් කිරීම සඳහා හසලක, අම්පාර, අනුරාධපුර, මොනරාගල සහ පොළොන්නරුව ප්‍රදේශවල ගොවීන්ට හෙක්ටයාර 147ක් සඳහා ලියාපදිංචි කළ බීජ කිලෝග්‍රෑම් 3,691ක් නොමිලේ ලබා දෙන ලදී. කව්පි නිෂ්පාදන තාක්ෂණික පැකේජය පිළිබඳ නිරූපණය 50ක් සඳහා ජල සම්පාදන පහසුකම් සැලසීමට ඇල්කතීන් බට (50% ගොවි දායකත්ව මත) මිලදී ගත් අතර, තාක්ෂණික පැකේජ පිළිබඳ නිරූපණ 10ක් සහ නව තාක්ෂණය පිළිබඳ ගොවි පුහුණු වැඩසටහන් 24ක් පවත්වන ලදී.

රටකජු-

- ‘ජම්බෝ’ වර්ගයේ රටකජු සඳහා ගුණාත්මක සහතික කළ බීජ නිෂ්පාදනය වැඩි කිරීමට ලියාපදංචි කළ බීජ මෙට්‍රික් ටොන් 1.8ක් ගොවීන්ට නොමිලේ ලබා දී ඇත. තවද අභිජනන බීජ නිෂ්පාදදනය පහසු කිරීම සඳහා කරදියන්ආරු ප්‍රාදේශිය පර්යේෂණ මධ්‍යස්ථානයේ නළ ළිඳක් සහ විදුලි වැටක් ඉකිරීමේ කටයුතු නිම කර ඇත.

සෝයා බෝංචි -

- සෝයා බෝංචි බීජ නිෂ්පාදනය සඳහා බීජ කිලෝග්‍රෑම් 1,700ක් මිලදී ගෙන මහවැලි H කලාපයේ ගොවීන් අතර නොමිලේ බෙදා දෙන ලදි.

කුරක්කන් -

- ගොවීන් වෙත නොමිලේ සහතික කළ බීජ ලබා දුන් අතර, කුඹුරු සහ ගොඩ ඉඩම් හෙක්ටයාර 340ක් වගාව ව්‍යාප්ත කිරීම සහ හෙක්ටයාර 40ක පැළ සිටුවීම සිදු කරන ලදී. මෙයට සමගාමීව ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් 34ක් පවත්වන ලදී.

රතු ළූණු -

- සත්‍ය බීජ (True seeds) සහ බීජ ළූණු නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරිම සඳහා, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතනවල සහ ගොවි බිම්වල එක් ඒකකයකට රුපියල් 50,000 බැගින් වටිනා යෙදවුම් ලබා දෙමින් සත්‍ය බීජ නිෂ්පාදන ඒකක 100ක් සහ බීජ ළූණු නිෂ්පදාන ඒකක 144ක් ස්ථාපිත කරන ලදී. ගබඩා පහසුකම් වැඩිදුයුණු කිරීම සඳහා මොනරාගල අන්තර් පළාත් කලාපයේ 25% ගොවි දායකත්වය යටතේ රතු ළූණු ගබඩා මඩු තුනක් ඉදිකරන ලද අතර විසිරි (Sprinkler) ජල සම්පාදන පද්ධති 10ක් ස්ථාපිත කරන ලදී.

තල -

- නව සහ දියුණු කළ ප්‍රභේදවල උසස් තත්ත්වයේ බීජ සුලභ කිරීම සඳහා ගොවීන්ට ලියාපදිංචි කළ බීජ කිලෝග්‍රෑම් 962.5ක් නොමිලේ ලබා දෙමින් ස්වයං බීජ නිෂ්පාදන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. අපනයනය ප්‍රවර්ධනය කිරීම සඳහා අස්වැන්නේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ අරමුණින්, 50% සහනාධාර යටතේ ගොවීන් 265 දෙනෙකුට ඉටි රෙදි (Tarpaulins) 265ක් ලබා දෙන ලදී.
- අගය එකතු කිරීමේ දාමය සංවර්ධනය කිරීම සඳහා තල තෙල් නිස්සාරණය සහ තල ආශ්‍රිත රසකැවිලි නිෂ්පාදනය වෙනුවෙන් තෙල් නිස්සාරණ යන්ත්‍රයක්, තල ගුලි සකස් කරන යන්ත්‍ර 04ක්, විදුලි වියළනයක් (Electric dryer) සහ මල නොබැඳෙන වානේ තැටි (Stainless steel trays) 10ක් 50% සහනාධාර යටතේ ගොවීන්ට ලබා දුන් අතර, ගොවීන් 436 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පුහුණු වැඩසටහන් 10ක් පවත්වන ලදී.

- වී නිෂ්පාදන සංවර්ධනය සඳහා අන්තර් පළාත් කලාප 6 ක ගොවීන් අතර සහතික කළ බීජ වී කිලෝග්‍රෑම් 9,685 ක් සහ ලියාපදිංචි කළ බීජ වී කිලෝග්‍රෑම් 626 ක් බෙදා දෙන ලදී.

- මීට අමතරව, වී වගාව සඳහා වන නව තාක්ෂණික පැකේජය ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික වී නිෂ්පාදන යාය වැඩසටහන් 263 ක් පවත්වන ලදී.
- කෘෂිකාර්මික අධ්‍යාපන කටයුතු පහසු කිරීම සඳහා කෘෂිකර්ම විද්‍යාලවල (අඟුණකොළපැලැස්ස, අනුරාධපුර, කරපිංච, කුණ්ඩසාලේ, පාලමුනෙයි, වවුනියාව) යටිතල පහසුකම් සංවර්ධනය කරන ලදී.
- 2025 වර්ෂය තුළ NVQ 6 මට්ටමේ විද්‍යාලවල සිසුන් 522ක් කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (HNDAPT) හදාරමින් සිටි අතර, NVQ 5 මට්ටමේ විද්‍යාලවල සිසුන් 311ක් පාඨමාලාව කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා (NDAPT) හදාරමින් සිටියහ. ඒ අනුව 2025 වසර අවසානය වන විට මුළු සිසුන් 833ක් මෙම පාඨමාලා හදාරමින් සිටියහ.
- 2025 වසරේදී NVQ 5 මට්ටමේ සිට NVQ 6 මට්ටම හැදෑරීම සඳහා ඇතුළත් කරගත් සිසුන් සංඛ්‍යාව 43කි.
- NVQ 5 මට්ටම සම්පූර්ණ කළ සිසුන් 125 දෙනෙකු 2025 වසරේදී සිය ආයතනික පුහුණුව නිම කර ඇත.
- කෘෂිකර්ම විද්‍යාල සංවර්ධනය කිරීම යටතේ රුපියල් මිලියන 297ක ප්‍රතිපාදන වැය කරමින් 2025 වසරේදී සිසුන්ගේ යටිතල පහසුකම් සහ ඉගෙනුම් පරිසරය ඉහළ නංවන ලදී.
- 2025 වර්ෂය තුළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අපේක්ෂකයින් 526ක්, මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අපේක්ෂකයින් 13ක් සහ හදබිම අධිකාරියේ අපේක්ෂකයින් 46ක් සඳහා දිවයින පුරා කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වන ලදී.
- කෘෂි රසායන අලෙවි සහ තාක්ෂණික සහායක (ASTA) සහතික පත්‍ර පාඨමාලාවේ අපේක්ෂකයින් 532ක් සඳහා ද, කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණ ජාතික ඩිප්ලෝමා (NVQ-05) ප්‍රවේශ විභාගය සඳහා අපේක්ෂකයින් 403ක් සහ කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා (NVQ-06) ප්‍රවේශ විභාගය සඳහා අපේක්ෂකයින් 514ක් සඳහා ද විභාග පවත්වන ලදී.
- 2025 ඔක්තෝබර් මාසයේ පැවැත්වූ ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයේදී ජාතික/උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සාර්ථකව නිම කළ සිසුන් සඳහා සහතික පත්‍ර 502ක් ප්‍රදානය කරන ලදී.
- කෘෂිකර්මාන්තයට අදාළ නවීන තාක්ෂණය දෙපාර්තමේන්තු නිලධාරීන්, පාසල් සහ ව්‍යවසායකයින් අතර ව්‍යාප්ත කිරීම සහ ප්‍රචලිත කිරීම සේවා සංස්කරණ අභ්‍යාස ආයතන, දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථාන (DATC) සහ ගොවිපළ යාන්ත්‍රික පුහුණු මධ්‍යස්ථානය මගින් සිදු කරන ලදී.
- 2025 වර්ෂය තුළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා මිනිස් දින (man-days) 11,172ක පුහුණු වැඩසටහන් ද, අනෙකුත් ආයතනවල නිලධාරීන් සඳහා මිනිස් දින 1,275ක ද, ගොවීන් සඳහා මිනිස් දින 7,550ක ද සහ ක්ෂේත්‍ර පුහුණු ලෙස නිලධාරීන් සහ ගොවීන් සඳහා මිනිස් දින 25,694ක පුහුණු වැඩසටහන් ද පවත්වන ලදී.
- ගොවීන්ගේ තීරණ ගැනීමේ හැකියාව සහ වෙළඳපල ප්‍රතිචාරාත්මක බව ශක්තිමත් කරමින් කුඩා පරිමාණ ගෙවතු බල ගැන්වීම සහ ප්‍රවර්ධන (Smallholder Horticulture Empowerment and Promotion) ප්‍රවේශය ක්‍රියාත්මක කිරීම හරහා වෙළඳපල ඉලක්ක කරගත් කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කරන ලදී.

- නිෂ්පාදනවල ගුණාත්මකභාවය, ආහාර සුරක්ෂිතතාව සහ වෙළඳපල ප්‍රමිතීන්ට අනුකූල වීම වැඩිදියුණු කරමින් SL-GAP සහතික 668 ක් නිකුත් කිරීමට පහසුකම් සලසන ලදී.
- සහතික කිරීමේ සේවාවන් සහ දෘශ්‍යතාව (Visibility) ශක්තිමත් කරමින් ගන්නෝරුව සහ මඩකලපුව යන ප්‍රදේශවල පිහිටි 'Agri Fresh' අලෙවිසැල් ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු නිම කරන ලදී.
- ව්‍යාපාරික කුසලතා ඉහළ නැංවීමට සහ කෘෂිකාර්මික අංශයේ ව්‍යවසාය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා කෘෂි ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් හතක් (07) පවත්වන ලදී.
- ආදායම් උත්පාදනයට සහ තිරසාර ජීවනෝපායන් සඳහා දායක වෙමින්, වෙළඳපල ඉලක්ක කරගත් කුඩා පරිමාණ ගොවීන්ට ප්‍රතිලාභ ලබා දීම කෙරෙහි අවධානය යොමු කරමින් කෘෂිකර්මාන්තය වාණිජකරණය කිරීම දිරිමත් කරන ලදී.
- තෝරාගත් කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා සම්බන්ධීකරණ නිෂ්පාදනය සහ වෙළඳපල ප්‍රවේශය ඉහළ නැංවීම සඳහා අපනයන ඉලක්ක කරගත් නිෂ්පාදන ගම්මාන දෙකක් ස්ථාපිත කරන ලදී.

**<u>කෘෂිකාර්මික තොරතුරු සහ සන්නිවේදනය</u>**

- දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සඳහා පුළුල් ප්‍රචාරණයක් ලබා දීමේ සහ මහජන දැනුවත්භාවය ඉහළ නැංවීමේ අරමුණින්, කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වයෙන් මධ්‍යම පළාතේ රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය වාර්තාකරුවන් සඳහා මාධ්‍ය සාකච්ඡාවක් නොවැම්බර් මාසයේදී සංවිධානය කරන ලදී.
- 'දිට්වා' සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ ගංවතුරින් ජාතික කෘෂිකාර්මික තොරතුරු සහ සන්නිවේදන මධ්‍යස්ථානයේ (NAICC) පුහුණු රසායනාගාරයට, මාධ්‍ය උපකරණවලට සහ නිල වාහන දෙකකට දැඩි හානි සිදු විය. එම පාඩු මධ්‍යයේ වුවද, කාර්ය මණ්ඩලය කඩිනමින් පරිශ්‍රය යථා තත්ත්වයට පත් කර මාධ්‍ය සහ ක්ෂේත්‍ර මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කළහ.
- කෘෂිකාර්මික තාක්ෂණයන් සාමාන්‍ය ජනතාව අතරට ගෙන යාම සඳහා සහ නිවැරදි තීරණ ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු නියමිත වේලාවට සියලුම පාර්ශවකරුවන්ට ලබා දීම සහතික කිරීම සඳහා ජාතික රූපවාහිනිය හරහා වැඩසටහන් 97 ක් සහ ITN වසන්තම් (Wasantham) නාලිකාව හරහා දෙමළ භාෂා වැඩසටහන් 50 ක් විකාශනය කරන ලදී.
- මීට අමතරව, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ ප්‍රධාන ගැටලු ආමන්ත්‍රණය කරමින් විශේෂ වීඩියෝ වැඩසටහන් 40 ක් සහ වාණිජ කෙටි පණිවිඩ 16 ක් (වාර 59 ක් විකාශනය වූ) නිෂ්පාදනය කරන ලදී. තවද, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් දියත් කරන ලද විශේෂ අවස්ථා සහ වැඩසටහන්වලට අදාළ ගෙවන ලද කෙටි පණිවිඩ පහක් නිෂ්පාදනය කර නිල රූපවාහිනී නාලිකා ඔස්සේ 442 වතාවක් විකාශනය කරන ලදී.
- වගාකරුවන් කඩිනමින් දැනුවත් කිරීම සඳහා කෙටි කෘෂිකාර්මික පණිවිඩ 273 ක් නිෂ්පාදනය කර යූ ටියුබ් (YouTube) වෙත උඩුගත කරන ලදී. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් පිළිබඳ මහජන දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා දෙපාර්තමේන්තු වැඩසටහන්වල ඡායාරූප 40,870 ක් සහ අනෙකුත් අදාළ උත්සවවල ඡායාරූප 246 ක් ලබා ගන්නා ලද අතර, ප්‍රධාන විශේෂ

සිදුවීම් සඳහා සමාජ මාධ්‍ය වේදිකා හරහා, ප්‍රධාන වශයෙන් 'Krushi TV' නාලිකාව ඔස්සේ පුළුල් ප්‍රචාරණයක් ලබා දෙන ලදී.

- අනුගාමිකයින් (Followers) 143,210 ක් සිටින 'Krushi TV' ෆේස්බුක් (Facebook) පිටුවට වීඩියෝ දර්ශන 268 ක් සහ ග්‍රාහකයින් (Subscribers) 88,365 ක් සිටින 'Krushi TV' යූ ටියුබ් නාලිකාවට වීඩියෝ දර්ශන 256 ක් උඩුගත කරන ලදී. මෙම ඩිජිටල් වේදිකා කෘෂිකාර්මික රූපවාහිනී වැඩසටහන් ව්‍යාප්ත කිරීමට සහ විශේෂයෙන් තරුණ පරපුර අතර නව තාක්ෂණය පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීමට සැලකිය යුතු දායකත්වයක් ලබා දුන්නේය.
- සිංහල සහ දෙමළ භාෂා දෙකෙන්ම ගුවන් විදුලි වැඩසටහන් 1,698 ක් සහ කෙටි පණිවිඩ 862 ක් නිෂ්පාදනය කරන ලදී. මීට අමතරව, කෘෂිකර්ම අංශයේ ඵලදායිතාවය ඉහළ නැංවීමට සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තොරතුරු සේවාවන් වෙත පහසුවෙන් ප්‍රවේශ වීමට ඉඩ සැලසීම සඳහා 'Krushi Web Radio' (www.krushiradio.lk) සජීවී විකාශනය අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.
- විද්‍යුත් මාධ්‍ය වෙත ප්‍රවේශ වීමට අපහසු ග්‍රාමීය ගොවීන් සහ සාමාන්‍ය ජනතාව අතර කෘෂිකාර්මික තාක්ෂණය ව්‍යාප්ත කිරීම සඳහා පොත් සහ අනෙකුත් ප්‍රකාශන පිටපත් 70,132 ක්, අත් පත්‍රිකා පිටපත් 363,600 ක්, පෝස්ටර් පිටපත් 25,100 ක් සහ බීජ ලේබල් 130,000 ක් නිර්මාණය කර ප්‍රකාශයට පත් කරන ලදී.
- ප්‍රකාශන අලෙවියෙන් රුපියල් 2,996,037.00 ක ආදායමක් උපයා ඇත.
- කෘෂිකාර්මික පණිවිඩ කඩිනමින් මහජනයා වෙත සමීප කර ඔවුන්ගේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහාය වීම සඳහා ෆේස්බුක් පිටු 1,930 ක්, ට්විටර් (Twitter) පණිවිඩ 181 ක්, 'කෘෂි හවුල' ෆේස්බුක් සමූහයේ පෝස්ට් 618 ක් සහ ඉන්ස්ටග්‍රෑම් (Instagram) පෝස්ට් 254 ක් ලෙස කෘෂිකර්මයට අදාළ තොරතුරු, පුවත් සහ කෙටි චිත්‍රපට උඩුගත කරන ලදී.
- මහජන සේවා සැපයීම වැඩිදියුණු කිරීම, ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය, ඩිජිටල් තොරතුරු කළමනාකරණය සහ දත්ත මත පදනම් වූ තීරණ ගැනීම කෙරෙහි අවධානය යොමු කරමින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඩිජිටල් පරිවර්තනයට සහාය වීම සඳහා උසස් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) වැඩපිළිවෙළවල් ක්‍රියාත්මක කරන ලදී. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහ ASDA වෙබ් අඩවි ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂාවලින් නිතිපතා යාවත්කාලීන කරන ලද අතර, 'Tropical Agriculturist' වෙබ් අඩවිය සඟරා කලාප 21 ක් සහ පර්යේෂණ පත්‍රිකා 126 ක් ඇතුළත් වන පරිදි සංවර්ධනය කරන ලද අතර එය 2026 වසරේදී නැවත දියත් කිරීම සඳහා තවදුරටත් වැඩිදියුණු කරමින් පවතී. 1920 කෘෂිකර්ම උපදේශන සේවාවේ නිතර අසනු ලබන ප්‍රශ්න සහ පරිශීලක ප්‍රතිචාර මත පදනම්ව, කාලෝචිත කෘෂිකාර්මික තොරතුරු ව්‍යාප්ත කිරීමට සහ ගොවි සහභාගීත්වය ශක්තිමත් කිරීමට සමාජ මාධ්‍ය වේදිකා ඵලදායී ලෙස භාවිතා කරන ලදී.
- ස්ථාන මාරු කළමනාකරණ පද්ධතිය, පාසැල් කළමනාකරණ පද්ධතිය, නිල විද්‍යුත් තැපැල් කළමනාකරණ පද්ධතිය සහ අන්තර්ජාල බීජ වෙළඳපොළ ඇතුළු දත්ත පද්ධති මත පදනම් වූ කළමනාකරණ තොරතුරු පද්ධති කිහිපයක් සංවර්ධනය කර කළමනාකරණය කරන ලදී. මෙහෙයුම් පද්ධතිවලට අමතරව තවත් පද්ධති කිහිපයක් පරිශීලක ප්‍රතිග්‍රහණ පරීක්ෂණ (User Acceptance Testing) මට්ටමේ පවතී. දෘඩාංග අලුත්වැඩියා කළමනාකරණ පද්ධතිය සහ මානව

සම්පත් කළමනාකරණ පද්ධතිය වැනි අභ්‍යන්තර පද්ධති ආරම්භ කරන ලද අතර Key platforms අඛණ්ඩව වැඩිදියුණු කරමින් පවතී.

- ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය , ගොවිකම් සඟරාව අන්තර්ජාල සංස්කරණය සහ අනෙකුත් ඊ-ඉගෙනුම් (e-learning) සහ ඩිජිටල් ප්‍රකාශන වේදිකා 2026 වසරේදී අවසන් කිරීමට අපේක්ෂිතව ක්‍රියාත්මක වෙමින් පවතින වැඩපිළිවෙළවල් වේ. ප්‍රධාන ජංගම යෙදවුම් (Mobile apps) පවත්වාගෙන යමින් වැඩිදියුණු කරන ලදී: අන්තර්ජාලය පදනම් කරගත් පළිබෝධ නිරීක්ෂණ දත්ත රැස්කිරීමේ යෙදවුමක් හඳුන්වා දුන් අතර, පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීය කිරීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් සකස් කරන ලදී. ඒ සඳහා දකුණු කොරියාවේ KAPEX ආයතනයේ අනුමැතිය හිමි විය.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තු පද්ධති සඳහා ක්ලවුඩ් හොස්ටින් සේවාව සහ නිල විද්‍යුත් තැපැල් සේවා සපයන ලද අතර, 2026 දී ලංකා රජයේ ක්ලවුඩ් හොස්ටින් සේවාව වෙත සංක්‍රමණය වීමට සැලසුම් කර ඇත. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය මගින් දෘඩාංග නඩත්තුව, ජාල සහය සහ උපාධි අපේක්ෂකයින් හා ඩිප්ලෝමා සිසුන් සඳහා ව්‍යාපෘති පාදක පුහුණුව ලබා දුන් අතර, 2025 වසරේදී සිසුන් 20 කට වැඩි පිරිසක් පුහුණුව නිම කළහ.
- ගන්නෝරුව සහ බටඅත කෘෂි තාක්ෂණික උද්‍යාන වෙත පැමිණි දේශීය නරඹන්නන් 106,866 ක් සහ විදේශීය නරඹන්නන් 1,361 ක් මගින් රුපියල් 14,365,484.83 ක ආදායමක් උපයා ඇත.
- මෙය කෘෂිකාර්මික නිෂ්පාදන පරිවර්තනය කිරීමට පහසුකම් සලසන අතර, කෘෂි නිෂ්පාදකයින්, සකස් කරන්නන්, යෙදවුම් සපයන්නන්, ව්‍යාපාරික සේවා සපයන්නන්, රජයේ ආයතන, පර්යේෂණ ආයතන සහ පුහුණු මධ්‍යස්ථාන අතර ඒකාබද්ධතාවය සහ සහයෝගීතාවය ගොඩනැගීමට උපකාරී වේ.
- පසු අස්වනු තාක්ෂණ ඒකකයේ ඉදිකිරීම් අවසන් කරන ලද අතර නව ටිකට් පත් කවුන්ටරයක් විවෘත කරන ලදී. මීට අමතරව, තාක්ෂණික දැනුම ව්‍යාප්ත කිරීම සඳහා බටඅත කෘෂි උද්‍යානයේ ගෘහයක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.
- ප්‍රදර්ශන තුනක් පවත්වන ලද අතර, කෘෂිකාර්මික තාක්ෂණයන් මහජනයාට සජීවී නිරූපණය කිරීම සඳහා විශේෂ ක්‍රියාකාරී වැඩසටහන් 04 ක් සමඟ ප්‍රදර්ශන ස්ථාන 04 ක් සැලසුම් කර සකස් කරන ලදී.
- ශ්‍රී ලංකාවේ ගොවි ප්‍රජාවගේ දෛනික කෘෂිකාර්මික ගැටලු විසඳීම සඳහා 1920 ගොවි උපදේශක සේවාව හරහා විමසීම් 59,209 කට ද, තැපැල හරහා 88 කට සහ විද්‍යුත් තැපැල හරහා 78 කට පිළිතුරු ලබා දෙන ලදී.
- බෝග වගාව සම්බන්ධයෙන් ලියාපදිංචි ගොවීන් වෙත භාෂා දෙකෙන්ම යවන ලද කෙටි පණිවිඩ (SMS) සංඛ්‍යාව 328,876 කි.
- විවිධ මාධ්‍යවලින් (පොත්, පත්‍රිකා, සඟරා, පෝස්ටර්, පුවත්පත් ලිපි, වෙබ් ලිපි, වීඩියෝ වැඩසටහන්, ශ්‍රව්‍ය වැඩසටහන් ආදිය) සමන්විත බෝග තොරතුරු ඇතුළත් "කෘෂි ඊ-පුස්තකාලය" (Krushi E-Library), සෙවීමේ පහසුකම් (Search facility) සහිත Web platform පහසුකමක් ලෙස සංවර්ධනය කර ඇත.
- ජනමාධ්‍ය භාවිතය සඳහා වීඩියෝ අන්තර්ගතයන් සහ කෙටි ගුවන්විදුලි වැඩසටහන් නිෂ්පාදනය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් කෘෂිකාර්මික සන්නිවේදනයේ මාධ්‍ය

සම්බන්ධීකාරකවරුන්ගේ කාර්යභාරය ශක්තිමත් කිරීම සඳහා දින දෙකක ප්‍රායෝගික වැඩමුළුවක් පවත්වන ලදී. මීට අමතරව, ක්ෂේත්‍ර මට්ටමේ තොරතුරු කඩිනමින් රැස් කිරීම සහ ඒවා කාලීනව මහජනයා වෙත බෙදා හැරීම පහසු කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තු ආයතන, පළාත් දෙපාර්තමේන්තු සහ මහවැලි නිලධාරීන්ගෙන් සැදුම්ලත් "Krushi MedCo" WhatsApp සමූහය 2025 ජූලි මාසයේදී පිහිටුවන ලදී.

- තොරතුරු දැනගැනීමේ අයිතිය (RTI) පිළිබඳ විධිවිධාන, විනිවිදභාවය, වගවීම සහ අල්ලස හා දූෂණය වැළැක්වීම පිළිබඳ දැනුම ඉහළ නැංවීම සඳහා ජනමාධ්‍ය හා සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන් වෙනුවෙන් තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2025 නොවැම්බර් මාසයේදී පවත්වන ලදී.
- මාධ්‍ය නිෂ්පාදකයින්ගේ වෘත්තීය කුසලතා ඉහළ නැංවීමට සහ ජනමාධ්‍ය නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා මාධ්‍ය නිෂ්පාදකයින් 50 දෙනෙකු වෙනුවෙන් දින දෙකක මාධ්‍ය ධාරිතා වර්ධන සහ සංවර්ධන දැනුවත් කිරීමේ වැඩසටහනක් 2025 නොවැම්බර් මාසයේදී සංවිධානය කරන ලදී. මෙහිදී ජනප්‍රිය මාධ්‍ය වාර්තාකරුවෙකු වන ඩබ්ලිව්. එම්. ප්‍රසන්න චන්දන මහතා විසින් ඉතා වැදගත් දේශන සැසියක් පවත්වන ලදී.
- ශ්‍රී ලංකාවේ ගොවීන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් අතර CABI PlantwisePlus ඩිජිටල් මෙවලම් ප්‍රචලිත කිරීම සඳහා CABI ආයතනය සමඟ ඒකාබද්ධව 2025 ජූලි මාසයේදී වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. මෙම මූලාරම්භයේ කොටසක් ලෙස මහනුවර ඕක් රේ (Oak Ray) හෝටලයේදී ප්‍රධාන පුහුණු වැඩසටහනක් (Master Training Programme) පවත්වන ලදී. මෙම ඩිජිටල් මෙවලම් ඵලදායී ලෙස භාවිත කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා පත්‍රිකා, සටහන් පොත්, වීඩියෝ සහ පුහුණු සැසි ඇතුළු විවිධ සන්නිවේදන ක්‍රම මඟින් ක්ෂේත්‍ර නිලධාරීන්, කෘෂිකර්ම ඩිප්ලෝමා සිසුන් සහ ගොවීන් වෙත තොරතුරු රැගෙන යන ලදී.

**<u>බීජ සහ රෝපණ ද්‍රව්‍ය සංවර්ධනය</u>**

- ‘දිට්වා’ සුළි කුණාටුවෙන් පසු දිවයින පුරා ගෙවතු වගා එළවළු බීජ පැකට් 245,210 ක් බෙදා හැරීම මඟින් ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව ඉහළ නංවන ලදී.
- සම්බන්ධීකරණය කරන ලද වැඩසටහනක් තුළින්, ගුණාත්මකභාවය සහතික කළ සහතික කළ වී බීජ නිෂ්පාදනය 18% දක්වා ඉහළ දමා ඇත. මෙම ජයග්‍රහණය පදනම් කරගනිමින්, 2025/26 මහ කන්නයේ සිට සහතික කළ වී බීජ නිෂ්පාදනය 25% දක්වා ඉහළ නැංවීමේ අරමුණින් විශේෂිත වැඩසටහනක් ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන 2028 යල කන්නය දක්වා ක්‍රියාත්මක වේ. මෙය පුනරුදයට අරුනළු ඇග්‍රි + ජාතික වැඩපිළිවෙළට සමගාමීව, අන්තර්-පළාත් සහ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු, මහවැලි අධිකාරිය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මෙන්ම පෞද්ගලික ගොවීන් සහ ගොවි සංවිධාන සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබයි. එමඟින් දිවයින පුරා සහතික කළ වී බීජ නිෂ්පාදනය සම්බන්ධීකරණයෙන් යුතුව සහ තිරසාර ලෙස ව්‍යාප්ත කිරීම සහතික කෙරේ.
- 2025 වසරේ මුළු ලියාපදිංචි වී බීජ නිෂ්පාදනය බුසල් 133,500 ක් දක්වා ළඟා වූ අතර එය ජාතික අවශ්‍යතාවයෙන් 82% ක් පමණ සපුරාලීමකි.

- ජාතික සහල් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා පුනරුදයට අරුනළු ඇග්‍රි + වැඩපිළිවෙළ යටතේ ක්‍රියාත්මක කරන ලද "යාය 500 වැඩසටහන" සඳහා වී බීජ ලබා දීම වසර තුළ ලැබූ තවත් සුවිශේෂී ජයග්‍රහණයකි.
- 'දිට්වා' ගංවතුරෙන් විනාශ වූ කුඹුරු ප්‍රතිවගා කිරීම සඳහා අවශ්‍ය වී බීජ සැපයීම සම්බන්ධීකරණය කරන ලද අතර එමගින් වගා කටයුතු නියමිත වේලාවට යථා තත්ත්වයට පත් කිරීම තහවුරු කරන ලදී.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු එක්ව සීතා එළිය බීජ ගබඩා සංකීර්ණයේ ඇති සීත ගබඩා පහසුකම තුළ ගොවීන් විසින් නිෂ්පාදනය කරන ලද බීජ මෙට්‍රික් ටොන් 150 ක් ගබඩා කරන ලදී.
- 2025 වසරේදී සීතා එළිය හරිතාගාර සංකීර්ණය එහි ඉහළම නිෂ්පාදනය වාර්තා කළ අතර එහිදී මුළු බීජ අල ආකන්ද මිලියන 3.49ක් නිෂ්පාදනය කරන ලදී.
- KOPIA ව්‍යාපෘතිය යටතේ දෙමුහුන් මිරිස් නිෂ්පාදනය සඳහා ආරක්ෂිත ගෘහ (Polytunnels) 20ක් ඉදිකරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස 2025 වසරේදී දෙමුහුන් මිරිස් බීජ කිලෝග්‍රෑම් 280කට වඩා නිෂ්පාදනය කළ අතර ඉන් කිලෝග්‍රෑම් 200ක් KOPIA මිරිස් ප්‍රවර්ධන වැඩසටහනේ කටයුතු සඳහා නිකුත් කරන ලදී.
- 2025 අතරමැදි කන්නයේදී මුං ඇට බීජ කිලෝග්‍රෑම් 98,000 ක් පමණ නිකුත් කරමින් සුවිශේෂී ජයග්‍රහණයක් වාර්තා කළ අතර එය පෙර වසරේ සැපයුමට වඩා දෙගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයකි.
- රටකජු බෝග නායක වැඩසටහන යටතේ ගොවීන් සමඟ එක්ව බීජ ගුණනය සඳහා ජම්බෝ පීනට් මූලික බීජ (ANKG 2) සාර්ථකව සපයන ලදී.

**<u>බීජ සහතික කිරීම සහ ශාක ආරක්ෂණය</u>**

***බීජ සහ රෝපණ ද්‍රව්‍ය සහතික කිරීම***

- 2018 සිට 2025 දක්වා කාලය තුළ වාර්තා වූ වැඩිම වාර්ෂික සාම්පල පරීක්ෂා කරන ලද බීජ වී ප්‍රමාණය 2025 වසරේදී වාර්තා වූ අතර එම ප්‍රමාණය මෙට්‍රික් ටොන් 17,767කි.
- 2022 වසරේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් පැල 752,514 දක්වා පහත වැටුණු ලේබල් කරන ලද පළතුරු පැල ප්‍රමාණය, 2025 වසරේදී 948,292 දක්වා වැඩි වී ඇත.
- බීජ වෙළඳපොළේ ඇති බීජ පැකට් සියල්ලම පාහේ 2003 අංක 22 දර බීජ පනත යටතේ අනුමත කරන ලද ලේබල් භාවිතා කරයි.
- 2003 අංක 22 දරන බීජ පනත යටතේ ලැබී පරීක්ෂණ පවත්වන ලද පැමිණිලි 42ක් අතරින්, තහවුරු වූ පැමිණිලි දෙකකට අදාළව පීඩාවට පත් ගොවීන් වෙත රුපියල් 7,240,000.00 ක වන්දි මුදලක් ගෙවීමට නියෝග කරන ලදී.

***ශාක ආරක්ෂණය***

- 2025 යල කන්නයේදී බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ කුඹුරු ආශ්‍රිතව මීයන් මර්දනය කිරීම සඳහා තාක්ෂණික සහාය ලබා දෙන ලදී.

- ජාතික පළිබෝධ නිරීක්ෂණ පද්ධතියේ (NPSS) නවීකරණය කරන ලද ජංගම යෙදුම (App) දිස්ත්‍රික්ක 12ක් සඳහා හඳුන්වා දෙන ලදී.
- දිවයින පුරා පැතිරී සිටින කොමඩු මැස්සන් (Melon fly) සහ පළතුරු මැස්සන් (Fruit fly) විශේෂ සහ ඔවුන්ගේ ව්‍යාප්ති රටාව හඳුනා ගන්නා ලදී.
- ව්‍යාප්ත වන ආක්‍රමණශීලී ආගන්තුක ශාක (IAS) පිළිබඳව ව්‍යාප්ති නිලධාරීන් දැනුවත් කිරීමට සහ ශ්‍රී ලංකාව තුළ ඒවායේ පැතිරීම හඳුනාගෙන සිතියම්ගත කිරීමට දැනුවත් කිරීමේ වැඩසටහන් 6ක් සහ සිතියම්ගත කිරීමේ වැඩසටහන් 6ක් සාර්ථකව පවත්වන ලදී.
- බෝම්බුවල, හංසයාපාලම, මහකනදරාව සහ රාජාංගනය යන ප්‍රදේශවල ජෛව පාලක අභිජනන මධ්‍යස්ථාන 10ක් ස්ථාපිත කරන ලදී.
- ප්‍රධාන බඩඉරිඟු වගා කරන ප්‍රදේශවල සේනා දළඹුවාගේ (Fall armyworm) ස්වභාවික සතුරන් 11 දෙනෙකු හඳුනා ගන්නා ලදී.
- 1999 අංක 35 දරන ශාක ආරක්ෂණ පනත යටතේ බලයලත් නිලධාරීන් 200 දෙනෙකු නම් කරන ලදී.

**පළිබෝධනාශක නියාමනය**

- අනුමත වර්ගීකරණයන් යටතේ පළිබෝධනාශක නිෂ්පාදන 31ක් (කෘෂි රසායනික ද්‍රව්‍ය 10ක් සහ අනෙකුත් 21ක්) අලුතින් ලියාපදිංචි කරන ලදී. මෙම නව ලියාපදිංචි නිෂ්පාදන සඳහා නව ක්‍රියාකාරී ද්‍රව්‍ය, දැනටමත් ලියාපදිංචි විවිධ මූලාශ්‍රවලින් ලබාගත් ක්‍රියාකාරී ද්‍රව්‍ය සහ කාලය ඉකුත් වූ නිෂ්පාදන නව ලියාපදිංචි කිරීම් ඇතුළත් විය.
- කෘෂිකාර්මික, ගෘහස්ථ මහජන සෞඛ්‍ය සහ කාර්මික පළිබෝධනාශක ඇතුළු පළිබෝධනාශක නිෂ්පාදන 200ක් ලියාපදිංචි කර බලපත්‍ර ලබා දෙන ලදී.
- නව පළිබෝධනාශක අලෙවි සැල් 195කට බලපත්‍ර ලබා දුන් අතර පළිබෝධනාශක අලෙවි සැල් බලපත්‍ර 1,733ක් අලුත් කරන ලදී.
- කෘෂි රසායනික අලෙවි සහ තාක්ෂණික සහායකයින් 470 දෙනෙකු සඳහා පුහුණුව ලබා දුන් අතර ඉන් 305 දෙනෙකු සඳහා සහතික පත්‍ර පිරිනමන ලදී.
- 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනතට අනුකූලව නව පළිබෝධ පාලන සේවා සපයන්නන් 15 දෙනෙකු ලියාපදිංචි කරන ලද අතර දැනට සිටින පළිබෝධ පාලන සේවා සපයන්නන් 76 දෙනෙකුගේ බලපත්‍ර අලුත් කරන ලදී.
- නීතිවිරෝධී පළිබෝධනාශක සම්බන්ධ උල්ලංඝනය කිරීම්වලට එරෙහිව පරීක්ෂණ/වැටලීම් හතළිස් පහක් (45) සිදු කරන ලද අතර නීතිමය ක්‍රියාමාර්ග 8ක් ආරම්භ කරන ලදී.
- ඩ්‍රෝන/ නියමුවන් රහිත ගුවන් යානා (UAS) තාක්ෂණය භාවිතයෙන් කෘෂිකාර්මික යෙදවුම් භාවිතාව සඳහා වන මාර්ගෝපදේශ යාවත්කාලීන කරන ලද අතර වී සහ බඩඉරිඟු වගාව සඳහා තාවකාලික පළිබෝධනාශක නිර්දේශ නිකුත් කරන ලදී.
- පළිබෝධනාශක ආනයන බලපත්‍ර 973ක් නිකුත් කරන ලදී.
- ගෝවා වගාවේ පූර්ව අස්වනු කාල පරතර (Pre-harvest intervals) තීරණය කිරීම සඳහා පළිබෝධනාශක නිෂ්පාදන දහයක් (10) ඇගයීමට ලක් කරන ලදී.

- පළිබෝධනාශක අත්පොතෙහි (Pesticide Manual) එළවළු බෝග කොටස පරිවර්තනය කර, යාවත්කාලීන කර ප්‍රකාශයට පත් කරන ලදී.

**පැළෑටි ජාන සම්පත් සංරක්ෂණය**

- ක්ෂේත්‍ර ගවේෂණ මෙහෙයුම් සහ විවිධ පර්යේෂණ ආයතන සමඟ සහයෝගීතාවයෙන් බෝග එකතුන් (Accessions) සහ ඒවායේ වල් දර්ශක 473ක් එකතු කරන ලදී.
- 2025 වසරේදී නව එකතුන් 228ක් ජාන බැංකුවේ සංරක්ෂණය කරන ලද අතර, ඒ අනුව 2025 වසර අවසානය වන විට ජාන බැංකුවේ මුළු එකතුන් 17,770ක් දක්වා ඉහළ ගොස් ඇත.
- නලස්ථව (*In vitro*) සංරක්ෂණය කරන ලද සාම්පල 421ක් මන්දගාමී වර්ධන තත්ත්වයන් යටතේ පවත්වාගෙන ගොස් ඇත. මීට බතල එකතුන් 132ක්, අර්තාපල් එකතුන් 25ක්, දේශීය අල වර්ග 217ක්, ඉන්නල එකතුන් 26ක් සහ කෙසෙල් එකතුන් 21ක් ඇතුළත් වේ.
- කෘෂිකාර්මික පර්යේෂණ සහ ආහාර සුරක්ෂිතතාව සඳහා ශාක ජාන සම්පත් තිරසාර ලෙස කළමනාකරණය කිරීමට සහ භාවිත කිරීමට සක්‍රීයව දායක වීමේ අරමුණින් ඉල්ලීම් මත විවිධ බෝග නියෝජනය කරන එකතුන් 697ක් පර්යේෂකයන්, ගොවීන් සහ විශ්වවිද්‍යාල වෙත බෙදා දෙන ලදී.
- ජාන සම්පත් පිළිබඳ පර්යේෂණ පත්‍රිකා හතක් විවිධ විද්‍යාත්මක සඟරාවල ප්‍රකාශයට පත් කරන ලදී.
- MICH-HY1 දෙමුහුන් මිරිස් වර්ගය සඳහා අණුක මට්ටමේ (Molecular level) දෙමුහුන් බව පරීක්ෂා කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.

**ශාක නිරෝධායනය**

- කොළඹ වරාය පරිශ්‍රයේ පිහිටි ගොඩනැගිල්ලේදී නිරෝධායන සාම්පල පරීක්ෂණ කටයුතු ක්‍රියාත්මක කරන ලදී.
- කොළඹ වරාය සහ කටුනායක ගුවන් තොටුපළ සඳහා නව රසායනාගාර උපකරණ මිලදී ගත් අතර රසායනාගාර කටයුතු ආරම්භ කරන ලදී.
- කන්කසන්තුරේ වරාය පරිශ්‍රය තුළ (බෝට්ටු සේවා සඳහා) ස්ථාපිත කර ඇති ශාක නිරෝධායන ඒකකයේ නිරෝධායන කටයුතු සිදු කරන ලදී.
- ශාක නිරෝධායන කටයුතු පිළිබඳව නිලධාරීන්, ආනයනකරුවන්, අපනයනකරුවන් සහ ධූමකරණ (Fumigation) සේවකයින් පුහුණු කරන ලදී.
- ශාක නිරෝධායන සේවාවට අදාළ සේවාවන් ස්වයංක්‍රීය කිරීම (ශාක නිරෝධායන තොරතුරු සහ කළමනාකරණ පද්ධතිය - PQIMS) ආරම්භ කර සමාලෝචනය කරන ලදී.
- යුරෝපා සංගමයේ රටවල් 27ක් ඇතුළුව රටවල් 36ක් සඳහා විද්‍යුත් උද්භිද ස්වස්ථතා සහතික (e-Phyto) නිකුත් කරන ලදී.
- ශාක නිරෝධායන සේවාවන්ට අදාළ ගාස්තු එකතු කිරීම සඳහා "විද්‍යුත් ගෙවීම්" (e-Payment) ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී.

- JICA ව්‍යාපෘතිය සහ ජපාන ව්‍යාපෘති නොවන ආධාර ව්‍යාපෘතිය යටතේ ජාතික ශාක නිරෝධායන රසායනාගාර, ශාක නිරෝධායන ඒකක සහ විමධ්‍යගත නිරෝධායන ඒකක සඳහා රසායනාගාර සහ අනෙකුත් උපකරණ ලබා ගන්නා ලදී.
- UNIDO ආධාර ඇතිව ජාතික ශාක නිරෝධායන සේවාව සහ ඇතුළුවීමේ ස්ථාන සඳහා රසායනාගාර ප්‍රතීතනය සහ පරීක්ෂණ ප්‍රතීතනය (Laboratory and Inspection accreditation) සඳහා අයදුම් කරන ලදී. එහිදී පරීක්ෂණ ප්‍රතීතනයට අදාළ පූර්ව ඇගයීම අවසන් කර ඇත.
- ශ්‍රී ලංකාවේ එළවළු, පළතුරු සහ අනෙකුත් නිෂ්පාදන සඳහා නව වෙළඳපොළවල් විවෘත කර ඇත.
  - චීනයට අන්නාසි, කෙසෙල්, කුරුඳු සහ කොප්පරා අපනයනය කිරීම.
  - චීනයට සහ දකුණු කොරියාවට අඹ අපනයනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කරමින් පවතී.
- 1999 අංක 35 දරන ශාක ආරක්ෂණ පනත සඳහා වන රෙගුලාසි සකස් කර නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත.
- 2025 වසරේ ඕස්ට්‍රේලියානු දූමකරණ ප්‍රතීතන යෝජනා ක්‍රමයේ (AFAS) ඒකාබද්ධ පද්ධති සමාලෝචනය (JSR) සාර්ථකව අවසන් කරන ලදී.
- ශ්‍රී ලංකාවේ නිරෝධායන සහ නැව්ගත කිරීමට පෙර කටයුතු සඳහා මීතයිල් බ්‍රෝමයිඩ් (MeBr) භාවිතය අවම කිරීමේ අරමුණින් කප්‍රා කුරුමිණියා (Khapra beetle) හඳුනාගැනීමේ සමීක්ෂණයක් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික ශාක නිරෝධායන සේවාව සහ ජාතික ඕසෝන් ඒකකය අතර අවබෝධතා ගිවිසුමක් (MOU) අත්සන් කරන ලදී.
- TJC නැවුම් අඹ ජපානයට අපනයනය කිරීම සඳහා පනවා ඇති තහනම ඉවත් කරවා ගැනීම සඳහා වාෂ්ප තාප විෂබීජ නාශක ප්‍රතිකාර (Vapor heat disinfestation treatments) සංවර්ධනය කිරීම සම්බන්ධ පර්යේෂණ කටයුතු 11ක් අවසන් කරන ලදී.
- ශ්‍රී ලංකාවේ ගබඩා කරන ලද ධාන්‍ය පලිබෝධ පාලනය සඳහා 'Quick PHIo-R phosphine' උත්පාදකය භාවිතයෙන් යොදන ඇලුමිනියම් පොස්පයිඩ් (77.5%) කැටවල සඵලතාවය පිළිබඳ අත්හදා බැලීම DTW සමාගම සමඟ සාර්ථකව අවසන් කර ඇති අතර, ඊට අදාළ නිර්දේශ නිකුත් කිරීමට සූදානම්ව පවතී.
- ජපානය වෙත යවනු ලබන තක්කාලි අපනයන තොග, කොළ කොඩවීමේ නව දිල්ලි වෛරසයෙන් තොර බව සහතික කිරීම සඳහා, (Tomato Leaf Curl New Delhi Virus - ToLCNDV) හඳුනාගැනීමේ සම්මත ක්‍රමවේදයක් (diagnostic protocol) සකස් කිරීමෙන් අනතුරුව ඒ සඳහා වන පරීක්ෂණ කටයුතු ආරම්භ කරන ලදී.
- ජාතික ශාක නිරෝධායන සේවාවේ ශාක ව්‍යාධිවේද අංශය මගින් සිදු කරන ලද පර්යේෂණ වෙනුවෙන් කෘෂිකාර්මික පර්යේෂණ විශිෂ්ටත්වය සඳහා වන ජාතික සම්මානයක් (National Award for Excellence in Agriculture Research) හිමි විය.

## අභියෝග

1. දේශගුණික විපර්යාස සහ පාරිසරික අභියෝග

- 2025 වසරේ අගභාගයේදී ඇති වූ අහිතකර දේශගුණික තත්ත්වයන් හේතුවෙන් බීජ නිෂ්පාදනය ප්‍රමාද වීම මගින් 2025 යල කන්නයේ බීජ නිෂ්පාදන වැඩසටහන් නියමිත වේලාවට අවසන් කිරීමට බාධා එල්ල වීම.
- පුරෝකථනය කළ නොහැකි අත්‍යන්ත (Extreme) කාලගුණික තත්වයන් (අක්‍රමවත් වර්ෂාපතනය, දිගු කාලීන නියඟය, ගං වතුර, අධික උෂ්ණත්වය) හේතුවෙන් බිම් සකස් කිරීම, වගා කාලසටහන්, බෝග වර්ධනය, අස්වනු නෙලීම සහ ක්ෂේත්‍ර පරීක්ෂණ අඩාල වීම.
- අඛණ්ඩව වගා කිරීම සහ ප්‍රමාණවත් පාංශු ප්‍රතිසංස්කරණ පියවර නොගැනීම හේතුවෙන් පසෙහි ගුණාත්මකභාවය පිරිහීම සහ පාංශු සාරවත්භාවය අඩුවීම.
- ජලයේ ගුණාත්මකභාවය පිරිහීම.
- බෝග නිෂ්පාදන පද්ධතිවල ජල ඵලදායිතාව අඩුවීම.

2. බීජ නිෂ්පාදන සහ ගුණාත්මකභාවය සහතික කිරීමේ බාධාවන්

- දේශගුණික බාධා හේතුවෙන් බීජ වියලීම, සැකසීම සහ බීජ පරීක්ෂා කිරීම ප්‍රමාද වීම නියමිත වේලාවට බීජ ලබා ගැනීමේ හැකියාවට බලපෑමක් ඇති කිරීම.
- වල් වී ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වීම මගින් කුඹුරු දූෂණය වීම, ජානමය පාරිශුද්ධතාවය අඩුවීම, බීජ ප්‍රතික්ෂේප වීමේ අනුපාතය ඉහළ යාම සහ ජාතික බීජ ඉලක්කවලට බාධා පැමිණීම.
- වන සතුන් විසින් වගාවන්ට සහ අස්වැන්න නෙළන ලද බීජවලට හානි කිරීම මගින් ප්‍රමාණාත්මක සහ ගුණාත්මක පාඩු සිදු වීම.
- එළවළු සහ පලතුරු අපනයනය සඳහා අවශ්‍ය සහතික කළ ක්ෂේත්‍ර ප්‍රමාණවත් නොවීම.
- බෝග වැඩි දියුණු කිරීමේ වැඩසටහන් සඳහා ජාන ප්ලාස්ම (germplasms) ලබා ගැනීමේ හැකියාව ප්‍රමාණවත් නොවීම.

3. මානව සම්පත් සහ ධාරිතාමය බාධාවන්

- නිලධාරී පුරප්පාඩු සහ තාක්ෂණික කාර්ය මණ්ඩලයේ හා කම්කරු හිඟය හේතුවෙන් පර්යේෂණ, ක්ෂේත්‍ර කටයුතු සහ දත්ත කළමනාකරණයට බලපෑම් ඇති වීම.
- පාංශු සමීක්ෂකයන් සහ සහායක කාර්ය මණ්ඩලයේ හිඟය හේතුවෙන් ඉඩම් මැනුම් සහ ගොවිපළ සංවර්ධන සැලසුම් ප්‍රමාද වීම.
- බීජ තාක්ෂණය, කෘමි විද්‍යාව, ව්‍යාධිවේදය, විෂ විද්‍යාව, උසස් රසායනාගාර ශිල්පීය ක්‍රම, අණුක අභිජනනය, ජාන විද්‍යාව සහ නැගී එන තාක්ෂණයන් පිළිබඳ විශේෂිත පුහුණුව සඳහා ඇති ප්‍රවේශය සීමිත වීම.
- ගොවීන් සහ නිලධාරීන් තුළ වෙනස්කම්වලට ඇති අකමැත්ත හේතුවෙන් ඵලදායී තාක්ෂණ හුවමාරුවට බාධා ඇති වීම.
- කෘෂි සංචාරක කර්මාන්තය සහ භූ දර්ශන නිර්මාණය (Landscaping) වැනි විශේෂිත ක්ෂේත්‍රයන්හි තාක්ෂණික දැනුම නොමැතිවීම.

- ශාක නිරෝධායන ඒකක සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) නිලධාරීන්ගේ සහ පුහුණු පිරිස්වල හිඟය.
- මධ්‍යම රජය විසින් නවාතැන්, ආහාර සහ දීමනා ලබා නොදීම හේතුවෙන් NVQ 04 මට්ටමේ පාඨමාලා හැදෑරීමට කැමැත්තෙන් සිටින පාසල් හැරගිය සිසුන්ට අහිතකර ලෙස බලපෑම් ඇති වීම.
- බාහිර ආයතනවලින් පහසුකම් සඳහා ඇති ඉහළ යමින් පවතින ඉල්ලීම් හේතුවෙන් සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ දෙපාර්තමේන්තු පුහුණු වැඩසටහන් ඵලදායී ලෙස පවත්වාගෙන යාමට බාධා එල්ල වීම.

4. යටිතල පහසුකම්, පහසුකම් සහ සැපයුම් ක්‍රමවේද

- රසායනාගාර නිසි ලෙස නඩත්තු නොකිරීම, කාර්යාල, නවාතැන් සහ උසස් විශ්ලේෂණ උපකරණ සීමිත වීම ඇතුළුව පහසුකම් ප්‍රමාණවත් පරිදි නොතිබීම.
- පර්යේෂණ ක්ෂේත්‍ර සඳහා ප්‍රමාණවත් පරිදි සහ අඛණ්ඩව ජල සැපයුම නොලැබීම, වසර පුරා පවතින වාරි පහසුකම් සහ ආරක්ෂිත පානීය ජලය නොමැතිකම. (උදා: ගිරාඳුරුකෝට්ටේ පර්යේෂණ මධ්‍යස්ථානයේ පවතින කිවුල් ජලය)
- දිවයින පුරා සිදුකරන පරීක්ෂණ, පැළ තවාන් ලියාපදිංචි කිරීම්, බීජ පරිග්‍ර පරීක්ෂා කිරීම්, බීජ සාම්පල ප්‍රවාහනය සහ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (SL-GAP) විගණන කටයුතු සඳහා ප්‍රවාහන පහසුකම් ප්‍රමාණවත් නොවීම.
- ඩිජිටල් මෙවලම්වල දියුණුවක් පැවතියද, "දිට්වා" වැනි හදිසි අවස්ථාවන්හිදී කාලෝචිත සහ අඛණ්ඩ දත්ත රැස් කිරීම තවමත් ප්‍රධාන අභියෝගයක්ව පැවතීම.
- ප්‍රාදේශීය මධ්‍යස්ථානවල සහ ශාක නිරෝධායන ඒකකවල අන්තර්ජාල පහසුකම් ප්‍රමාණවත් නොවීම ඇතුළු සන්නිවේදන ගැටළු.
- ගම් මට්ටමින් යෙදවුම් සැපයුම් යාන්ත්‍රණයක් නොමැතිකම.
- ගම් මට්ටමින් ගොවි ප්‍රජාවගේ දුර්වල සංවිධානාත්මක භාවය.
- බෝග නිෂ්පාදනය සඳහා යොදාගත හැකි ඉඩම් සීමිත වීම.
- අවිධිමත් ණය ක්‍රමවල පවතින විෂම චක්‍රය.
- සැකසුම් පහසුකම් සහ කෘෂි පාදක කර්මාන්ත ප්‍රමාණවත් නොවීම.

5. මූල්‍ය සහ ප්‍රතිපාදන සීමාවන්

- ක්ෂේත්‍ර අත්හදා බැලීම්, රසායනාගාර විශ්ලේෂණ, දත්ත රැස් කිරීම, උපකරණ නඩත්තු සේවා සිදුකිරීම (Servicing) සහ රසායනික ද්‍රව්‍ය හා පරිභෝජන ද්‍රව්‍ය මිලදී ගැනීම වැනි අධික පිරිවැයක් සහිත පර්යේෂණ කටයුතු සඳහා ප්‍රමාණවත් අරමුදල් නොමැතිකම.
- ප්‍රමුඛතා පර්යේෂණ ඉලක්ක සහ උපායමාර්ගික අරමුණුවලට ගැළපෙන ව්‍යුහගත අරමුදල් යාන්ත්‍රණයක් නොමැතිකම.
- ගොවිපළ නඩත්තු කිරීම සහ ඉදිකිරීම් කටයුතු සඳහා පවතින මූල්‍ය බාධාවන්.
- පැළෑටි හා  ජාන සම්පත් මධ්‍යස්ථානය සඳහා වෙන් වූ පර්යේෂණ අයවැය ප්‍රතිපාදන නොමැතිකම හේතුවෙන්  අනුක ජීව විද්‍යා සහ උසස් පර්යේෂණ කටයුතු සීමා වීම.

- වසර 13 ක සහතික කළ අධ්‍යාපන වැඩසටහන යටතේ NVQ 04 මට්ටමේ පාඨමාලා හදාරන සිසුන්ට අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු ගෙවීම් සම්බන්ධ ප්‍රමාදයන් සහ ගැටලු.

6. පර්යේෂණ, නවෝත්පාදන සහ තාක්ෂණ සංවර්ධන අභියෝග

- ප්‍රමාණවත් නොවන යටිතල පහසුකම් සහ පුහුණු පිරිස් හිඟකම හේතුවෙන් අණුක අභිජනන මෙවලම් (Molecular breeding tools) සහ ජාන පහසුකම් භාවිතය සීමා වීම.
- වගා කරන බොහෝ එළවළු බෝගයන්හි ජානමය පදනම පටු වීම සහ හිතකර ශෂ්‍ය විද්‍යාත්මක ප්‍රතිරෝධී ලක්ෂණ සහිත විශිෂ්ට ජාන ප්ලාස්ම (Elite germplasms) ලබා ගැනීමේ හැකියාව සීමිත වීම.
- සංවර්ධනය කරන ලද තාක්ෂණයන් සහ නිෂ්පාදන වාණිජකරණය කිරීම සඳහා පැහැදිලි ප්‍රොටෝකෝල සහ නියාමන රාමු නොමැතිකම.
- ආහාර සහ ආහාර සුරක්ෂිතතාව සඳහා බලගැන්වූ රෙගුලාසි නොමැතිකම, එමඟින් යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) අනුගමනය කිරීම අවම වීම සහ එය සුරක්ෂිත ආහාර වැඩසටහන්වලට හා අපනයන අවස්ථාවලට බාධාවක් වීම.
- නියාමනය නොකළ සහ අධික විෂ සහිත කෘෂි රසායනික ද්‍රව්‍ය නීති විරෝධී ලෙස රට තුළට ඇතුල්වීම හේතුවෙන් උසස් තත්ත්වයේ ආහාර නිෂ්පාදනයට බාධා ඇති වීම.

7. ව්‍යාප්ති සේවා, තාක්ෂණ හුවමාරුව සහ තොරතුරු ප්‍රචාරණය

- ගම් මට්ටමින් නව තාක්ෂණයන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ හැකියාව ප්‍රමාණවත් නොවීම.
- නිර්දේශිත දියුණු තාක්ෂණයන් වෙත ගොවීන් අනුවර්තනය වීම අවම මට්ටමක පැවතීම.
- තාක්ෂණය අනුගමනය කිරීම පිළිබඳ කෙරෙන පර්යේෂණ සඳහා ව්‍යාප්ති නිලධාරීන්ගේ දායකත්වය සීමිත වීම.
- බිම් මට්ටමේ කෘෂිකාර්මික කටයුතුවල නියැලී සිටින ආයතන සහ නිලධාරීන් අතර පවතින සම්බන්ධීකරණය දුර්වල වීම.
- නවීන ව්‍යාප්ති මෙවලම් සහ ප්‍රවේශයන් සඳහා අඩු ප්‍රමුඛතාවයක් ලබා දීම.අදාල ක්ෂේත්‍රන්හි (කෘෂි සංචාරක කර්මාන්තය, භූ දර්ශන නිර්මාණය ආදිය) තාක්ෂණික දැනුම නොමැති වීම.

8. ගොවිපළ මට්ටමේ නිෂ්පාදන සහ යාන්ත්‍රිකකරණ බාධාවන්

- වර්ෂාපෝෂිත ගොඩබිම් වගා පද්ධතිවල ඵලදායීතාවය අඩු වීම සහ වගා කළ හැකි ඉඩම් නිසි ලෙස ප්‍රයෝජනයට නොගැනීම.
- ප්‍රමාණවත් නොවන ගොවිපළ යාන්ත්‍රිකකරණය සහ කුලියට ගැනීම්/ සැපයුම් යාන්ත්‍රණයක් නොමැතිකම.
- බෝග නිෂ්පාදනය සඳහා ඉඩම් ලබා ගැනීමේ සීමිත බව.
- ගම් මට්ටමේ යෙදවුම් සැපයුම් යාන්ත්‍රණයන් දුර්වලවීම.
- අධික නිෂ්පාදන පිරිවැය සහ අඩු ගොවිපළ මිල (Farm-gate prices) හේතුවෙන් ලාභදායිත්වය අඩු වීම.
- ගොවීන්ට බලපාන අවිධිමත් ණය ක්‍රමවල පවතින විෂම චක්‍රය.

9. අස්වනු නෙලීමෙන් පසු කාලය, සැකසීම සහ අගය දාම ගැටළු

- පරිහරණය, ගබඩා කිරීම සහ සැකසීමේ අනිසි පිළිවෙත් හේතුවෙන් අස්වනු නෙලීමෙන් පසු සිදුවන හානිය ඉහළ මට්ටමක පැවතීම.
- සැකසුම් පහසුකම් ප්‍රමාණවත් නොවීම සහ කෘෂි පාදක කර්මාන්ත සීමිත වීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන එළවළු සහ පලතුරු ඇසුරුම් මධ්‍යස්ථාන ඉතා අල්ප වීම.

10. ප්‍රතිපත්ති, සැලසුම් සහ වෙළඳාම සම්බන්ධ අභියෝග

- ජාතික බෝග නිෂ්පාදන සැලැස්ම නිසි ලෙස ක්‍රියාත්මක නොවීම.
- ආහාර ද්‍රව්‍ය ආනයනය සම්බන්ධයෙන් පවතින අස්ථාවර වෙළඳ ප්‍රතිපත්ති.
- අපනයනය ඉලක්ක කරගත් එළවළු සහ පලතුරු නිෂ්පාදනය සඳහා ප්‍රමාණවත් සහතික කළ ක්ෂේත්‍ර සහ නියාමන සහාය නොමැතිකම.
- සංවර්ධනය කරන ලද තාක්ෂණයන් සහ නිෂ්පාදන වාණිජකරණය කිරීම සඳහා පැහැදිලි ප්‍රොටෝකෝල සහ නියාමන රාමු නොමැතිකම.
- නියාමනය නොකළ කෘෂිකාර්මික රසායනික ද්‍රව්‍ය රට තුළට හොර රහසේ ගෙන ඒම හේතුවෙන් උසස් තත්ත්වයේ ආහාර නිෂ්පාදනයට බාධා ඇති වීම.

11. ආහාර සහ පෝෂණ සුරක්ෂිතතා ගැටළු

- ජාතික පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා අතිරේක ආහාර බෝග  පරිභෝජනය ප්‍රමාණවත් නොවීම.
- ආහාර සහ සත්ත්ව ආහාර සුරක්ෂිතතා රෙගුලාසි නොමැතිකම හේතුවෙන් යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) අනුගමනය කිරීම දුර්වල වීම සහ එමගින් ආහාර සහ සත්ත්ව ආහාර සුරක්ෂිතතා වැඩසටහන්, අපනයන අවස්ථා සහ විභවයන් අඩාල වීම.

## අනාගත ඉලක්ක

1. තිරසාර කෘෂිකාර්මික  නිෂ්පාදනය සහ ස්වයංපෝෂිතභාවය

- හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 7 ක් හෝ ඊට වැඩි ඉලක්කගත අස්වැන්නක් ලබා ගැනීම අරමුණු කර ගනිමින් වැඩිදියුණු කළ බෝග කළමනාකරණ පිළිවෙත් ක්‍රියාත්මක කිරීම හා තිරසාර වී වගාව සඳහා හොඳම කෘෂි විද්‍යාත්මක පිළිවෙත් අනුගමනය කිරීම මගින් තෝරාගත් යාය 500ක වී නිෂ්පාදනය සහ ඵලදායිතාව වැඩි දියුණු කිරීම හරහා සාමාන්‍ය ජාතික ඵලදායිතාව හෙක්ටයාරයකට ටොන් 4.2 දක්වා වැඩි කිරීමට දායක වීම.
- ජාතික ස්වයංපෝෂිතභාවය ළඟා කර ගැනීම සඳහා වැඩි දියුණු කළ ප්‍රභේද සහ ඒ හා බැඳුණු තාක්ෂණයන් මගින් තිරසාර නිෂ්පාදනය සහ ඵලදායිතාව ඉහළ නැංවීම.
- සියලුම බෝග අංශ තුළදේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන සහ තිරසාර කෘෂිකර්මාන්තයක් ප්‍රවර්ධනය කිරීම.

- විශේෂයෙන්ම උඩරට තෙත් කලාපයේ ඵලදායිතාව ඉහළ නංවාලීම සහ වෙළඳපල ඉලක්ක කරගත් දැඩි වගා පද්ධති තුළින් ගොවීන්ගේ ආදායම සහ ජීවනෝපාය වැඩිදියුණු කිරීම.
- කෘෂිකාර්මික නිෂ්පාදනවල ඵලදායිතාව, ගුණාත්මකභාවය සහ වසර පුරා පවතින බව සහතික කිරීම සඳහා පරිසර හිතකාමී තාක්ෂණයන් දියුණු කිරීම.
- 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලන පනතේ විධිවිධාන ඵලදායී ලෙස බලාත්මක කිරීම, ඊට අදාල සංශෝධනඇතුළත්කිරීම සහ QR කේත පද්ධතියක් හඳුන්වාදීම.
- පළිබෝධනාශක නිෂ්පාදන වෙළඳපොළට නිකුත් කිරීමට පෙර ඒවායේ ගුණාත්මකභාවය සහ අනුකූලතාවය සහතික කිරීම.
- ආරක්ෂිත සහ වගකීම් සහගත භාවිතය ප්‍රවර්ධනය කිරීමට සහ කෘෂිකාර්මික නිෂ්පාදන අපනයනය පහසු කිරීම සඳහා පළිබෝධනාශක සඳහා පූර්ව අස්වනු කාලාන්තර සහ උපරිම අවශේෂ මට්ටම් ස්ථාපිත (MRL) කිරීම.
- අතිශයින්ම අන්තරායකර පළිබෝධනාශක භාවිතය අවම කිරීම සඳහා ආරක්ෂිත සහ තිරසාර විකල්ප භාවිතය ප්‍රවර්ධනය කිරීම.
- ධාන්‍ය දූෂණයවීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, සහල්වල විෂ සහිත බැර ලෝහ අවශෝෂණය හා සමුච්චයවීම කෙරෙහි ඒකාන්තරතෙත් කිරීමේ හා වියලීමේ (AWD) ජල සම්පාදන ක්‍රමයේ බලපෑම තක්සේරු කිරීම.

2. බෝග වැඩිදියුණු කිරීම, ප්‍රභේදීය සංවර්ධනය සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

- වී වගාවෙන් ජාතික ස්වයංපෝෂිතභාවය ළඟා කර ගැනීම සඳහා අස්වනු ඵලදායිතාව ඉහළ නැංවීමට මෙන්ම තිරසාර වී වගාව ප්‍රවර්ධනය කිරීමට අදාළ පර්යේෂණ සහ අනෙකුත් සංවර්ධන කටයුතු සැලසුම් කිරීම හා පවත්වාගෙන යාම.
    - ඉහළ අස්වනු විභවයක් සහිත කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන වී ප්‍රභේද බිහි කිරීම.
    - නියඟය, ගංවතුර, ලවණ පස, යකඩ විෂ වීම සහ ඉහළ යන උෂ්ණත්වය වැනි ආන්තික පාරිසරික තත්ත්වයන්ට ඔරොත්තු දෙන වී ප්‍රභේද අභිජනනය කිරීම.
    - උසස් ගුණාත්මකභාවයෙන් යුත් සහල් ඇට සහිත වී ප්‍රභේද බිහි කිරීම.
    - පොහොරවලට ඉහළ ප්‍රතිචාරයක් දක්වන වී ප්‍රභේද බිහි කිරීම.
    - සහල් සන්නාමකරණය (Branding) සඳහා ව්‍යාපෘති සකස් කිරීම.
    - සහල් ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන සංවර්ධනය සඳහා සුදුසු වී ප්‍රභේද හඳුනා ගැනීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
    - ජෛව සහ අජෛව ආතතීන්ට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා නව ශෂ්‍ය විද්‍යාත්මක තාක්ෂණික පැකේජ සංවර්ධනය කිරීම.
    - ඒකාබද්ධ බිම් සකස් කිරීමේ සහ බෝග ස්ථාපිත කිරීමේ ක්‍රමවේද තවදුරටත් වැඩිදියුණු කිරීම.
    - වී වගාවෙන් පිටවන හරිතාගාර වායු විමෝචනය පිළිබඳ අධ්‍යයනයන් සිදු කිරීම සහ ඒවා අවම කිරීම සඳහා ශෂ්‍ය විද්‍යාත්මක වගා පිළිවෙත් හඳුනා ගැනීම.
| 92. උද්භිද ස්වස්ථතාව ආරක්ෂා කිරීම සහ විද්‍යුත් වාණිජ්‍යය (E-Commerce) හා සම්බන්ධ පලිබෝධ අවදානම අවම කිරීම සඳහා වූ නව IPPC මාර්ගෝපදේශය පිළිබඳ ධාරිතා වර්ධනය පිළිබඳ APPPC වැඩමුළුව | 01 | 10.11.2025 - 14.11.2025 | 53.38 | | විදේශීය | උද්භිද ස්වස්ථතා ආරක්ෂාව පිළිබඳ දැනුම |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද කාර්ය මණ්ඩල සංඛ්‍යාව | වැඩසටහනේ කාලය | මුළු ආයෝජනය (රු.'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| 93.ආහාර හා කෘෂිකර්මය සඳහා වූ ශාක ජාන සම්පත් පිළිබඳ FAO ජාත්‍යන්තර ගිවිසුමේ පාලක මණ්ඩලයේ එකොළොස්වන සැසියේ ඉහළ පෙළ | 01 | 22.11.2025 - 29.11.2025 | | | විදේශීය | ශාක ජානමය සම්පත් පිළිබඳ දැනුම බෙදාහදා ගැනීම |
| 94.ආසියාවේ තිරසාර, අන්තර්ගත සහ ප්‍රත්‍යස්ථ කෘෂිකර්මාන්තයක් සඳහා ඩිජිටල් තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම - නෙදර්ලන්තයේ උපදේශන සමීක්ෂණ චාරිකාව | 02 | 17.11.2025 - 22.11.2025 | 186.86 | | විදේශීය | තිරසාර, අන්තර්කරණය වූ සහ ඔරොත්තු දෙන කෘෂිකර්මාන්තයක් සඳහා ඩිජිටල් තාක්ෂණය පිළිබඳ දැනුම බෙදාහදා ගැනීම |
| 95.EIMA Agrimach ඉන්දියාව 2025 | 01 | 27.11.2025 - 29.11.2025 | | | විදේශීය | කෘෂිකර්මාන්තය පිළිබඳ දැනුම බෙදාහදා ගැනීම |
| 96.ඉන්දියානු තාක්ෂණ ආයතනයේ ඛාරග්පූර් (IIT - KGP) හි "කෘෂිකාර්මික තාක්ෂණයන්හි නැගී එන ප්‍රවණතා" පිළිබඳ 03 වන ජාත්‍යන්තර වැඩමුළුව | 01 | 30.11.2025 - 09.12.2025 | | | විදේශීය | කෘෂිකාර්මික තාක්ෂණයන්හි ප්‍රවණතා පිළිබඳ දැනුම |
| 97.තිරසාර කෘෂිකර්ම යාන්ත්‍රිකකරණය සඳහා වූ මධ්‍යස්ථානයේ (CSAM) පාලක සභාවේ 21 වන සැසිය සහ කෘෂි පාරිසරික සහ පුනර්ජනනීය කෘෂිකර්මාන්තය වෙත සංක්‍රමණය වීම පිළිබඳ 2025 ජාත්‍යන්තර වැඩමුළුව | 01 | 25.11.2025 - 27.11.2025 | 46.38 | | විදේශීය | කෘෂි විද්‍යාව සහ පුනර්ජනනීය කෘෂිකර්මාන්තය වෙත සංක්‍රමණය වීම පිළිබඳ දැනුම |
| 98.20 වන INWEPF මෙහෙයුම් කමිටු රැස්වීම සහ සම්මන්ත්‍රණය | 01 | 12.11.2025 - 14.11.2025 | | | විදේශීය | කෘෂිකර්මාන්තය පිළිබඳ දැනුම බෙදාහදා ගැනීම |
| 99.ඩිජිටල් කෘෂිකාර්මික නවෝත්පාදන ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා වූ 2025 ආරාධිත වැඩමුළුව | 07 | 09.11.2025 - 22.11.2025 | 698.21 | | විදේශීය | ඩිජිටල් කෘෂිකාර්මික නවෝත්පාදන ධාරිතාව ශක්තිමත් කිරීම පිළිබඳ දැනුම |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද කාර්ය මණ්ඩල සංඛ්‍යාව | වැඩසටහනේ කාලය | මුළු ආයෝජනය (රු.'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| 100.ආසියා පැසිෆික් HIH රටවල "ආයෝජන අවස්ථා හඳුනාගැනීමේ සිට මූල්‍ය-සූදානම් සංකල්ප ප්‍රවර්ධනය කිරීම දක්වා ආයෝජන විවෘත කිරීම" පිළිබඳ කලාපීය වැඩමුළුව | 01 | 03.12.2025 - 04.12.2025 | | | විදේශීය | මූල්‍ය පහසුකම් ප්‍රවර්ධනය කිරීමේ අවස්ථා පිළිබඳ දැනුම |
| 101.2025 ANTAM වාර්ෂික රැස්වීම | 01 | 09.12.2025 - 11.12.2025 | 43.15 | | විදේශීය | කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර පිළිබඳ දැනුම |
| 102."ආසියාවේ ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව සඳහා මෙනේරි වර්ගවල තිරසාර අගය දාම සංවර්ධනය පිළිබඳ ධාරිතාව ඉහළ නැංවීම" පිළිබඳ සමාප්ති වැඩමුළුව - ව්‍යාපෘති TCP/RAS/3909 | 01 | 03.12.2025 - 06.12.2025 | 30.90 | | විදේශීය | කුරක්කන්වල තිරසාර අගය දාම සංවර්ධනය පිළිබඳ දැනුම |
| 103.පශු වෛද්‍ය සහ උද්භිද ස්වස්ථතාව නිරීක්ෂණ සඳහා වන ෆෙඩරල් සේවය [Rosselkhoznadzor] | 03 | 14.12.2025 - 19.12.2025 | 170.20 | | විදේශීය | පශු වෛද්‍ය සහ උද්භිද ස්වස්ථතා නිරීක්ෂණ පිළිබඳ දැනුම |
| 104.ITEC පුහුණු වැඩසටහන: ඩිජිටල් අධ්‍යාපනික ශාස්ත්‍රය - හෙට දවස සඳහා අධ්‍යාපනඥයින් | 01 | 15.12.2025 - 21.12.2025 | | | විදේශීය | ඩිජිටල් අධ්‍යාපන ක්‍රමවේදය පිළිබඳ දැනුම |
| **දේශීය පුහුණු** | | | | | | |
| 105.ශාක ආරක්ෂණ ශිල්පීය ක්‍රම පිළිබඳ කෙටි පාඨමාලාව | 22 | 03.2025 to 05. 2025 | 550 | | දේශීය | ශාක ආරක්ෂණ ශිල්පීය ක්‍රම පිළිබඳ දැනුම |
| 106. නිවර්තන කෘෂිකාර්මික පුහුණු වැඩසටහන (CATAS) සඳහා නිලධාරීන් පහසුකම් සැලසීම සහ නම් කිරීම සඳහා වන ඉල්ලීම | 10 | 24.03.2025 - 30.03.2025 | | | දේශීය | නිවර්තන කෘෂිකර්මාන්තය පිළිබඳ දැනුම |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද කාර්ය මණ්ඩල සංඛ්‍යාව | වැඩසටහනේ කාලය | මුළු ආයෝජනය (රු.'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| 107"අපතේ යාමෙන් ඔබ්බට: වඩා හොඳ පෝෂණය සඳහා ආහාර, ජලය සහ බලශක්තිය ප්‍රශස්ත කිරීම" පිළිබඳ ඉහළ මට්ටමේ සමුළුව - පෝෂණ වර්ධනය වැඩිදියුණු කිරීම සඳහා වූ දකුණු ආසියානු ප්‍රතිපත්ති නායකත්වය (SAPLING) සමඟ | 02 | 18.06.2025 - 19.06.2025 | | | දේශීය | වඩා හොඳ පෝෂණය සඳහා ආහාර, ජලය සහ බලශක්තිය ප්‍රශස්ත කිරීම පිළිබඳ දැනුම |
| 108.ශ්‍රී ලංකාවේ පැවැත්වෙන C-SUCSeS ව්‍යාපෘතියේ ඉදිරි ප්‍රතිඵල ඉදිරිපත් කිරීම සහ ඉදිරි මග පිළිබඳ රැස්වීම සඳහා ජාතික නිහිය ලක්ෂ්‍යය සහ එක් විද්‍යාඥයෙකු නම් කිරීමේ ඉල්ලීම | 01 | 27.06.2025 - 28.06.2025 | | | දේශීය | C-SUCSeS ව්‍යාපෘතියේ ප්‍රතිඵල ඉදිරිපත් කිරීම |
| 109.ලෝක වෙළඳ සංවිධානයේ (WTO) ශ්‍රී ලංකාව පිළිබඳ 05 වන වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනය | 41 | 26.06.2025 | | | දේශීය | වෙළඳ ප්‍රතිපත්ති පිළිබඳ දැනුම |
| 110. කෘෂි වන වගා පුහුණුකරුවන් පුහුණු කිරීමේ (ToT) වැඩමුළුව සඳහා නිලධාරීන් නම් කිරීම. | 05 | 15.07.2025 - 17.07.2025 | | | දේශීය | කෘෂි වන වගාව පිළිබඳ දැනුම |
| 111.ඔරොත්තු දීමේ දත්ත සහ විශ්ලේෂණ සේවා (RDAS) පුහුණු සහ ප්‍රායෝගික ප්‍රජාව (COP) වැඩමුළුව සඳහා ආරාධනය | 02 | 15.07.2025 - 16.07.2025 | | | දේශීය | ඔරොත්තු දීමේ දත්ත සහ විශ්ලේෂණ සේවා පිළිබඳ දැනුම |
| 112.ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ (SLCARP) ධාරිතා වර්ධන වැඩසටහන: ආචාර්ය උපාධි පර්යේෂණ සොයාගැනීම් බෙදාහදා ගැනීම සහ ඉදිරි මග | 02 | 20.08.2025 | | | දේශීය | ආචාර්ය උපාධි පර්යේෂණ සොයාගැනීම් බෙදාහදා ගැනීම |
| 113.කොඩෙක්ස් (Codex) වැඩමුළුවට සහභාගී වීම සඳහා ආරාධනය | 04 | 09.09.2025 - 11.09.2025 | | | දේශීය | Codex පිළිබඳ දැනුම |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද කාර්ය මණ්ඩල සංඛ්‍යාව | වැඩසටහනේ කාලය | මුළු ආයෝජනය (රු.'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| 114.ඩ්‍රෝන නියමු බඳවා ගැනීම 17 (නියමුවෙකු රහිත ගුවන් යානා පද්ධති) පුහුණු වැඩසටහන | 10 | 2025 සැප්තැම්බර් (සති අන්ත) | | | දේශීය | ඩ්‍රෝන තාක්ෂණය පිළිබඳ දැනුම |
| 115."පර්යේෂණ යෝජනා ලිවීමේ කුසලතා ඉහළ නැංවීම" පිළිබඳ දෙදින වැඩමුළුව | 60 | | | | දේශීය | පර්යේෂණ යෝජනා ලිවීම පිළිබඳ දැනුම |
| 116.ශාක සහ ඒ ආශ්‍රිත නිෂ්පාදනවල ප්‍රති-ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරීත්වය නිස්සාරණය සහ පරීක්ෂා කිරීම පිළිබඳ වැඩමුළුව | 05 | 15.10.2025 - 17.10.2025 | 50 | | දේශීය | ශාක සහ ඒ ආශ්‍රිත නිෂ්පාදනවල ක්ෂුද්‍රජීවී නාශක ක්‍රියාකාරිත්වය නිස්සාරණය සහ පරීක්ෂා කිරීම පිළිබඳ දැනුම |
| 117. "පළිබෝධ අවදානම් ලේඛන වැඩමුළුව" සිව්දින නේවාසික වැඩමුළුව සඳහා සහභාගී වීමට ආරාධනය | 07 | 13.10.2025 - 16.10.2025 | | | දේශීය | පළිබෝධ අවදානම් ලේඛනය පිළිබඳ දැනුම |
| 118.පරිසර පද්ධති සේවා සඳහා ගෙවීම් පිළිබඳ ජාතික වැඩමුළුව | 01 | 15.10.2025 - 16.10.2025 | | | දේශීය | පරිසර පද්ධති සේවා සඳහා ගෙවීම් පිළිබඳ දැනුම |
| 119."ගෘහස්ථ හා ව්‍යුහගත පලිබෝධ පාලනය සහ පළිබෝධනාශක හැසිරවීම" පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 04 | 25.10.2025 සිට (දින 25-සැම සෙනසුරාදාම) | 100 | | දේශීය | ගෘහස්ථ හා ව්‍යුහාත්මක පළිබෝධ පාලනය සහ පළිබෝධනාශක හැසිරවීම පිළිබඳ දැනුම |
| 120. ජාතික පූර්ව ආපදා ක්‍රියාකාරී කණ්ඩායමේ සාමාජිකයින් සඳහා අපේක්ෂිත ක්‍රියාමාර්ග පිළිබඳ පුහුණුව | 02 | 09.12.2025 - 10.12.2025 | | | දේශීය | අපේක්ෂිත ක්‍රියාමාර්ග පිළිබඳ දැනුම |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද කාර්ය මණ්ඩල සංඛ්‍යාව | වැඩසටහනේ කාලය | මූළ ආයෝජනය (රු.'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| 121.අවසාන කාර්යය සහ තාක්ෂණික අවශ්‍යතා පිරිවිතර කෙටුම්පත පිළිබඳ වැඩමුළුව | 05 | 16.12.2025 | | | දේශීය | අවසාන කාර්ය පටිපාටිය සහ තාක්ෂණික අවශ්‍යතා පිරිවිතර කෙටුම්පත් කිරීම පිළිබඳ දැනුම |
| 122.දේශගුණික විපර්යාස ආශ්‍රිත අයවැයකරණය පිළිබඳ දැනුවත්භාවය සහ කුසලතා වර්ධනය කිරීමේ වැඩමුළුව | 03 | 17.12.2025 - 18.12.2025 | | | දේශීය | දේශගුණික විපර්යාස සම්බන්ධ අයවැයකරණය පිළිබඳ දැනුම |
| 123.ජාතික කොඩෙක්ස් (Codex) මෙහෙයුම් ශක්තිමත් කිරීම සහ ජාතික ප්‍රමිතීන් ජාත්‍යන්තර හොඳම භාවිතයන් සමඟ සමපාත කිරීම පිළිබඳ වැඩමුළුව | 05 | 18.12.2025 | | | දේශීය | ජාතික Codex මෙහෙයුම් පිළිබඳ දැනුම |
| 124.කෘෂිකාර්මික, වන විද්‍යා සහ වෙනත් භූමි භාවිත (AFOLU) අංශය සඳහා හරිතාගාර වායු තොග වාර්තාවක් (GHG Inventory) සකස් කිරීමට අවශ්‍ය තථ්‍ය කාලීන දත්ත උඩුගත කරන දත්ත සපයන්නන් සඳහා AFOLU MRV පද්ධතිය පිළිබඳ ප්‍රායෝගික පුහුණුව | 03 | 29.12.2025 | | | දේශීය | AFOLU MRV පද්ධතිය පිළිබඳ දැනුම |
| 125.2023 වසරේ පවත්වන ලද කළමනාකරණ සේවා නිලධාරීන් බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය මත පදනම්ව 2025 වසරේ පත්වීම් ලැබූ නව නිලධාරීන් සඳහා වන ප්‍රවේශක පුහුණු වැඩසටහන | 23 | 03.03.2025 - 04.03.2025 | | | දේශීය | රාජ්‍ය සේවය සහ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පිළිබඳව දැනුවත් කිරීම |
| 126.සූර්ය බලශක්ති පද්ධති ක්‍රියාකාරිත්වය සහ නඩත්තුව පිළිබඳ පුහුණු වැඩසටහන | 52 | 23.05.2025 | | | දේශීය | සූර්යශක්ති පද්ධති නිසි ලෙස නඩත්තු කිරීම පිළිබඳ දැනුවත් කිරීම |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද කාර්ය මණ්ඩල සංඛ්‍යාව | වැඩසටහනේ කාලය | මුළු ආයෝජනය (රු.'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| 127.අංක 18/2020 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව රාජ්‍ය භාෂා පුහුණු වැඩසටහන පැවැත්වීම (ප්‍රාථමික මට්ටම | 72 | 08.07.2025 - 28.10.2025 | 75 | | දේශීය | නිලධාරීන්ට දෙවන භාෂාවෙන් නිසි පුහුණුවක් ලබා දීම |
| 128.අංක 18/2020 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව රාජ්‍ය භාෂා පුහුණු වැඩසටහන පැවැත්වීම (ද්විතියික මට්ටම) | 34 | 03.07.2025 - 04.10.2025 | 112.5 | | දේශීය | නිලධාරීන්ට දෙවන භාෂාවෙන් නිසි පුහුණුවක් ලබා දීම |
| 129.අංක 18/2020 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව රාජ්‍ය භාෂා පුහුණු වැඩසටහන පැවැත්වීම (තෘතීයික මට්ටම | 67 | 30.05.2025 - 12.12.2025 | 150 | | දේශීය | නිලධාරීන්ට දෙවන භාෂාවෙන් නිසි පුහුණුවක් ලබා දීම |
| 130.ආයතන සංග්‍රහයේ මු.රෙ 104 (04)) පරීක්ෂණ පිළිබඳ පුහුණු වැඩසටහන | 85 | 24.02.2025 - 25.02.2025 | 64.8 | | දේශීය | මුදල් රෙගුලාසි 104 (04) පරීක්ෂණ පිළිබඳව දැනුවත් කිරීම |
| 131.ප්‍රතිශෝධිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ අත්පොත් පිළිබඳ පුහුණු වැඩසටහන | 226 | 01.09.2025 | 195.86 | | දේශීය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිබඳ තොරතුරු ලබා දීම |
| 132.දෙපාර්තමේන්තුවට අනුයුක්ත සියලුම පරිපාලන නිලධාරීන් සඳහා වන දෙදින නේවාසික පුහුණු වැඩසටහන | 37 | 25.09.2025 - 26.09.2025 | 118.89 | | දේශීය | කාර්යාල කටයුතු සහ විනය පටිපාටි පිළිබඳව දැනුවත් කිරීම |
| 133.ගොවිපල කළමනාකරුවන් සඳහා වන දෙදින නේවාසික පුහුණු වැඩසටහන | 80 | 06.11.2025 - 07.11.2025 | 251.92 | | දේශීය | කාර්යාලීය කටයුතු, කළමනාකරණය සහ ගොවිපළ සැලසුම් කිරීම පිළිබඳ දැනුවත් කිරීම |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද කාර්ය මණ්ඩල සංඛ්‍යාව | වැඩසටහනේ කාලය | මුළු ආයෝජනය (රු.'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| 134.සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා වන දෙදින පුහුණු වැඩසටහන | 59 | 10.11.2025 - 11.11.2025 | 124.22 | | දේශීය | කාර්යාලීය පද්ධති, විනය පටිපාටි, ගබඩා කිරීම සහ ප්‍රසම්පාදනය පිළිබඳ දැනුවත් කිරීම |
| **වෙනත් දේශීය ආයතනවල පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම** | | | | | | |
| 135.පරිපාලන නිලධාරීන් සඳහා වන කාර්යාල කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය) | 03 | | 330 | | දේශීය | කාර්යාල කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීම |
| 136.වෘත්තීය ඡායාරූපකරණය සහ වීඩියෝ නිෂ්පාදන පාඨමාලාව (පේරාදෙණිය විශ්වවිද්‍යාලය) | 02 | | 120 | | දේශීය | ඡායාරූපකරණය සහ වීඩියෝ නිෂ්පාදනය පිළිබඳ තොරතුරු ලබා දීම |
| 137.සීමිත තරඟ විභාගය යටතේ බඳවා ගත් III වන ශ්‍රේණියේ කළමනාකරණ සේවා නිලධාරීන් ප්‍රවේශක පුහුණු වැඩසටහන සඳහා යොමු කිරීම (දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මහනුවර) | 10 | 17.07.2025 - 18.07.2025 සහ 23.07.2025 - 26.07.2025 | | | දේශීය | රාජ්‍ය සේවය පිළිබඳ හැඳින්වීම (ආයතන සංග්‍රහය/ මුදල් රීති/ කාර්යාලීය පද්ධති) |
| 138.1 වන පන්තියේ කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා වන සේවා ප්‍රවීණතා විභාගයෙන් නිදහස් කිරීමේ පාඨමාලාව (දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මහනුවර) | 13 | 24.09.2025 - 27.09.2025, 01.10.2025 - 04.09.2025 සහ 15.09.2025 - 17.09.2025 | | | දේශීය | ඵලදායිතාව සහ විගණනය පිළිබඳ දැනුවත් කිරීම |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. CPCG/KD/E/AD/A/2026/20/154(6)
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2026 මැයි 17 දින

ගණන්දීමේ නිලධාරී,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 285 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනය කළ මතය

ශීර්ෂය 285 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2025 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත) 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2026 මැයි 13 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

1.2 **තත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.)

1.3 **කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 151 හා 157 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

2

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) වත්කම් කාණ්ඩ 02 කට අදාළව දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබූ වත්කම් වටිනාකම රු. 27,567,547,631 ක් වුවද, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය (ඒසීඒ 06) තුල එය රු.23,592,296,025ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව මූල්‍ය නොවන වත්කම්වල රු.3,975,251,606 ක වෙනසක් පැවතුණි.

(ආ) ගොඩනැගිලි සහ ඉදිකිරීම් අයිතම 1113 ක්, සහ ඉඩම් ඒකක 325 ක් වශයෙන් වූ මූල්‍ය නොවන වත්කම් අයිතම 1438 ක් 2025 දෙසැම්බර් 31 දින වන විටත් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

## 1.6.2 වාණිජ අත්තිකාරම් ගිණුම

(අ) මු.රෙ. 10(1) සහ 10(5) ප්‍රකාරව අත්තිකාරම් ගිණුම මත පූර්ණ කාලීනව සේවයේ නියුතු නිලධාරීන්ගේ වැටුප් හා වේතන සඳහා මූල්‍ය ප්‍රතිපාදන පොදු ඇස්තමේන්තුවල වැටුප් හා වේතන යටතේ ඇතුළත් නොකළ යුතු වුවත්, ඒ සම්බන්ධයෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක මු/1/4/3ඇ.මේ. හා 2014 නොවැම්බර් 24 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛයේ 2 වගන්තිය අනුව භාණ්ඩාගාරයේ එකහත්වය මත අත්තිකාරම් ගිණුමට අනුයුක්ත සේවකයන්ගෙන් 1/3 ක් සඳහා පමණක් පොදු අරමුදලින් වැටුප් ගෙවීමට අනුමත කර තිබුණි. ඊට අනුකූල නොවන පරිදි අත්තිකාරම් ගිණුම් යටතේ සේවය කරන සේවකයින් 257 ක ප්‍රමාණය සඳහා පොදු අරමුදලෙන් වැටුප් හා වේතන ගෙවමින් පැවතුණි.

(ආ) ගන්නෝරුව එළවළු බීජ මධ්‍යස්ථානයේ 2025 වර්ෂය තුල වාර්තා වූ රු. 11,637,537 ක තොග හානි මූල්‍ය ප්‍රකාශනවල රු. 1,588,190 ක් ලෙස රු. 10,051,347 ක් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ලාභය රු. 10,051,347ක මුදලකින් අධි ගණනය වී තිබුණි.

(ඇ) නුවරඑළිය බීජ අර්තාපල් ගබඩාව තුල 2025 වර්ෂය තුලදී බීජ අර්තාපල්වල වියළී බර වශයෙන් හඳුනාගෙන තොගයෙන් අඩු කර තිබූ රු. 9,046,883 ක් වටිනා කි.ග්‍රෑ. 20,123 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් නොකිරීම හේතුවෙන් වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අධි ගණනය වී තිබුණි.

(ඈ) සීතාඑළිය හා කඳපොල බීජ අර්තාපල් නිෂ්පාදන ගොවිපල්වල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු. 3,096,000 ක් වටිනා කොම්පෝස්ට් පොහොර කි.ග්‍රෑ. 387,000 ක ප්‍රමාණයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීම හේතුවෙන් වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි.

(ඉ) මීපිලිමාන රජයේ බීජ අර්තාපල් නිෂ්පාදන ගොවිපලේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු. 225,214 ක් වටිනා එච්සෙට් කෘෂි රසායන පැකට් 353 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි.

(ඊ) වල්පිට හා අළුත්තරම බීජ නිෂ්පාදන ගොවිපල්වල තොග තක්සේරු වාර්තා අනුව 2025 දෙසැම්බර් 31 දිනට පැවති රු.167,930 ක් වූ බහු බෝග (පොල්) තොගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීම හේතුවෙන් වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි.

**2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 අග්‍රිම කළමනාකරණය**

මුදල් රෙගුලාසි 367(අ) ප්‍රකාරව මුදල් වර්ෂය තුළදී වියදම් දැරීම පිණිස අවශ්‍ය මුදල් පිළිබඳව ඇස්තමේන්තුවක් භාණ්ඩාගාරය වෙත ලබා දී තිබුණ ද, 2025 වර්ෂයේ මාස 10 ක අග්‍රිම සැලැස්මට අනුකූල නොවන පරිදි සියයට 19 සිට සියයට 103 දක්වා ප්‍රමාණයක් අග්‍රිම ඉල්ලුම් කර තිබුණි.

**3.2 ආදායම් කළමනාකරණය**

**(අ) ආදායම් ඇස්තමේන්තු**

ආදායම් ඇස්තමේන්තු නිවැරදිව හා තාර්කිකව පිළියෙළ නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ රු. 800,000,000 කට පිළියෙල කළ ආදායම් ඇස්තමේන්තුව වර්ෂය තුල රු. 900,000,000 ක් ලෙස සංශෝධනය කර තිබූ අතර රු. 1,010,384,109 ක ආදායම් වර්ෂය තුල රැස් කර තිබුණි. මේ හේතුවෙන් මූලික ඇස්තමේන්තු ආදායමට වඩා සියයට 126 ක් හා සංශෝධිත ආදායමට වඩා සියයට 112 ක් ඉපැයීම් කර තිබුණි

**(ආ) හඳුනා නොගත් ආදායම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවා ගන්නා තැන්පතු (6000-0-0-15-29) යටතේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ ගිණුමට බැර කරන ලද අවස්ථා 574 කට අදාළ රු. 6,077,054 ක් වූ හඳුනා නොගත් ආදායම් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයෙහි ඒ අනුව රඳවාගත් මුදලින් අවස්ථා 397 කට අදාළ රු. 5,520,029 ක් රාජ්‍ය ආදායමට බැර කර තිබුණි.

**(ඇ) හිඟ ආදායම්**

ණය පදනම මත රජයේ කාර්යාල සඳහා 2025 වර්ෂය තුළ නිකුත් කළ අර්තාපල් බීජ හා එලවළු බීජ සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට රු.22,867,729 ක් හා පසුගිය වර්ෂයට අදාළව රු. 116,750 ක් වශයෙන් එකතුව රු.22,984,479 ක් තව දුරටත් හිඟව පැවතුණි.

3.3 වියදම් කළමනාකරණය

(අ) ප්‍රතිපාදන උපයෝජනය

මූලික ඇස්තමේන්තු සැකසීමේදී අධි ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 17 ක හා මූලධන වැය විෂයයන් 02 ක එකතුව රු. 444,145,943 ක් වූ ප්‍රතිපාදන මු.රෙ. 66 මගින් වෙනත් පුනරාවර්තන වැය විෂයයන් සඳහා මාරු කර තිබුණු අතර එය සියයට 05 සිට සියයට 76 දක්වා පරාසයක විය.

(ආ) පුනරාවර්තන වියදම

(i) සමාලෝචිත වර්ෂයේ වැඩ සටහන් 01 හා 02 යටතේ වෙන් කර තිබූ රු.574,810,765 ක ශුද්ධ පුනරාවර්තන ප්‍රතිපාදන අතුරින් රු. 126,072,845 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 ක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.

(ii) වැඩ සටහන් අංක 02 හි 1304 වැය විෂයය යටතේ මෘදුකාංග නඩත්තුව වෙනුවෙන් වූ රු.1,150,000 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය සම්පූර්ණයෙන් උපයෝජනය කර නොතිබුණි.

(ඇ) මූලධන වියදම්

සමාලෝචිත වර්ෂයේ වැඩ සටහන් 01 හා 02 යටතේ වෙන් කර තිබූ රු.4,669,529,133 ක ශුද්ධ ප්‍රාග්ධන ප්‍රතිපාදන අතුරින් රු. 1,345,963,335 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 29 ක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.

(ඇ) ප්‍රතිපාදන ඉතිරිවීම්

(i) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 හි ඡේද අංක 3.5 ප්‍රකාරව වැඩසටහන 2 හි ව්‍යාපෘති අංක 03 යටතේ වැය විෂයයන් 02 ක හා ව්‍යාපෘති අංක 4 හි වැය විෂයයක ප්‍රතිපාදන ඉතිරිවීම් සම්බන්ධයෙන් හේතු ඉදිරිපත් කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 48 කට අදාලව එකතුව රු.278,823,941 ක ප්‍රතිපාදන ඉතිරිවීම් සඳහා නිශ්චිත හේතුවක් නොදක්වා අයවැය චක්‍රලේඛ 01/2023 හි උපදෙස් ප්‍රකාරව කටයුතු කිරීම ලෙස දක්වා තිබුණි.

3.4 බැරකම් හා බැඳීම්වලට එළඹීම

මුදල් රෙගුලාසි 94 ප්‍රකාරව භාණ්ඩාගාරය වෙත වාර්තා නොකළ කිසිදු බැඳීමක් හෝ බැරකමක්, පෙර වර්ෂයේ වියදමක් ලෙස 2026 වර්ෂයේ නිරවුල් නොකළ යුතු වුවත්, භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ ඇතුළත් නොවූ සමාලෝචිත වර්ෂයට අදාල අවස්ථා 39 ක දී එකතුව රු.1,302,246 ක වියදම් 2026 වර්ෂයේදී ගෙවා තිබුණු බව විගණනය වෙත ඉදිරිපත් කරන ලද වවුචර්පත් නියැදියක් පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) | මුදල් රෙගුලාසි 119 | තනතුර අතහැර ගිය නිලධාරීන් 53 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 2,082,047 ක වැඩිපුර ගෙවන ලද වැටුප් හා දීමනා සහ රු. 1,085,861 ක විවිධ හිඟ ශේෂයන් වශයෙන් එකතුව රු.367,908 ක් මාස 06 ත් වසර 14 ත් අතර කාලයක් ගත වී ඇතත්, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 119 | පසුගිය වසර 07 ක කාලය තුල විවිධ හේතු නිසා සේවයෙන් ඉවත්ව ගිය ප්‍රාථමික සේවා සනයට අයත් සේවකයන් 67 ක් සඳහා වැඩිපුර ගෙවන ලද රු.4,978,090 ක වැටුප් හා දීමනා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 142(2) හා 169(2) | පළිබෝධනාශක රෙජිස්ටාර් කාර්යාලය 2025 වර්ෂයේ ජනවාරි 01 දින සිට සැප්තැම්බර් 30 දක්වා වූ මාස 09 ක කාලය තුල ලැබී තිබූ රු.15,297,000 ක් වටිනා චෙක්පත් 275 ක් දින 11 ත් දින 126 ත් අතර කාලයක් අත රඳවා ගෙන අදාළ සේවාව ඉටු කිරීමෙන් පසු බැංකු ගත කිරීමට කටයුතු කර තිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 1646 | සමාලෝචිත වර්ෂයට අදාළව වාහන 668 ක මාසික ධාවන සටහන් පත්‍ර 2189 ක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 1 වගන්තිය | බතලේගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය රු.2,236,658 ක් හා අඹේපුස්ස රජයේ බීජ නිෂ්පාදන ගොවිපල රු. 490,033 ක් පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු කිරීමේ යන්ත්‍රය මගින් සනාථ කර නොගෙන නිලධාරීන්ට අතිකාල දීමනා හා නිවාඩු දින වැටුප් ගෙවා තිබූ අතර, කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇති පර්යේෂණ සහකාර හා තාක්ෂණික සහකාරවරුන් සඳහා ද ඉහත පරිදි පැමිණීම හා පිටවීම |

7

| | | |
|---|---|---|
| | | සනාථ නොකර රු.925,089 ක වැටුප් ගෙවීමට කටයුතු කර තිබුණි. |
| (ඇ) | **2025 මාර්තු 25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උප ලේඛන II** | සේවකයින් 46 දෙනෙකු සඳහා චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් පරිවර්ථනයන් සිදු කර නොතිබුණි. |

**3.6 බැංකු ගිණුම් මෙහෙයවීම**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් බැංකු ගිණුම් 44 කට අදාලව 2025 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් වාර්තා පරීක්ෂාවේ දී බැංකු ගිණුම් 8 කට අදාලව මාස 6 සිට මාස 19 ක් දක්වා කාලයක් නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකර රු.111,358 ක් වූ චෙක්පත් 20 ක් පැවතිය ද, එම චෙක්පත් සම්බන්ධයෙන් මු.රෙ. 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එරමිණිගොල්ල රඹුටන් පර්යේෂණ මධ්‍යස්ථානය සඳහා පසුගිය වසර 05 ක කාලය තුල රු. 8,109,381 ක වියදම් දරා ඇතත්, 2020 හා 2021 වර්ෂවල එකදු පරීක්ෂණයක් හෝ සිදු කර නොමැති අතර 2022 – 2026 කාලයකට අදාළව එක් පර්යේෂණයක් පමණක් පවත්වාගෙන යමින් පැවතුණි.

(ආ) ජාතික ඉගෙනුම් හා දැනුම් හුවමාරු කිරීම අරමුණු කරගෙන පිහිටුවා ඇති කුණ්ඩසාලේ පාංශු සංරක්ෂණ හා දැනුම් කළමනාකරණ මධ්‍යස්ථානය 2017 වර්ෂයේ සිට වසර 09 ක කාලය තුල පුහුණු වැඩ සටහන් 10 ක් පමණක් පවත්වා තිබුණු අතර 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කිසිදු වැඩ සටහනක් පවත්වා නොතිබුණි.

**4.1.1 සැලැසුම් කිරිම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා 2025 වර්ෂයේ මූලික ඇස්තමේන්තුව මගින් ප්‍රාග්ධන වැය විෂයයන් 09 ක් වෙනුවෙන් ප්‍රතිපාදිත රු.67,000,000 ක මුදල රු. 26,924,000 ක් ලෙස සංශෝධනය කළත් එහි ප්‍රගතිය රු.10,798,420 ක් විය. එය මූලික ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 16 ක් හා සංශෝධිත ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 40 ක් ලෙස අවම මට්ටමක විය.

(ආ) කුණ්ඩසාලේ පාංශු සංරක්ෂණ දැනුම් කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා වර්ග අඩි 1800 ක දේශන ශාලා පහසුකම් සහිත කාර්යාල ගොඩනැගිල්ලක් එහි ආදර්ශ ක්ෂේත්‍රයේ සිට මීටර් 1300 ක දුරක් ඇතුළත පවතිද්දී, ශක්‍යතා අධ්‍යනයකින් තොරව ඇස්තමේන්තු වටිනාකම රු. 33,543,654 ක් වූ දේශන ශාලා පහසුකම් සහිත නව කාර්යාල

8

ගොඩනැගිල්ලක් මෙම මධ්‍යස්ථානයට අයත් ආදර්ශ ක්ෂේත්‍රයේ සමාලෝචිත වර්ෂයේදී ඉදිකරමින් පැවතුණි.

### 4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2024 යල හා 2024/25 මහ කන්නයන් සඳහා බීජ වී නිෂ්පාදනය වෙනුවෙන් බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානයට අයත් ගොවිපල් 12 ක් සඳහා ලබා දී තිබූ ඉලක්කගත නිෂ්පාදනයන් අත්පත් කර ගත් ප්‍රමාණය පිළිවෙලින් සියයට 67 ක් හා සියයට 66 ක් වී තිබුණි.

(ආ) 2024/25 මහ කන්නය සඳහා ගොවිපල් 11 ක් වෙත බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානය විසින් එළවළු බෝග වර්ග 12 ක් සඳහා කි.ග්‍රෑ. 372 ක නිෂ්පාදන ඉලක්කයක් හා 2025 යල කන්නය සඳහා ගොවිපල් 10 ක් වෙත එළවළු බෝග වර්ග 09 ක් සඳහා කි.ග්‍රෑ. 2,171 ක නිෂ්පාදන ඉලක්කයක් ලබා දී තිබුණද තත්‍ය නිෂ්පාදනය ශුන්‍ය විය.

(ඇ) 2025 යල කන්නය සඳහා ගොවිපල් 17 ක් වෙත බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානය විසින් එළවළු බෝග වර්ග 09 ක් සඳහා ලබා දී තිබූ බීජ නිෂ්පාදන ඉලක්කය කි.ග්‍රෑ. 6089 ක් වුවද, එම කන්නයේ සත්‍ය එළවළු බීජ නිෂ්පාදනය කි.ග්‍රෑ. 1611.7 ක් හෙවත් ඉලක්කගත නිෂ්පාදනයෙන් සියයට 26 ක් වී තිබුණි.

(ඈ) 2024/25 මහ කන්නය සඳහා ගොවිපල් 13 ක් වෙත බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානය විසින් අතිරේක ආහාර බෝග වර්ග 10 ක් සඳහා ලබා දි තිබූ බීජ නිෂ්පාදන ඉලක්කය කි.ග්‍රෑ. 27.407.3 ක් වුවද, එම කන්නයේ සත්‍ය අතිරේක ආහාර බීජ නිෂ්පාදනය කි.ග්‍රෑ. 15,375.4 ක් හෙවත් ඉලක්කගත නිෂ්පාදනයෙන් සියයට 56 ක් වී තිබුණි.

(ඉ) 2024/25 මහ කන්නය සඳහා ගොවිපල් 03 ක් වෙත බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානය විසින් අතිරේක ආහාර බෝග වර්ග 05 ක් සඳහා කි.ග්‍රෑ. 779 ක නිෂ්පාදන ඉලක්කයක් හා 2025 යල කන්නය සඳහා ගොවිපල් 05 ක් වෙත අතිරේක ආහාර බෝග වර්ග 06 ක් සඳහා කි.ග්‍රෑ. 2243.5 ක නිෂ්පාදන ඉලක්කයක් ලබා දී තිබුණද තත්‍ය නිෂ්පාදනය ශුන්‍ය විය.

(ඊ) පැල්වෙහෙර නියෝජ්‍ය අධ්‍යක්ෂ ( බීජ හා රෝපන ද්‍රව්‍ය) කාර්යාලය සඳහා 2024 යල කන්නයට අදාළව කොන්ත්‍රාත් බීජ වැඩ සටහන යටතේ අතිරේක ආහාර බෝග හා එළවළු වර්ග 10 ක් වෙනුවෙන් ලබා දී තිබූ කි.ග්‍රෑ. 52045 ක ඉලක්කයෙන් අත්පත් කර ගෙන තිබූ ප්‍රගතිය කි.ග්‍රෑ. 17590 ක් හෙවත් සියයට 34 ක අවම අගයක් විය.

(උ) එළුවන්කුලම බීජ නිෂ්පාදන ගොවිපල වෙත 2024/2025 මහ කන්නය හා 2025 යල කන්නය සඳහා බෝග වර්ග 06 ක් වෙනුවෙන් ලබා දී තිබූ ඉලක්කය අතුරින් බෝග වර්ග 04 ක ප්‍රගතිය සියයට 0 සිට සියයට 28 දක්වා අවම පරාසයක විය.

### 4.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කුණ්ඩසාලේ පාංශු සංරක්ෂණ දැනුම් කළමනාකරණ මධ්‍යස්ථානය නව සනීපාරක්ෂක ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුල රු.1,093,736 ක ද්‍රව්‍ය මිලට ගෙන ඒ සඳහා රු.1,069,238 ක ද්‍රව්‍ය සෘජු ශ්‍රම දායකත්වයෙන් ඉදිකිරීම් සඳහා නිකුත් කර තිබුණත්, කාර්යය අවසන් නොකිරීම හේතුවෙන් වසර 04 කට අධික කාලයක් භාවිතයට නොගෙන අතහැර දමා තිබුණි.

(ආ) අරලගංවිල ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයට අයත් ගොඩනැගිල්ලක් 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුල රු.1,931,262 ක් ද්‍රව්‍ය හා උපකරණ සඳහා වැයකර ආපනශාලාවක් ලෙස නවීකරණය කර වසර 05 කට අධික කාලයක් අපේක්ෂිත අරමුණු සඳහා භාවිතයට නොගෙන නිශ්කාර්යයව පැවතුණි.

### 4.2 ප්‍රසම්පාදනයන්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 භාණ්ඩ හා වැඩ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3(ඇ) වගන්තිය අනුව සැපයුම්කරුවන් වාර්ෂිකව ලියාපදිංචිකරවා ගන්නේ නම් ඔවුන්ගෙන් පමණක් මිල ගණන් විමසිය යුතු වුවද, බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානය පසුගිය වසර 03 ක කාලය තුල රු. 1,890,490 ක බාහිර අළුත්වැඩියාවන් 07 ක් හා අභ්‍යන්තර අළුත්වැඩියාවන් 10 ක් සඳහා මෝටර් රථ අළුත්වැඩියාවන් සම්බන්ධයෙන් කිසිදු කාණ්ඩයක් යටතේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා තිබුණි.

(ආ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පසුගිය වසර 03 සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම වෙනුවෙන් රු. 219,061 ක් වියදම් කර ලියාපදිංචි ගාස්තු වශයෙන් සැපයුම්කරුවන්ගෙන් රු. 1,262,500 ක ආදායමක් රැස් කර ඇතත්, ලියාපදිංචි සැපයුම්කරුවන් ප්‍රසිද්ධ කිරීම අදාළ වර්ෂයේ පෙබරවාරි සිට ඔක්තෝබර් දක්වා කාල ප්‍රමාදයකින් පසුව සිදුකර තිබීම හේතුවෙන් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අරමුණ ඉටු වී නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 2.4 (අ) V ට අනුකූලව ප්‍රසම්පාදන ලේඛන විධිමත් අධ්‍යයනයකින් තොරව පිළියෙල කිරීම හේතුවෙන් ගන්නෝරුව පුරාණ වැව ප්‍රතිසංස්කරණයට අදාළ ප්‍රසම්පාදනයේදී අවස්ථා 02 ක් පුවත්පත් දැන්වීම් පලකිරීම නිසා රු. 62,162 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදුව තිබුණි.

**4.3 වත්කම් කළමනාකරණය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1947 අංක 8 දරන ඉඩම් ආඥා පනතේ 224 වගන්තිය ප්‍රකාරව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උප ඒකක 10 ට අයත් හෙක්ටයාර 3782 ක් වූ මුළු භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර 1813 ක ප්‍රමාණයක් 2025 දෙසැම්බර් 31 දිනට විධිමත්ව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උප ඒකක 04 කට අයත් රජයේ නිවාස 23 ක් වසර 10 ත් වසර 34 ත් අතර කාල පරිච්ඡේදයක් භාවිතයට නොගැනීම හේතුවෙන් ගරා වැටීමට ලක්ව තිබූ අතර අළුත්වැඩියා කළ යුතු මට්ටමේ පවතින රජයේ නිවාස 16 ක් වසර 01 ත් වසර 03 ත් අතර කාල පරිච්ඡේදයක් අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් භාවිතයට ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) පොළොන්නරුව අන්තර් පළාත් කාර්යාලයට අයත් රජයේ නිවාස 05 ක් අනවසර පදිංචිකරුවන් විසින් වසර 25 ක කාලයක සිට අත්පත් කර ගෙන තිබූ අතර පදිංචි කාලය ඉදිරිපත් නොකළ හම්බන්තොට අන්තර් පළාත් කාර්යාලයට අයත් රජයේ නිවාස 04 ක් අනවසර පදිංචිකරුවන් විසින් අත්පත් කරගෙන තිබුණි.

(ඈ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් කාමර 23 කින් සමන්විත ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ස්ථාපිත කර ඇති පිරිමි සෘද නිවාසයේ රු. 219,700 ක ජල ගාස්තුවක් නොගෙවීම නිසා එහි ජල සම්බන්ධතාවය විසන්ධි කිරීම හේතුවෙන් 2007 වර්ෂයේ සිට වසර 18 ක කාලයක් ඌන උපයෝජිතව හා ගරා වැටීමට ලක් වෙමින් පැවතුණි.

(ඉ) රිකිල්ලගස්කඩ බීජ සහතික කිරීමේ ප්‍රාදේශීය කාර්යාලය වෙත ලබා දී තිබූ රාබු බීජ සැකසීමේ යන්ත්‍රය අවස්ථා 03 කදී පමණක් භාවිතයට ගෙන වසර 20 කට අධික කාලයක් නිෂ්කාර්යයව පැවතුණි.

(ඊ) රිකිල්ලගස්කඩ බීජ සහතික කිරීමේ ප්‍රාදේශීය කාර්යාලයේ නව කාර්යාල ගොඩනැගිල්ල සමග ස්ථාපිත කර තිබූ 208,626 ක් වටිනා දුරකතන ජාල පද්ධතිය භාවිතයට නොගෙන නිෂ්කාර්යයව පැවතුණි

(උ) අරලගංවිල පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයට 2020 සැප්තැම්බර් 25 දින ලබා දී තිබූ කුබෝටා වර්ගයේ ඒකාබද්ධ අස්වනු නෙලන යන්ත්‍රයක් වසර 04 කට අධික කාලයක් භාවිතයට නොගෙන නිෂ්කාර්යයව පැවතුණි.

(ඌ) අරලගංවිල කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයට 2019 වර්ෂයේදී ලබා දී තිබූ මිට්ෂුබිෂි වර්ගයට අයත් ජීප් රථයක් වසර 06 කට අධික කාලයක් හා 2007 මැයි 08 දින හංසයාපාලම සේවා සංස්කරණ ආයතනයට ලබා දී තිබූ මිට්ෂුබිෂි වර්ගයේ ජීප් රථය වසර 10 ක පමණ කාලයක් භාවිතයට නොගෙන කාර්යාල පරිශ්‍රයේ ගාල්කර තිබුණි

(එ) රු. 5,560,000 ක වටිනා ගොයම් සිටුවන යන්ත්‍ර 02 ක් 2021 අප්‍රේල් 30 දින අරලගංවිල නියෝජ්‍ය කෘෂි අධ්‍යක්ෂ කාර්යාලයට ලබා දී වසර 04 කට අධික කාලයක් ගත වී ඇතත් අවශ්‍යතාවයට නොගැලපෙන බැවින් භාවිතා කර නොතිබුණි.

## 4.4 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අළුත්තරම රජයේ බීජ නිෂ්පාදන ගොවිපලේ අක්කර 08 කොටස සඳහා 2021/2022 වර්ෂය තුල ඉදිකළ විසුරුම් ජල සම්පාදන පද්ධතිය සඳහා ගෙවීම් කිරීමේදී මිණුම් ලබා ගැනීමෙන් තොරව ඉටු නොකර තිබූ කාර්යයන් වෙනුවෙන් රු. 2,086,250 ක මුදලක් ගෙවීම් කර තිබූ අතර, අදාල සවිකර නොතිබූ කොටස් මෙම වාර්තාවේ දිනය වන විට ඉදිකරමින් පැවතුණි.

(ආ) වල්පිට හා මල්වත්ත රජයේ බීජ නිෂ්පාදන ගොවිපලවල් 02 හි සේවය කළ කම්කරුවන් දෙදෙනෙකු සඳහා සේවයට වාර්තා නොකළ වසරක කාලයක් වෙනුවෙන් පිළිවෙලින් රු. 552,792ක් හා රු. 468,993 ක් වශයෙන් එකතුව රු. 1,021,785 ක මුදලක් අවිධිමත්ලෙස ගෙවීමට කටයුතු කර තිබුණි.

(ඇ) බෝඹුවල වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ කාර් රථය අවස්ථා 05 කදී සිදු කර තිබූ වාර සේවාවන්වලදී සාවද්‍ය ලෙස බ්‍රේක් ඔයිල්, AC ෆිල්ටර් Air ෆිල්ටර් හා ගියර් ඔයිල් මාරු කළ බවට සඳහන් කර රු. 34,372 ක මුදලක් ගෙවීමට කටයුතු කර තිබුණි.

(ඈ) පැල්වෙහෙර බීජ නිෂ්පාදන ගොවිපලට අයත් අංක 55 දරන රජයේ නිවාසය අළුත්වැඩියාවේදී, අයිතම 02 ක ඉටු කර නොතිබූ වැඩ කොටස් සඳහා රු. 84,336 ක මුදලක් ගෙවා තිබූ අතර ඒ සඳහා උතුරුමැද පළාත් සහා මිල ගණන් භාවිතා කර ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි.

## 4.5 පාඩු හා හානි

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ කටයුතු අවසන් නොකළ 1976 වර්ෂයේ සිට පවතින ඇස්තමේන්තුගත වටිනාකම රු. 116,963,893 ක් වූ පාඩු හා හානි සිද්ධි 378 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ නමුත්, පාලන අංශය විගණනය වෙත ඉදිරිපත් කළ තොරතුරු අනුව 2025 දෙසැම්බර් 31 දිනට තව දුරටත් මු.රෙ. පරීක්ෂණ සිදු කිරීමට හානි හා පාඩු සිද්ධි 503 ක් පවතින බව වාර්තා කර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 104 (3) පරීක්ෂණ මගින් හඳුනාගත් පාඩු හා හානි 378 කට අදාළ රු.116,963,893 ක් මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කර තිබුණද, සිදුකළ නියැදි පරීක්ෂාවට

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

අනුව මු.රෙ 104 (3) පරීක්ෂණවල දීර්ඝකාලීන ප්‍රමාදය හේතුවෙන් සිද්ධි 21 කට අදාළ එකතුව රු. 7,712,016 ක් වූ හානි හා පාඩු මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරවු කර නොතිබුණි.

## 4.6 අනාර්ථික ගනුදෙනු

අක්කර 11 ක වපසරියකින් යුත් කුණ්ඩසාලේ පාංශු සංරක්ෂණ කේන්ද්‍රයේ මීටර් 965 ක වටදුර සඳහා ස්ථිර දැල් වැටක් ඉදිකරනවා වෙනුවට 2019 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා කාලය තුල පරීක්ෂණ කටයුතු වෙනුවෙන් ද්‍රව්‍ය සඳහා පමණක් රු. 2,825,651 ක් වියදම් කර මීටර් 463 ක දුරක් ආවරණය වන පරිදි දැල් වැටවල් 05 ක් පරීක්ෂණ ක්ෂේත්‍රය තුල වෙන වෙනම ඉදිකර තිබුණි.

## 4.7 කළමනාකරණ දුර්වලතා

(අ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් පාංශු සංරක්ෂණ දැනුම් කළමනාකරණ මධ්‍යස්ථානයේ හිටපු ස්ථානභාර නිලධාරිවරයා 2022 ජූනි 01 දින සිට දෙපාර්තමේන්තුවට අයත් වෙනත් ඒකක 03 කට ස්ථානමාරු කර ඇතත්, නව සේවා ස්ථානයන්හි සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් රාජකාරී පැවරීමක් සිදු නොකර තිබියදී මාස 42 ක කාලයක් සඳහා වැටුප් හා දීමනා වශයෙන් රු. 3,150,750 ක මුදලක් ගෙවීමට කටයුතු කර තිබුණි.

(ආ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගබඩා භාණ්ඩ ඌනතා සම්බන්ධයෙන් සිදුකරන පර්යේෂණ කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් ගබඩා භාර නිලධාරින් දෙදෙනෙකු විශ්‍රාම ගොස් වසර 19 ක් හා වසර 18 ක කාලයක් ප්‍රමාදව විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කර තිබුණි.

(ඇ) සේවකයින් 78 දෙනෙකුගේ නියැදියක් පරීක්ෂා කිරීමේදී සේවකයන් 18 දෙනෙකුට 2025 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ 10 වන වගන්තිය ප්‍රකාරව අදාළ වැටුප් පියවරෙහි පිහිටුවා වැටුප් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තුල 2025 ඔක්තෝබර් 31 දිනට රියදුරු තනතුරු 65 ක පුරප්පාඩු පවතිද්දී ධාවන තත්ත්වයේ වාහනයක් නොමැතිවීම හේතුවෙන් වසර 03 කුත් මාස 10 ක කාලයක් කිසිදු රාජකාරියක් නොමැතිව හංසයාපාලම සේවා සංස්කරණ ආයතනයේ රියදුරු සඳහා රු.2,142,200 ක වැටුප් හා දීමනා ගෙවා තිබූ අතර එම කාලය තුල ඔහු විසින් ලබා ගෙන තිබූ වැටුප් රහිත දින 141 ක නිවාඩු වෙනුවෙන් අයවිය යුතු මුදල ගණනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 11.2.3 ඡේදය ප්‍රකාරව අංක 25/2014 සහ අංක 25/2014 (I) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව බඳවාගත් සේවකයින් 89 දෙනෙකු විගණිත දින වන විට වසර 10 කට අධික කාලයක් ගතවී ඇතත්, ස්ථිර කිරීමට කටයුතු කර නොතිබුණි

(ආ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 03 ඡේදට අනුකූල නොවන පරිදි 7 ශ්‍රේණිය සමත් බව තහවුරු කර ශිෂ්‍ය කාර්ය දර්ශන ඉදිරිපත් කළ කොන්ත්‍රාත් කම්කරුවන් 07 දෙනෙකුට හා 8 වසර සමත් බව තහවුරු කර ශිෂ්‍ය කාර්ය දර්ශන ඉදිරිපත් කළ කොන්ත්‍රාත් කම්කරුවන් 26 දෙනෙකුට ස්ථිර පත්වීම් ප්‍රදානය කර තිබුණි.

(ඇ) ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 11 වැනි ඡේදය ප්‍රකාරව පරිවාස කාලය තුල අධ්‍යාපන සුදුසුකම් සනාථ කර ගැනීම සිදු කළ යුතු වුවත්, 2014 වර්ෂයේ ස්ථිර සේවයට බඳවාගත් සේවකයන් 48 දෙනෙකුගේ අධ්‍යාපන සහතික සනාථ කර ගැනීමේ ක්‍රියාවලිය පරිවාස කාලය ඉක්මවීමෙන් පසු මාස 4 ත් අවුරුදු 08 ත් අතර කාලයක් ප්‍රමාද වී ආරම්භ කර තිබුණි.

(ඈ) ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 11.2.3 ඡේදය ප්‍රකාරව පරිවාස කාලය අවසන් වීමේදි ඔහු සේවයෙන් ස්ථිර කිරීමට හෝ පරිවාස කාලය දීර්ඝ කිරීමට හෝ පත්වීම අවසන් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා වගබලා ගත යුතු වුවත්, 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/ 2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව බඳවා ගත් සේවකයන් 45 දෙනෙකුගේ පත්වීම් ශූන්‍ය කිරීමට පරිවාස කාලය ඉක්මවා මාස 06 සිට වසර 07 ක කාලයක් ඉක්ම ගොස් තිබුණි.

(ඉ) අංක 06/2017 හා 2017 අගෝස්තු 12 දිනැති කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ නියෝගය ප්‍රකාරව විශ්‍රාම ගනු ලබන දිනටම විශ්‍රාම ප්‍රතිලාභ ලබා දීම පිණිස පෞද්ගලික ලිපිගොනු නඩත්තු කරන නිලධාරීන් විසින් ක්‍රියා කළ යුතු වුවත් 2014 වර්ෂයේ ස්ථිර සේවයට බඳවාගත් සේවකයන් 06 දෙනෙකු විශ්‍රාම ගොස් මාස 03 සිට අවුරුදු 06 දක්වා කාල පරාසයක් ගත වී තිබුණද, විශ්‍රාම ගැන්වීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

එම්.ජී. මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

එම්. ජී. මදරසිංහ
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

14